# දෙසතිය

පුවත් සඟරාව
2025 නොවැම්බර්



## මිහිතලයේ සම්මුතිය

# රුසියාවෙන් සුබ පුවතක්

වැඩිදියුණු කරන ලද Enteromix නම් පිළිකා එන්නත හඳුන්වා දීමට නොබෝද රුසියාව සමත් වුණා. ඒ, mRNA (messenger Ribonucleic Acid) කොවිඩ් එන්නතට යොදාගත් තාක්ෂණය ම භාවිත කරමින්

Enteromix එන්නතේ මූලික ක්‍රියාකාරිත්වය පවතින්නේ එය ශරීරයේ ස්වාභාවික ප්‍රතිශක්තිකරණ පද්ධතිය උත්තේජනය කිරීමෙන්. මේ එන්නත සඳහා mRNA අණු භාවිත කර තිබෙනවා. mRNA අණු, පිළිකා සෛල මත පමණක් දක්නට ලැබෙන නිශ්චිත ප්‍රෝටීන (antigens) නිෂ්පාදනය කිරීමට සෛලවලට උපදෙස් ලබා දෙනවා. එම ප්‍රෝටීන හඳුනාගත් පසු ශරීරයේ T-cells (T-ලිම්ෆොසයිට්) නම් ප්‍රතිශක්තිකරණ සෛල සක්‍රිය වී, එම පිළිකා සෛල ආක්‍රමණය කර විනාශ කිරීමට පටන් ගන්නවා. mRNA එන්නතේ විශේෂත්වයනම් එය සෑම රෝගියෙකුගේ ම RNAවලට අනුව සකස් කිරීම. එනම් එක් එක් රෝගියාගේ පිළිකා සෛලවල ඇති ජානමය රටාවට (Genetic makeup) අනුරූප ව එන්නත සකස් කෙරෙනවා.

සාම්ප්‍රදායික රසායනික චිකිත්සන හෝ විකිරණ චිකිත්සනවලදී හෝ ඇතිවන දරුණු අතුරු ආබාධ mRNA එන්නතේ අවම වන බව රුසියානු විද්‍යාඥයන් පෙන්වා දෙනවා. දැනට මේ එන්නත ප්‍රධාන වශයෙන් යොදා ගැනීමට අවධානය යොමු වී තිබෙන්නේ මහා අන්ත්‍ර පිළිකාව සඳහා. එසේ ම රුසියානු විද්‍යාඥයන් මොළයේ පිළිකා වර්ග සඳහා ද ඊට අදාළ එන්නත් සංවර්ධනය කිරීමේ යෙදී සිටින බව සඳහන්.

mRNA එන්නතේ පෙර සායනික පරීක්ෂණ අවසන්. රුසියාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල අනුමැතිය ලබා ගැනීමෙන් පසු සායනික භාවිතය සඳහාත් ලොව පුරා නොමිලේ බෙදා හැරීම සඳහාත් එම විද්‍යාඥයන් සූදානම් වනවා.

**මධූෂා සෙව්වන්දි**





# දෙසතිය

පුවත් සඟරාව

වෙළුම 47, කලාපය 11,
2025 නොවැම්බර්



**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කාරක මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීමේ අංශය
දු. අ. 011 - 2514150



උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**

47 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**


මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.


## කවරයේ කතාව





18 මිහිතලයේ සම්මුතිය





12 සකුරා දේශයේ සුපිපි මල


03 මග හොඳට තිබේනම්





28 තුන් කල් දුටු මිනිසුන්ගේ නිහඬ හඬ





05 කඳුකරයේ සතුට





40 අනුශූරයෝ

# රටම එකට

මත්ද්‍රව්‍ය භාවිතය යනු ගෝලීය ගැටලුවක් බවට පත් ව ඇත්තේ ආර්ථික, සමාජීය මෙන් ම සෞඛ්‍ය විෂයෙහි ද ප්‍රබල බලපෑමක් ඇති කරමින්. United Nations Office on Drugs and Crime නිකුත් කරන ලද 2025 World Drug Reportහි අනාවරණය කරන්නේ සංවිධානාත්මක මත්ද්‍රව්‍ය ජාවාරම් කණ්ඩායම් මෙහිදී සිදු කරන බලපෑම. ලෝකය පුරා නීති විරෝධී අයුරින් ඔවුන් සිදු කරන මත්ද්‍රව්‍ය ප්‍රචාරණය, බෙදහැරීම සහ වෙළෙඳාම වැළැක්වීම සඳහා පියවර ගැනීමේ අවශ්‍යතාව එහි අවධාරණය කරනවා. එහි මූල හේතු ආමන්ත්‍රණය කළ යුතු බවත් තාක්ෂණය උපයෝගි කර ගනිමින්, දේශසීමා ඔස්සේ සහයෝගිතාව ශක්තිමත් කිරීමෙන්, විකල්ප ජීවනෝපාය සැපයීමෙන් සහ මේ ජාල මෙහෙයවන ප්‍රධාන ක්‍රියාකාරීන් ඉලක්ක කරගත් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමෙන් මේ ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතු බවත් එහි සඳහන්. එයින් පෙනී යන්නේ දේශ සීමා ඉක්මවමින් සිදු කරන මත්ද්‍රව්‍ය වෙළෙඳාම නැවැත්වීම මත්ද්‍රව්‍ය උවදුර පිටුදැකීමේ ප්‍රමුඛතම විසඳුම වන බව.

ගෝලීය පසුබිම මෙලෙස පවතිද්දී මත්ද්‍රව්‍ය උවදුර පරදන 'රටම එකට' ජාතික මෙහෙයුම නොබෝද ඇරඹුණේ අත්අඩංගුවට ගැනීම, පුනරුත්ථාපනය, නිවාරණය, මහජන තෙරපුම, ආගම, ක්‍රීඩාව සහ සංස්කෘතිය යන සියලු ක්ෂේත්‍ර එක් කර ගනිමින් බහුවිධ වැඩසටහනක් ඔස්සේ. මත්ද්‍රව්‍ය උවදුර සමාජයෙන් මුලිනුපුටා දැමීම ජාතික අවශ්‍යතාවක් ලෙස හඳුනාගෙන ඇති මොහොතක, ජනාධිපතිවරයා අවධාරණය කළ කරුණක් කෙරෙහි මෙහිදී විශේෂ අවධානය යොමු කිරීම වැදගත්.

දේශපාලනඥයන්ගේ සහ ඇතැම් රාජ්‍ය නිලධාරීන්ගේ ආශීර්වාදය මේ ව්‍යසනය පිටුපස ඇතැයි යන්න අනාවරණය වීම සැබවින් ම බේදනීය කරුණක්. එහි ප්‍රතිඵලයක් ලෙසයි මත්ද්‍රව්‍ය සහ පාතාලය වර්ධනය වුණේ. කළ යුත්තේ රෝග මූලයට ප්‍රතිකාර නිසා මේ දේශපාලන හා නිලධාරි පැළැන්තියේ මූල්‍ය ශක්තිය සහ බලය අඩපණ කිරීම අත්‍යවශ්‍ය වෙනවා. "මේ රටේ රාජ්‍ය දෙකක් තිබෙන්න බැහැ. තිබිය හැක්කේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී බලය විසින් පිහිටුවන ලද රාජ්‍ය පමණයි." යන ජනාධිපතිවරයාගේ ප්‍රකාශය මෙහිදී ඉතා වැදගත්. එයින් ගම්‍ය වන්නේ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් අත්අඩංගුවට පත් වන පිරිස්වලට නීතිය ක්‍රියාත්මක කිරීමෙන් ඔබ්බට ගොස් මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට එරෙහි ව නීතිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව.

මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් සලකා බලන විට 2020 වර්ෂයේදී එය 97,416ක් වූ අතර 2024 වර්ෂයේදී 228,450ක් දක්වා එම සංඛ්‍යාව ඉහළ ගොස් තිබෙනවා. එසේ ම 2024 වර්ෂයේදී මුළු බන්ධනාගාර ගතවීම් 47,783ක් වාර්තා වී ඇති අතර මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත වූ පුද්ගලයන් සංඛ්‍යාව 31,314ක් (65.5%). සංඛ්‍යාත්මක ව පෙන්වන මේ වර්ධනය කෙසේ වෙතත් මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් නීතියේ රැහැනට හසුව තිබෙන්නේ සැබෑ වැරදිකරුවන් ද? යන්න සමාජය ඉදිරියේ තිබෙන පැනයක්.

එබැවින් මේ ව්‍යසනයට එරෙහි ප්‍රධාන අවියක් ලෙස ප්‍රධාන වශයෙන් ජනතා හඬ අවදි විය යුතුයි. මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ නිෂ්පාදකයා, ප්‍රවාහකයා, ප්‍රචාරකයා, තොග වෙළෙන්දා, අලෙවිකරුවා කෙරෙහි මහජන හඬ ප්‍රබල වන්නේනම් සැබෑ අපරාධකරුවා හුදෙකලා වීමෙන් මත්ද්‍රව්‍ය ව්‍යසනයට සාධනීය විසඳුමත් ලැබෙනු ඇතැයි අපේක්ෂා දල්වා ගත හැකියි.

මාලා මල්කාන්ති රත්නමෙලගේ

- සංස්කාරක -

**දෙසතිය**
පුවත් සඟරාව

**දෙසතිය සඟරා දායකත්වය**

වාර්ෂික දායකත්වය රු. 1680.00
අර්ධ වාර්ෂික දායකත්වය රු. 840.00

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදළ බැංකු බැරපත හා සඟරා දායකත්ව කූපන්පත 0707444138 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

**මුදල් ඇණවුම් එවීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න. විමසීම් - 0112512759

**දෙසතිය**

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..................................................
Address ..................................................
..................................................
..................................................
..................................................
..................................................
ID Number ........................ Tel / Mobile ........................
Signature ........................ Date ........................



# මඟ හොඳට තිබේනම්

බිනූ දිලාරා ගමගේ

මාර්ගයක් වශයෙන් හඳුන්වන්නේ කිසි ම අවහිරයකින් තොර ව පොදු ජනතාවට සංචලනය කළ හැකි අවකාශයක්. ජනතාවගේ අවශ්‍යතාව හා ක්‍රියාදාමයේ වෙනස්කම් මත විවිධ වර්ගයේ මාර්ගවලින් යුතු ප්‍රවාහන පද්ධති ප්‍රදේශය පුරා නිර්මාණය වීම සාමාන්‍යයෙන් සිදු වන්නක්. ඒ අතරින් ග්‍රාමීය මාර්ග ඉදි කෙරෙන්නේ ගමේ ප්‍රජාවට හා ආර්ථිකයට සුදුසු වන ආකාරයට. කිලෝමීටර 100,000කට වඩා අධික වූ එම ග්‍රාමීය මාර්ග පද්ධතිය නගර සභා, ප්‍රාදේශීය සභා යටතේ සහ වනජීවී අධිකාරිය, මහවැලි අධිකාරිය වැනි රජයේ නොයෙකුත් දෙපාර්තමේන්තු ඇතුළු පාර්ශ්ව කිහිපයක් යටතේ පාලනය වෙනවා.

අධික මහා මාර්ග ඝනත්වයක් තිබෙන ශ්‍රී ලංකාව වැනි රටක මාර්ග සංවර්ධනය සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු වීම නිසා ග්‍රාමීය මාර්ග සංවර්ධනයට ලැබෙන අවධානය ඉතා අඩුයි. මේ බව අවධාරණය කරන මොරටුව විශ්වවිද්‍යාලයේ, සම්මානිත මහාචාර්ය අමල් කුමාරගෙ'; "වර්ග කිලෝමීටරයකට කිලෝමීටර 2ක් වැනි ඉහළ මහා මාර්ග ඝනත්වයකින් ශ්‍රී ලංකාව යුක්තයි. බොහෝ රටවල මෙවැනි ග්‍රාමීය මාර්ග පද්ධති ව්‍යාප්ත ව නැහැ. අපේ රට වගේ ම ජන ඝනත්වයක් තිබෙන රටක් ඉන්දියාව. මහා මාර්ග ඝනත්වයක් එරට නැහැ. අපේ රටට බොහෝදුරට ප්‍රමාණවත් මාර්ග ව්‍යාප්තියක් පවතිනවා. නමුත් ප්‍රශ්නය වන්නේ එම මාර්ග සංවර්ධනයට, නඩත්තුවට අධික පිරිවැයක් දැරීමට සිදු වීම සහ මාර්ගය ඉදිකිරීමෙන් අපේක්ෂිත ප්‍රතිලාභ එයාකාරයෙන් ම ලබා ගැනීමට හැකි වන්නේ ද යන්න. එම නිසා ඉදිවන බොහෝ මාර්ග නඩත්තු සිදු වෙනවා අඩුයි. දිගුකාලීන ව මුහුණදෙන මේ ප්‍රශ්නයේදී ග්‍රාමීය මාර්ගවලට මේ තත්ත්වය ප්‍රධාන වශයෙන් බලපානවා."

මෙවැනි පසුබිමක ග්‍රාමීය මාර්ග දියුණු කිරීම සඳහා රජයේ අවධානය යොමු වීම ඉතා වැදගත්. ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරියට සිදු කරන ලද යෝජනාවක ප්‍රතිඵලයක් ලෙස ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ වෙනවා. ඒ, සමස්ත දුර කිලෝමීටර් 539ක් වශයෙන් තෝරාගත් මාර්ග 488න් ඇස්තමේන්තුගත කළ මාර්ග 397ක් සංවර්ධනය කිරීමට අනුමත කිරීමෙන්. සියලු ම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු සහාය සහිතවයි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන්නේ.

මෙහිදී සංවර්ධනය කෙරෙන්නේ මීටර් 3-4ක් වැනි පළලකින් යුතු ග්‍රාමීය මාර්ග. මේ ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතුවලින් කොටසක් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ද කොටසක් කොන්ත්‍රාත් පදනම යටතේ ද සිදු වෙනවා. කිලෝමීටර් 539ක් වන සමස්ත මාර්ග ව්‍යාපෘතියෙන් දැනට කිලෝමිටර් 146ක දුරක් කොන්ක්‍රීට් ඇතිරීමෙන් හෝ කාපට් කිරීමෙන් හෝ සාර්ථක ලෙස නිම කර අවසන්.



අම්පාර දිස්ත්‍රික්කයේ, අක්කරෙයිපත්තුහි වැඩිදියුණු කළ පල්ලිය පාර මාවත, මුහුදු මාර්ගයේ සිට ජනාහ් (Jannah) පල්ලිය මාවත දක්වා



පුත්තලම දිස්ත්‍රික්කයේ, වෙන්නප්පුව මුහුදු මාවත (Waterfront mawatha)

ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ඔස්සේ ග්‍රාමීය මාර්ග සංවර්ධනයට වැඩි අවධානයක් අප යොමු කරන්නේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය ඌන සංවර්ධනයක පැවතීමත් මාර්ග සංවර්ධනයේ වාසිය ග්‍රාමීය ජනතාව නොයන ප්‍රවණතාව පිළිබඳ ව දැනුවත් නිසා. මේ මාර්ග රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රධාන අඩියරක් විදිහට රජය හඳුනාගෙන තිබෙනවා. මාර්ගය මතයි අනෙකුත් සියලු ම සංවර්ධන සැලසුම් රැඳී තිබෙන්නේ.

කිලෝමීටර් 450ක් පමණ සංවර්ධනය කෙරෙමින් පවතින අතර තවත් කොටසක් ප්‍රසම්පාදනය යටතේ ක්‍රියාත්මක වෙනවා. ඒ අනුව 2025 වසර අවසාන වන විට මේ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් කිරීමයි රජයේ අපේක්ෂාව. මහනුවර දිගන ප්‍රධාන මාර්ගයේ ගම්උදාව ජල ටැංකිය අසල සිට මල්ගහමුල හන්දිය දක්වා මාර්ගය, හාරිස්පත්තුවේ සීවලී කන්දේ සිට මහතැන්න සමාධි සෙනසුන දක්වා දිවෙන මාර්ගය, යටවත්ත සලාගම නිකගොල්ල මාර්ගයේ සිට බොරළුව දක්වා මාර්ගය, ඌවපරණගම රජමාවත පාර, බිංගිරිය හොරගස්අගාර නවරත්න හන්දියේ සිට ඉහළ කඩිගමුව හන්දිය දක්වා මාර්ගය, නවගත්තේගම රෝහල පාරේ සිට තැපැල් කාර්යාලය දක්වා මාර්ගය, හම්බන්තොට සිතුල්පව්ව රජමහා විහාරයේ කතරගම පාර, රත්මලාන විජිත ශාලාව අසල සිට කොතලාවල විද්‍යාලය අසලින් ගෝතමී විහාරය දක්වා මාර්ගය, සන්දිලිපායි ආනයිකොඩ්ඩෙයි සිට කාරතිවු මාර්ගය ව්‍යාපෘතිය යටතේ දැනට වැඩ නිමා කළ ග්‍රාමීය මාර්ග කිහිපයක්.

ග්‍රාමීය ජනතාවගේ අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත් වෙමින් ආර්ථිකමය වශයෙන් ඔවුන්ට ප්‍රතිලාභ ගලා යාමට ඇති බාධා ඉවත් කරලීමට ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රවාහන පද්ධතිය වැඩි දියුණු කිරීමයි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණ. මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ඒ. පී. කේ. අබේධීර පවසන පරිදි සාමාන්‍යයෙන් රටේ සංවර්ධනයේදී මූලික අවධානය යොමු වෙන්නේ 'ඒ' වර්ගයේ ප්‍රධාන මාර්ග සඳහා. ග්‍රාමීය මාර්ග සංවර්ධනයට ලබාදෙන අවධානය අඩුයි. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන අධ්‍යක්ෂ ජනරාල් ඒ. පී. කේ. අබේධීර; "ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ඔස්සේ ග්‍රාමීය මාර්ග සංවර්ධනයට වැඩි අවධානයක් අප යොමු කරන්නේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය ඌන සංවර්ධනයක පැවතීමත් මාර්ග සංවර්ධනයේ වාසිය ග්‍රාමීය ජනතාව නොයන ප්‍රවණතාව පිළිබඳ ව දැනුවත් නිසා. මේ මාර්ග රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රධාන අඩියරක් විදිහට රජය හඳුනාගෙන තිබෙනවා. මාර්ගය මතයි අනෙකුත් සියලු ම සංවර්ධන සැලසුම් රැඳී තිබෙන්නේ."



හම්බන්තොට දිස්ත්‍රික්කයේ, විගමුව පට්ටියපොළ පාරේ සිට විගමුව පාසල දක්වා මාර්ගය



නුවර දිස්ත්‍රික්කයේ, සීවලී කන්දේ සිට මහතැන්න සමාධි සෙනසුන දක්වා දිවෙන මාර්ගය

මෙය වඩාත් ඉහළ මට්ටමක ජනතා සහභාගිත්වය පවතින ව්‍යාපෘතියක්. මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ ග්‍රාමීය ජනතාවගේ අවශ්‍යතා පිළිබඳ ව ඒ ඒ ප්‍රදේශවල සම්බන්ධීකරණ කමිටු ඉදිරිපත් කරන තොරතුරු සලකා බලමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින්. එම තොරතුරු අනුවයි කඩිනමින් සංවර්ධනය කළ යුතු මාර්ග යෝජනා කෙරුණේ. ඒ අනුව ග්‍රාමීය මාර්ග හා ග්‍රාමීය පාලම් වැඩිදියුණු කිරීම සඳහා 2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. 2025 අගෝස්තු මස 11 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලද අනුමැතිය පරිදි තවදුරටත් මිලියන 20,119ක අරමුදල් ඒ සඳහා වෙන් කෙරුණා.

මේ ව්‍යාපෘතියට අවශ්‍ය මුදල් ප්‍රමාණය කිසිදු ප්‍රමාදයකින් හෝ බාධාවකින් හෝ තොර ව ලැබෙමින් පවතින නිසා නියමිත පරිදි, වඩාත් පහසුවකින්, නිසි ප්‍රමිතියකින් යුතු ව සහ ක්‍රමානුකූල ව ග්‍රාමීය මාර්ග සංවර්ධනය කළ හැකි වීම යහපත් තත්ත්වයක්. එහිදී කඳු සහිත මාර්ග, වතුර නිතර රැස්වෙන මාර්ග සඳහා කොන්ක්‍රීට් යෙදීම වැනි ක්‍රියාමාර්ග ගනිමින් ඒ ඒ මාර්ගවලට වඩාත් සුදුසු වන ආකාරයෙන් සංවර්ධන සැලසුම් සකස් ව තිබෙනවා.

ඉදිරියේදීත් රජයේ අවධානය මෙවැනි ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති වර්ෂයක් පාසා ගමට ගෙන එමින් ග්‍රාමීය ව ව්‍යාප්ත මාර්ග පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කිරීම.



# කඳුකරයේ සතුට

රංගිකා අබේසේකර

ජන හා නිවාස සංගණනය - 2024ට අනුව 21,781,800ක් වූ ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 74.1%ක් සිංහල ජන වර්ගයට අයත්. 12.3%ක් ශ්‍රී ලංකා දෙමළ, 10.5%ක් ශ්‍රී ලංකා යෝනක/මුස්ලිම්, 2.7%ක් ඉන්දියානු දෙමළ/මලෙයගහ දෙමළ සහ 3.0%ක් බර්ගර්, මැලේ, ශ්‍රී ලංකා චෙට්ටි, භාරත, වැදි යන ජනවර්ගවලට අයත්.

ශ්‍රී ලංකාවේ 'මලෙයගම් ප්‍රජාවගේ සතුට' තේමා කරගනිමින් වතුකරයේ දෙමළ ප්‍රජාව වෙනුවෙන් නිවාස ලබාදීමේ ව්‍යාපෘතියේ සිව් වැනි අදියරේ ආරම්භය සිදු වුණේ (ඔක්තෝබර් 12) බණ්ඩාරවෙල පොදු ක්‍රීඩාංගණයේදී. වසර 202කට පසු එම ප්‍රජාවගේ ජීවන තත්ත්වය වෙනස් වීම සංකේතවත් කරමින් වැලිමඩ වතුයාය, පූනාගල වතුයාය සහ හපුගල වතුයායේ 2056 දෙනෙකු සඳහා නොබෝදා (ඔක්තෝම්බර් 12) නිවාස හිමිකම්පත් පිරිනැමුණේ මේ වැඩසටහන යටතේ. මේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවෙන්නේ මලෙයගම් ප්‍රජාවට වඩාත් සුරක්ෂිත හා සුවපහසු නිවහනක් ලබාදීමේ අරමුණින් ඉන්දියානු රජය, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හා ඒකාබද්ධ ව වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයෙන්. මේ සඳහා අධීක්ෂණය සහ උපදේශකත්වය සපයන්නේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.

මලෙයගම් ප්‍රජාව ලෙස සැලකෙන්නේ වතුකරයේ වෙසෙන දෙමළ ජනතාව. ඔවුන්ගෙන් 1,000,000කට ආසන්න පිරිසක් වාසය කරන්නේ කඳුකරයේ තේ වතු ආශ්‍රිත ව. වසරකට ඩොලර් බිලියන 1.5කට ආසන්න ව මෙරට ජාතික ආර්ථිකයට පණ දෙන්නේ ඉතිහාසයේ සිට විදේශ විනිමය ඉපැයීමේ කාර්යයට දායක වන ඔවුන්. එම ප්‍රජාව මෙරටට පැමිණ වසර 202ක් ගත ව ඇතත් ඔවුන්ගේ මූලික අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට අවස්ථාව හිමි වී නැහැ. ඔවුන්ගෙන් බහුතරයකට වැඩි පිරිසක් භාවිත කරන්නේ පොදු වැසිකිළි පද්ධති. ජීවත් වන්නේ ලැයිම් කාමරවල. ඔවුන්ට ම වෙන් වූ ඉඩමක්, නිවසක්, ලිපිනයක් නොමැතිකම හේතුවෙන් එම ප්‍රජාව විවිධ දුෂ්කරතාවලට පත්වන අයුරු දක්නට පුළුවන්.



මෙවැනි පසුබිමක මෙරට මලෙයගම් ප්‍රජාවගේ මූලික අයිතිවාසිකම් රැක දීම වෙනුවෙන් නිවාස ලබාදීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සාධනීය තත්ත්වයක්. මෙහි පළමු අදියර නිවාස 1,300කින් සමන්විත ව 2024 වසරේ ආරම්භ කළා. ඒ අනුව ඉතිහාසයේ වැඩි ම නිවාස සංඛ්‍යාවක් එක ම අවුරුද්දක ආරම්භ කරන්නේ 2025 වසරේදී.

අදහස් දක්වන වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් ප්‍රභාත් චන්ද්‍රකීර්ති; "වතුකරයේ දෙමළ ප්‍රජාව වෙනුවෙන් නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය නිවාස 10,000ක් සහිත ව සම්පූර්ණ කිරීමටයි නියමිත. ඉඩම සමඟ නිවාස 10,000ක් ලබාදීම 2027 වර්ෂයේදී සම්පූර්ණ කළ යුතු වෙනවා. එහි පළමු අදියර නිවාස 1,300කින් සමන්විත ව 2024 වසරේ ආරම්භ කළා. ඉතිරි නිවාස 8,700න්, නිවාස 4,700ක කටයුතු මේ වර්ෂයේදී ආරම්භ කරනවා. නිවාස 4,700න් අධි අවදානම් කලාපවල සිටින, නායාම්වලට ගොදුරු විය හැකි බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් නිර්දේශ ලබාදී තිබෙන 2,000ක පිරිසකටයි සිව් වැනි අදියර යටතේ නිවාසයක හා ඉඩමක හිමිකම් ලැබෙන්නේ.

මේ සඳහා ඉන්දියානු ආධාර යටතේ රුපියල් මිලියන 3,000ක් වෙන්කර තිබෙනවා. නිවාස ආශ්‍රිත ව යටිතල පහසුකම් සංවර්ධනයට රුපියල් මිලියන 500ක් ශ්‍රී ලංකා රජයෙන් වෙන් කර තිබෙනවා. 2026 වසර සඳහා වෙන් කර තිබෙන්නේ නිවාස 4,000ක මූලික කටයුතු ආරම්භ කිරීමට රුපියල් මිලියන 3,540ක් සහ එහි යටිතල පහසුකම් වර්ධනයට රුපියල් මිලියන 750ක්.” ඉන්දියානු රජයෙන් ක්‍රියාත්මක කරන සියලු නිවාස ව්‍යාපෘති සඳහා වෙන් කර තිබෙන්නේ ඉන්දියානු රුපියල් කෝටි 1,835ක ආධාර.

මේ ව්‍යාපෘතියේදී නිවාස හිමිකම සඳහා තෝරා ගැනීමට මූලික නිර්ණායක කිහිපයක් සලකා බැලෙනවා. නාය යාම් අවදානමක් සහිත ව ජීවත් වන පවුලක් වීම, වැවිලි කර්මාන්තයේ නියැළී සිටින කම්කරු පවුලක් වීම, වසර 5කට වඩා ලැයිම් කාමරවල ජීවත් වීම, මීට ඉහතදී කිසි ම අවස්ථාවක නිවසක් නොලැබීම යන කාරණායි මෙහිදී සැලකිල්ලට ගැනෙන්නේ. ඒ අනුව සිව් වැනි අදියරේදී පුද්ගලයන් 2056ක් නිවාස ලබා ගැනීමට සුදුසුකම් ලබා තිබෙනවා.

නිවාස ව්‍යාපෘතිවලට අමතර ව වතුකර ප්‍රදේශවල අධ්‍යාපන, සෞඛ්‍ය, සමාජ සහ ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීමෙහිලා ඉන්දීය රජය මැදිහත් වී තිබෙනවා. අදහස් දක්වන ඉන්දියානු මහකොමසාරිස් කාර්යාල නියෝජිත ආචාර්ය සත්‍යාංජල් පාන්ඩේ; “ශ්‍රී ලංකාවේ වතුකර ප්‍රදේශවල ජීවත්වන ඉන්දීය දෙමළ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට සහ සංවර්ධනයට ඉදිරියටත් අප සහයෝගය දෙනවා. රටේ ජනතාවගේ අවශ්‍යතා සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතා ඔස්සේ මෙහෙයවන සෑම සංවර්ධන මුලපිරීමකට ම සහාය දැක්වීම ඉන්දියාවේ තිර අභිප්‍රායක්. මේ නිවාස ව්‍යාපෘතියත් එවැනි අවස්ථාවක්.”

ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදහස් දක්වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මයුර සමරකෝන් පවසන්නේ මලෙයගම් ප්‍රජාව ලෙස හඳුන්වන වතු ආශ්‍රිත ව ජීවත්වන ද්‍රවිඩ ජනතාව පැහැදිලි ව ම ජීවත් වන්නේ ආන්තික ජන කොටසක් ලෙස බව. අදහස් දක්වන මහාචාර්යවරයා; “දෙමළ වතු කම්කරු ජනතාව විවිධ දේශපාලන අරමුණු උදෙසා භාවිත කිරීම ඉතිහාසයේ සිට දැකගත හැකියි. විශේෂයෙන් ඡන්ද අරමුණු කරගනිමින් ඔවුන් භාවිත වුණා. බොහෝ විට තේ වතු ආශ්‍රිත කාන්තා කම්කරුවන් ලිංගික වහල් සේවයට පවා යොදාගත් අවස්ථා ඉතිහාසයේ දක්නට ලැබුණා. මේ ජනතාව ජීවත් වන්නේ ඉතා අවම පහසුකම් සහිත ලැයිම් කාමර හෙවත් පේළි නිවාසවල. මේවායේ ඇත්තේ වෙනස් ම වූ සංස්කෘතියක්. එය සමාජ විද්‍යාවේදී සහ මානව විද්‍යාවේදී හඳුන්වන්නේ දුගීකමේ සංස්කෘතිය ලෙස. ලැයිමෙන් පිටත සමාජයට යාමට නොහැකිවීම එම ප්‍රජාවට ඇති ප්‍රබල අභියෝගයක්. කිසිවෙකුට අවශ්‍ය වුණේ නැහැ මේ සංස්කෘතික පසුබිමෙන් ඔවුන් මුදා ගැනීමට. විශේෂයෙන් වතුකර කම්කරු දෙමළ ජනතාවගේ සමාජ ගැටලු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල සහ ඊට පරිබාහිර ආයතන පර්යේෂණ පත්‍රිකා හා පර්යේෂණ සිදුකර තිබෙනවා. එහෙත් ඒවායෙහි තිබූ කිසිදු කාරණාවක් මේ දක්වා ම ක්‍රියාත්මක වී නැහැ.”

පසුගිය කාලයේ තේ දලු නෙළමින් අඩු පහසුකම් යටතේ දුක්ඛිත ජීවන තත්ත්වයක් ගතකරන මේ ජනතාවගෙන් පහත වැටී තිබුණු ආර්ථිකය ගොඩනැඟීමට ලැබුණේ ඉහළ දායකත්වයක්. එවැනි දායකත්වයක් සපයන ප්‍රජාවක් මහා සම්ප්‍රදායට අන්තර්ග්‍රහණය කර ගැනීමට අවකාශය තිබෙන බවයි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මයුර සමරකෝන් අවධාරණය කරන්නේ. නිවසක් යනු මූලික මානව අවශ්‍යතාවක්. නිවසක් ලබා දීමෙන් බලාපොරොත්තු වන්නේ හිසට සෙවණක් ලබාදීම පමණක් ම නොව ඒ තුළ ගොඩනැගෙන සංස්කෘතියක්. දෙමාපිය දූ දරු සම්බන්ධතා, ඥාති සම්බන්ධතා සහ අසල්වාසී සම්බන්ධතා ඔස්සේ තෘප්තිමත් ජීවිතයක් ඔවුන්ට හිමිවනු ඇති. ඔවුන්ගේ ජීවිතවල විශාල පරිවර්තනයක් සිදු වනු ඇති. මේ ඔස්සේ එම ප්‍රජාවගේ ආර්ථික ක්‍රියාවලියෙහි පවා පරිවර්තනයක් සිදුවීමට පුළුවන්. මේ නිසා වතුවල වැඩ කර ලබාගන්නා වැටුපට අමතර ව තමාට ම ආවේණික ඉපැයීම් ක්‍රමයක් ඇති කර ගැනීමට ද පෙළඹෙනු ඇති බවත් මහාචාර්යවරයා පවසනවා.

ආර්ථිකයත් සමාජ ජීවිතයත් නගා සිටුවීමට ඉන්දියානු රජය දක්වන සහායට කෘතඥතාව පළ කළ ජනාධිපති අනුර කුමාර දිසානායක පවසන්නේ වසර 202කට ආසන්න කාලයක් මහ පොළොව සමඟ ගැටෙමින් නිෂ්පාදන සඳහා තම දායකත්වය ලබා දෙමින් සුවිශේෂ මෙහෙයක් ඉටු කරන ඔවුන් වෙනුවෙන් රජයට විශාල වගකීමක් පැවරෙන බව. එබැවින් ඉතා පහත් මට්ටමක තිබෙන මලෙයගම් ප්‍රජාවගේ ගරුත්වය සහ සංස්කෘතික අයිතිවාසිකම්වල හිමිකම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සෑම ප්‍රජාවකගේ ම සංස්කෘතිකමය අයිතිවාසිකම්වල ගෞරවය, අනන්‍යතාව හා වටිනාකම් රැකෙන සමාජයක් නිර්මාණය කිරීමට ජනාධිපතිවරයා ප්‍රතිඥා ලබා දුන්නා.

ශ්‍රී ලංකාව බහුවාර්ගික රටක්. එහිදී එකිනෙකාට අනන්‍ය වූ සංස්කෘතියට ගරු කරමින් එකිනෙකාට සහයෝගය දැක්වීම කළ යුත්තක්. රුපියල් ශතවලින් පමණක් ම ‘පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්’ නිර්මාණය කිරීම කළ නොහැක්කක්. මනුෂ්‍යත්වයෙන් සපිරි පොහොසත් රටක සෑම පුද්ගලයෙකු ම සතුටින් සිටීමයි වැදගත්.





# සීරුවෙන්

බිනූ දිලාරා ගමගේ

මත්ද්‍රව්‍ය භාවිතය අද වනවිට සමාජ, ආර්ථික, නෛතික හා සෞඛ්‍යමය වශයෙන් ගෝලීය ප්‍රජාවට ම බලපාන ගැටලුවක්. දිනෙන් දින මේ තත්ත්වය විවිධ ස්වරූප ගනිමින් උග්‍ර වෙමින් තිබෙනවා. ශ්‍රී ලංකාවේත් විෂ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය ජාතික වශයෙන් අවධානය යොමු කළ යුතු ව්‍යසනකාරී මට්ටමක් දක්වා ගමන් කර තිබෙන්නේ විෂ මත්ද්‍රව්‍ය ජාවාරම කේන්ද්‍රකරගෙන බොහෝ අපරාධ, අපචාර සිදු වන පසුබිමක.

මෙය හුදෙක් ස්වාභාවික ව නිර්මාණය වූවක් නොව දිගු කලක් තිස්සේ දේශපාලනඥයන්ගේ සහ ඇතැම් රාජ්‍ය නිලධාරින්ගේ ආශිර්වාදයෙන් නිර්මාණය කරවූවක්. එබැවින් වත්මන් රජයේ අපේක්ෂාව වන්නේ මේ උවදුර මුලිනුපුටා දැමීමට කාර්යක්ෂම ව තීරණ ගත හැකි ශක්තිමත් යාන්ත්‍රණයක් හා පුළුල් ජනතා සහභාගිත්වයක් පෙරදැරි කරගැනීම. ඒ අනුවයි 'රටම එකට' විෂ මත්ද්‍රව්‍ය උවදුර තුරන් කිරීම ඉලක්ක කර ගත් ජාතික වැඩසටහන ඇරඹුණේ.

මේ වැඩසටහනට මඟ පෙන්වීමට ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවෙන් 'රටම එකට ජාතික මෙහෙයුම් සභාවක්' පත් කෙරුණා. මත්ද්‍රව්‍ය ජාලය පිටුදැකීම, ඊට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය, මත්ද්‍රව්‍ය උවදුර තුරන් කිරීම සඳහා ජන සහභාගිත්වය ලබා ගැනීම, ජනතාව දැනුවත් කිරීම සඳහා බහුජන සංවිධාන සහභාගි කර ගැනීම සහ මාධ්‍ය මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීම එහි කාර්යභාරය. ජනාධිපතිවරයා, සභාපති ලෙසත් ජනාධිපති ලේකම්, ලේකම් ලෙසත් පත් වූ මේ මෙහෙයුම් කමිටුවේ දේශපාලනඥයන්, රාජ්‍ය නිලධාරින්, හමුදා නායකයන් ඇතුළු විශේෂඥ පිරිසක් සාමාජිකත්වය දරනවා.

ඒ අනුව 'රටම එකට' ජාතික වැඩසටහනේ සමාරම්භක උත්සවය ඔක්තෝබර් 30 දින පෙ.ව 10.00ට ජනාධිපති අනුර කුමාර දිසානායකගේ ප්‍රධානත්වයෙන් කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්වුණා. එහිදී ජනාධිපතිවරයා ප්‍රතිඥා ලබා දුන්නේ තබන ලද මේ පියවර සහතික වශයෙන් ම ජයග්‍රහණය කරවා මේ ව්‍යසනය පරාජය කරන බවට. ඒ සඳහා ඔහු ප්‍රවේශය ලබා ගන්නේ මෙලෙස.

"මෙය මේ මොහොතේ ඇති වූ අභියෝග යක් නොවේ. දශක ගණනාවක් තිස්සේ ක්‍රමානුකූල ව වර්ධනය වෙලා අද වෙනකොට මේ අභියෝගය මුළුමහත් සමාජ දේහය ම ගිලගෙන තිබෙනවා.

මත්ද්‍රව්‍ය භාවිතය අද වනවිට සමාජ, ආර්ථික, නෛතික හා සෞඛ්‍යමය වශයෙන් ගෝලීය ප්‍රජාවට ම බලපාන ගැටලුවක්. දිනෙන් දින මේ තත්ත්වය විවිධ ස්වරූප ගනිමින් උග්‍ර වෙමින් තිබෙනවා. ශ්‍රී ලංකාවේත් විෂ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය ජාතික වශයෙන් අවධානය යොමු කළ යුතු ව්‍යසනකාරී මට්ටමක් දක්වා ගමන් කර තිබෙන්නේ විෂ මත්ද්‍රව්‍ය ජාවාරම කේන්ද්‍රකරගෙන බොහෝ අපරාධ, අපචාර සිදු වන පසුබිමක.

මේ අවස්ථාවේ නිශ්චිත ලෙස අපට තෝරා ගන්න පුළුවන් මාර්ග දෙකක් තිබෙනවා. එකක් පැරණි දේ ඒ අයුරින් ම සිදු වීමට ඉඩ දී පාඩුවේ ඉන්න එක. එහෙම නැත්නම් එයට එරෙහි ව හැප්පීම. මමත්, අපේ ආණ්ඩුවත් මේකට එරෙහි ව හැප්පීමට තීරණය කර තිබෙනවා.

මේ ව්‍යසනය අපේ දරු පරම්පරාව ගිල ගනිමින් තිබෙනවා. අපේ රටේ බන්ධනාගාරගත වන අයගෙන් 64%ක් මත්ද්‍රව්‍ය සහ සම්බන්ධ වැරදිවලට හසු වූ අය. ඒ වගේ ම දරුවන්ගේත් මුළු අනාගතය ම විනාශ කරමින් සිටිනවා. වයස අවුරුදු 18ත් 24ත් අතර හිරිමල් වයසේ සිටින තරුණ පරම්පරාව මෙහි විශාලතම ගොදුර බවට පත්වෙලා. ඔවුන්ගේ අනාගතය, අපේක්ෂා මහමඟ විනාශ වෙමින් තිබෙනවා. ඒ නිසා අපිට බලාගෙන සිටීමට අයිතියක් නැහැ."

මෙවැනි ජාතික වැඩසටහනක අවශ්‍යතාව පැහැදිලි කරන 'රටම එකට' ජාතික මෙහෙයුම් සභාවේ ලේකම්, ජනාධිපති ලේකම් නන්දික කුමාරනායක; "වසර ගණනාවක් තිස්සේ මත්ද්‍රව්‍ය භාවිතය රට පුරා ම ව්‍යාප්ත වෙමින්, ක්‍රමානුකූල ව වර්ධනය වෙමින් ඉතා

රටම එකට


ஒரு நாடாக ஒன்றாக

A Nation United

උච්ච අවස්ථාවකට පැමිණ තිබෙනවා. විශේෂයෙන් එය පරිභෝජනයට පමණක් නොවෙයි, දකුණු ආසියාතික කලාපයට ම මත්ද්‍රව්‍ය බෙදා හරින මධ්‍යස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් ව තිබෙනවා. මත්ද්‍රව්‍ය නිෂ්පාදනයටත් යොමු වී තිබෙනවා. අද විශ්වවිද්‍යාලවලින් විතරක් නෙවෙයි මත්ද්‍රව්‍ය සම්බන්ධ සිදුවීම් පාසල් මට්ටමින් පවා දකින්නට, අසන්නට ලැබෙනවා. සෑම දෙනා ම අද මත්ද්‍රව්‍යයක ගොදුරක් වීමේ අවදානමට ලක් වෙලා. මුළු සමාජයක් ම මේ විදිහට පහතට හෙළීමට මත්ද්‍රව්‍ය ව්‍යසනය ඉතාමත් බලපෑම්කාරියි. මෙයින් වෙන්නේ රටේ අනාගතය අඳුරු වීම. මේ නිසයි ජාතික මට්ටමෙන් ඒකරාශී වීමක් මේ මත්ද්‍රව්‍ය උවදුර විනාශ කිරීමට අවශ්‍ය වන්නේ.”

‘රටම එකට’ විෂ මත්ද්‍රව්‍ය උවදුර තුරන් කිරීම ඉලක්ක කර ගත් ජාතික වැඩසටහනට සම්බන්ධ රේගුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, පොලීසිය, හමුදාව, බුද්ධි අංශ යනාදී සියලු ම පාර්ශ්ව ඒකාබද්ධ කරගෙන ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානයක් ගොඩනැඟීමත් සිදු වෙනවා.

ජනාධිපතිවරයා අවධාරණය කරන පරිදි මත්ද්‍රව්‍ය හා සම්බන්ධ විශාල මුදල් ප්‍රමාණයක් සංසරණය වන අතර ඒවායේ අලෙවිය කොතරම් ද යන්න අත්අඩංගුවට පත්වන සංඛ්‍යාවලින් අවබෝධ වෙනවා. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සඳහන් කරන දත්ත අනුව මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් 2020 වර්ෂයේදී 97,416ක් වූ අත්අඩංගුවට ගැනීම් 2024 වර්ෂය වන විට වර්ධනය වී තිබෙනවා, 228,450ක් දක්වා. එය ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ගැටලුවේ තීව්‍රතාව සහ වැටලීමේ මෙහෙයුම්වල සාර්ථකත්වය පිළිබිඹු කරන්නක්.



මූලාශ්‍රය - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය - 2024

මත්ද්‍රව්‍ය භාවිතය සඳහා බොහෝ දෙනා පෙළඹෙන්නේ ඇසුරු කරන්නන්ගේ ආශ්‍රයෙන් හා පෙළඹවීමෙන්, විනෝදය පදනම් කරගත් අරමුණුවලින්, මත්ද්‍රව්‍ය පිළිබඳ ව ගොඩ නඟාගෙන තිබෙන මිත්‍යා මත, සංජානනයන් හා විශ්වාසයන්, නොදැනුවත්කම හා අඩු අධ්‍යාපන මට්ටම


අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සඳහන් කරන දත්ත අනුව මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් 2020 වර්ෂයේදී 97,416ක් වූ අත්අඩංගුවට ගැනීම් 2024 වර්ෂය වන විට වර්ධනය වී තිබෙනවා, 228,450ක් දක්වා. එය ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ගැටලුවේ තීව්‍රතාව සහ වැටලීමේ මෙහෙයුම්වල සාර්ථකත්වය පිළිබිඹු කරන්නක්. මත්ද්‍රව්‍ය භාවිතය සඳහා බොහෝ දෙනා පෙළඹෙන්නේ ඇසුරු කරන්නන්ගේ ආශ්‍රයෙන් හා පෙළඹවීමෙන්, විනෝදය පදනම් කරගත් අරමුණුවලින්, මත්ද්‍රව්‍ය පිළිබඳ ව ගොඩ නඟාගෙන තිබෙන මිත්‍යා මත, සංජානනයන් හා විශ්වාසයන්, නොදැනුවත්කම හා අඩු අධ්‍යාපන මට්ටම වැනි සාධක නිසා බව විවිධ අධ්‍යයන හා සිද්ධි වාර්තාවලින් අනාවරණය කරගෙන තිබෙනවා.


වැනි සාධක නිසා බව විවිධ අධ්‍යයන හා සිද්ධි වාර්තාවලින් අනාවරණය කරගෙන තිබෙනවා. ඒ බව අවධාරණය කරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති විශේෂඥ වෛද්‍ය ඉන්දික වන්නිනායක පවසන්නේ පාසල් දරුවන් හා තරුණ වැඩිහිටි ප්‍රජාව මත්ද්‍රව්‍ය සඳහා පෙළඹීමට ප්‍රධාන වන්නේ කුතුහලය හා සම වයස්වලින් ඇති කරන බලපෑම බව.

මේ නිසා මත්ද්‍රව්‍ය භාවිතය, නිවාරණය හා පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තියට අනුව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය නිවාරණ හා පාලනය කිරීමේ කාර්ය රැසක් සිදු කරනවා. ඊට අනුව මේ වනවිට පාසල්, විශ්වවිද්‍යාල, නිෂ්පාදන කර්මාන්ත ශාලා, ආරක්ෂක හමුදා, පොලිසිය, වැඩපොළ, වතු සහ රෝහල් වැනි විශාල ආයතන සංඛ්‍යාවක මත්ද්‍රව්‍ය භාවිතය පාලනය කෙරෙන ආයතනික චර්යා පද්ධති ස්ථාපනය කර තිබෙනවා. ප්‍රාථමික මට්ටමෙන් ඉහළ සෑම පාසලක් සඳහා ම නිසි උපදේශන පහසුකම් ලබා දීම, තරුණයන්ගේ අවදානම් චර්යා අවම කරමින් තීරණ ගැනීමේ හැකියාව, ආධ්‍යාත්මික හා සදාචාරාත්මක වටිනාකම් වැඩිදියුණු කරන ආකාරයේ වැඩසටහන් සංවිධානය, මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා මැදිහත්වන පිරිස් සඳහා නිසි උපදේශන සේවාවක් ක්‍රියාත්මක කිරීම, මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන්ට අවශ්‍ය ප්‍රතිකාර සේවා ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් ලබා දීම, ප්‍රජා ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටුවීම, උපදේශන ක්‍රියාවලි මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා ලබා දීම යනාදී වූ පුළුල් වැඩපිළිවෙලක් මීට අයත්. පුනරුත්ථාපන ක්‍රියාවලියට අදාළ ව විවිධ බහුජන සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධානවල සහාය ලබා ගැනීමත් මෙහිදී වැදගත්.

ජනාධිපතිවරයා අවධාරණය කරන ආකාරයට පුනරුත්ථාපන ක්‍රියාවලිය සමග විවිධ බහුජන සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන සිටිනවා. ඔවුන් පවතින හැකියාව අනුව මේ වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කරනවා. ඔවුන්ට අවශ්‍ය සහාය ලබා දෙමින් මේ පුනරුත්ථාපන ක්‍රියාවලියේ සිටින සියලු බහුජන සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන ඒකාබද්ධ කරගෙන ‘රට ම එකට’ වැඩසටහන දියත් කිරීමයි රජයේ අපේක්ෂාව.

# දූෂණයෙන් තොර සංවර්ධනයක පෙර දැක්ම




දීප්ත කුමාර බටගොඩ

"දූෂණය කියන්නේ දුප්පතුන් මත පටවන ලද බද්දක්. ඒ වගේ ම එය අපගේ සංවර්ධනය වෙළා ගත් විලංගුවක්" ශ්‍රී ලංකාවේ 80 වැනි අය වැය සහ වත්මන් ආණ්ඩුවේ දෙවැනි අය වැය ඉදිරිපත් කරමින් ජනාධිපති අනුර කුමාර දිසානායක ප්‍රකාශ කළේ එලෙස. දූෂණය අවම කිරීමෙන් සංවර්ධනය ඉහළ නැංවිය හැකි ආකාරය මෙන් ම ඒ අනුව නීතියේ ආධිපත්‍යය තහවුරු කරමින්, දූෂණයෙන් තොර වූ විනිවිදභාවයකින් යුතු රාජ්‍ය වියදම් හා ආදායම් පවත්වා ගනිමින්, පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වය සහිත ව, රටේ සංවර්ධනය ඉලක්ක කරගත් අය වැයක් 2026 සඳහා රජය ඉදිරිපත් කර තිබෙන බව සමස්ත අය වැය කතාවේ පැහැදිලි ව දක්නට ලැබුණා.

2025 මාර්තු මාසයේදී ඉදිරිපත් වුණු වත්මන් ආණ්ඩුවේ පළමු වැනි අය වැය ප්‍රකාශයේ අරමුණ වූයේ අර්බුදයෙන් කඩා වැටුණු ආර්ථිකය යථාතත්ත්වයට පත් කිරීම. සමස්ත රාජ්‍ය වියදම් සම්බන්ධයෙන් යම් යම් ගැටලුකාරී තත්ත්ව පැවතියත් එම අය වැයෙන් අපේක්ෂා කළ ආර්ථිකයේ ස්ථාවරත්වය මේ වන විටත් ළඟා කරගෙන ඇති බව සාර්ව ආර්ථිකය හා එහි දර්ශක පෙන්නුම් කරනවා. ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් කඩා වැටුණු ආර්ථිකය යථාතත්ත්වයට පත්වීමට දශකයක පමණ කාලයක් ගතවනු ඇති බවට පුරෝකථනය කළත් දූෂණයෙන් තොර විනිවිදභාවයකින් හා රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීම නිසා එම තත්ත්වය වසරක් වැනි කෙටි කාලයකදී ළඟා කර ගැනීමට සමත් ව තිබෙන බව ජනාධිපතිවරයා ප්‍රකාශ කළා. 2025 වර්ෂයේ දෙවැනි කාර්තුව වන විට ආර්ථිකයේ වර්ධනය සියයට 4.8ක් ව පවත්වා ගැනීමටත් පොලී අනුපාතිකය, විනිමය අනුපාතිකය හා උද්ධමනය වැනි සාර්ව ආර්ථික විචල්‍ය යම් ආකාරයක ස්ථාවර ස්වභාවයකින් හා ආර්ථිකයට හිතකර මට්ටමින් පවත්වා ගැනීමටත් හැකි ව තිබෙනවා. නිල විදේශ සංචිත, සංචාරක කර්මාන්තය හා අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයක් සහ ස්ථාවරභාවයක් පෙන්නුම් කරමින් තිබෙනවා. ණය අර්බුදය ක්‍රමක්‍රමයෙන් අවම කර ගැනීමට ද ආණ්ඩුව සමත් ව තිබෙනවා. මේ නිසා විවිධ ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන ශ්‍රී ලංකාව ඉහළ ශ්‍රේණියකට ඔසවා තබා ඇති අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව වැනි ජාත්‍යන්තර ආයතන ශ්‍රී ලංකාව කෙටි කාලයකදී අත්පත් කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳ ව ප්‍රශංසාත්මක ඇගයීම් ලබා දුන්නා. ඒ අනුව වත්මන් ආණ්ඩුවේ පළමු අය වැයෙන් අපේක්ෂා කරන ලද සමස්ත වියදම් ශීර්ෂ ඒ

**අයවැය සරාංශය 2024 - 2026**

| | 2024 | 2025 | 2026 |
|---|---|---|---|
| **මුළු ආදායම හා ප්‍රදාන /ද.දේ.නි (%)** | **13.7** | **15.9** | **15.4** |
| **මුළු ආදායම හා ප්‍රදාන /ද.දේ.නි (%)** | **13.5** | **15.9** | **15.3** |
| බදු ආදායම /ද.දේ.නි (%) | 12.4 | 14.8 | 14.2 |
| බදු නොවන ආදායම /ද.දේ.නි (%) | 1.1 | 1.1 | 1.0 |
| **ප්‍රදාන /ද.දේ.නි (%)** | **0.2** | **0.1** | **0.1** |
| **මුළු වියදම/ද.දේ.නි (%)** | **20.5** | **20.5** | **20.5** |
| වර්තන වියදම/ද.දේ.නි(%) | 17.9 | 17.3 | 16.5 |
| පොළී නොවන /ද.දේ.නි (% | 8.9 | 9.0 | 8.9 |
| පොළී /ද.දේ.නි (%) | 9.0 | 8.3 | 7.6 |
| රාජ්‍ය ආයෝජන /ද.දේ.නි (%) | 2.7 | 3.2 | 4.0 |
| ආදායම් අතිරික්තය (+) හිඟය(-) /ද.දේ.නි(%) | -4.4 | -1.4 | -1.2 |
| ප්‍රාථමික අතිරික්තය (+) හිඟය(-) /ද.දේ.නි(%) | 2.2 | 3.8 | 2.5 |
| **අයවැය අතිරික්තය (+) හිඟය (-) /ද.දේ.නි(%)** | **-6.8** | **-4.5** | **-5.1** |

මූලාශ්‍රය - ශ්‍රී ලංකාවේ අයවැය ප්‍රකාශය 2026

අයුරින් ම ඉටු කර ගැනීමට නොහැකි වුවත් අය වැයෙන් අපේක්ෂා කරන ලද මූලික අරමුණ වූ රටේ ආර්ථික ස්ථායිතාව ඇති කර ගැනීමට වත්මන් ආණ්ඩුව සමත් ව තිබෙනවා.

රජරට විශ්වවිද්‍යාලයේ මහාචාර්ය නාරද්ද ගමගේ පවසන්නේ 2025 රජයේ අය වැය ඉදිරිපත් කරන ලද්දේ ආර්ථිකය යම් ආකාරයක යථාවත් කර ගැනීමේ අපේක්ෂාවෙන් බව. අදහස් දක්වන ඔහු; "බලයේ සිටින රජය යම් ආකාරයක වාමවාදී ප්‍රතිපත්තියක් සහිතවයි බලයට පත් වුණේ. ඒ වන විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් එකඟතා අනුව ක්‍රියා කිරීමටත් ආණ්ඩුවට සිදු වුණා. සමස්තයක් වශයෙන් විග්‍රහ කරන විට 2025 අය වැයෙන් අපේක්ෂා කරන ලද බොහෝ යෝජනා ක්‍රියාත්මක වීමක් දකින්න පුළුවන්. අපේක්ෂා කරන ලද ඇතැම් කාරණාවලින් බැහැර වීමට ද රජයට සිදු වුණා. එහෙත් රාජ්‍ය ආදායම, රාජ්‍ය වියදම සහ අයවැය පරතරය සම්බන්ධයෙන් අජය අපේක්ෂා කරන තත්ත්වය ළඟා කර ගැනීමට හැකි වී තිබෙනවා. මෙයට පෙර පැවති ආණ්ඩුවලට රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීමට නොහැකි වීම නිසා වරින් වර පාර්ලිමේන්තුව මගින් අතිරේක මුදල් ප්‍රතිපාදන සම්මත කර ගැනීමට සිදු වුණා. නමුත් 2025 අය වැය ලේඛනයේ එවැන්නක් ඇති වූයේ නැහැ. ආර්ථික ස්ථාවරත්වය කරා ළඟා වීම ප්‍රධාන අපේක්ෂාව වූ නිසා යටිතල පහසුකම්, ව්‍යාපෘති වැනි දෑ නොකිරීමෙන් රජය ජනතාවට දැනෙන යමක් නොකළ බවට ඇතැමුන් චෝදනා නගනවා. නමුත් 2025 අය වැයේ ප්‍රධාන අරමුණ වූ ආර්ථිකයේ ස්ථාවරත්වය ඇති කර ගැනීමට වත්මන් රජය සමත් ව තිබෙනවා. සංවර්ධන අරමුණු අපේක්ෂා කළ හැක්කේ ආර්ථිකයේ ස්ථාවරත්වයකින් පසුවයි."

2026 වර්ෂයේ අය වැය මූලික වශයෙන් අරමුණු කර තිබෙන්නේ සංවර්ධන අය වැයක් ලෙස. එනම්, ස්ථාවරත්වයට පත් වත්මන් ආර්ථිකය වසර කිහිපයකින් සියයට 7ක පමණ ස්ථාවර හා අඛණ්ඩ වර්ධනයක් සහිත ආර්ථිකයක් ලෙසින් පවත්වා ගැනීමට අවශ්‍ය මූලික පියවර 2026 අය වැයෙන් ගැනෙනු ඇති. එමෙන් ම සම්පත් බෙදී යාමේ විෂම බව අවම කරමින් වර්ධනය වන ආර්ථිකයේ ප්‍රතිලාභ සියලු ම පිරිස් වෙතට ගලා යන සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයක් මෙවර අය වැයෙන් අරමුණු කරන බව පැහැදිලි වූ කාරණයක්.

පසුගිය මෙන් ම මෙවර අය වැයේදී ද රජයේ ප්‍රධානතම තේමාව වන්නේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියට අනුකූල වන 'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' යන්න. මෙවර අය වැය කෙටුම්පත් කිරීමේදී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති කරගත් එකඟතා සහ එහි තාක්ෂණික වාර්තාව, ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන, ඒ සඳහා නෛතික රාමුව සපයන දූෂණ විරෝධි පනත, මහබැංකු පනත, රාජ්‍ය මූල්‍ය පනත හා ආර්ථික පරිවර්තන පනත යනාදී පනත්වලින් සපයා ඇති නීතිමය රාමුවේ සිට අය වැය සම්පාදනය කළ යුතු ව තිබුණා.

රජයේ අය වැයකින් සිදු කරන්නේ ඉදිරි මූල්‍ය වර්ෂයක් සඳහා රජයේ වියදම් ශීර්ෂ සහ ඒ සඳහා ආදායම් රැස් කරගන්නා මාර්ග පූර්වයෙන් තීරණය කර ගැනීම. පවත්නා තත්ත්වය රැක ගැනීම සඳහාත් ආර්ථිකයේ හඳුනා ගන්නා ක්ෂේත්‍රවල අපේක්ෂිත වර්ධනය සඳහාත් මේ වියදම් ශීර්ෂ වෙන් කෙරෙනවා. මේවා ප්‍රධාන වශයෙන් වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම්. සමාන්‍යයෙන් වර්තන වියදම් ප්‍රාග්ධන වියදම්වලට වඩා ඉහළ අගයක් ගන්නා අතර ප්‍රාග්ධන වියදම් සෘජු සංවර්ධන වියදම් වශයෙන් ද සැලකෙනවා. එසේ වුවත් ප්‍රාග්ධන වියදම් වර්තන වියදම්වලට සාපේක්ෂ ව අඩු අගයක් ගත්තත් එයින් අදහස් වන්නේ නැහැ යම් අය වැයකින් සංවර්ධන අපේක්ෂා අවම වන බවක්. එයට හේතුව ආර්ථිකයක වර්ධනය රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ එකතුවකින් ඇතිවන්නක් වීම. රාජ්‍ය වියදම් ශීර්ෂවල රාජ්‍ය අංශය සෘජු ව ම නිෂ්පාදන ක්‍රියාවලියට දායක වන වියදම් මෙන් ම පෞද්ගලික අංශයේ වර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් සඳහා වියදම් ද ඇතුළත්.

ඒ අනුව 2026 අය වැයේ සමස්ත රාජ්‍ය වියදම රුපියල් බිලියන 7057ක් වන අතර වර්තන වියදම වශයෙන් රුපියල් බිලියන 5688ක් දක්වා තිබෙනවා. සෙසු වියදම් ප්‍රාග්ධන වියදම් වශයෙනුයි දක්වා ඇත්තේ. මේ වියදම් පියවා ගැනීම සඳහා රජය රුපියල් බිලියන 5300ක් බදු හා බදු නොවන ආදායම් මාර්ග වශයෙන් දක්වා තිබෙනවා. ඒ අනුව සමස්ත අය වැය හිඟය රුපියල් බිලියන 1757ක් වන අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.1ක්. 2026 රජයේ අය වැයෙන් අපේක්ෂා කරන ප්‍රධානම අරමුණ වසර කිහිපයකදී ආර්ථිකයේ සියයට 7ක තිරසර වර්ධනයක් ඇති කර ගැනීමත් එම වර්ධනයේ ප්‍රතිලාභ රටේ සියලු ම ජනතාවට බෙදී යන පරිදි ජනතා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයක් අනුගමනය කිරීමත්. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා 2026 රජයේ අය වැයෙහි

> වියදම් පියවා ගැනීම සඳහා රජය රුපියල් බිලියන 5300ක් බදු හා බදු නොවන ආදායම් මාර්ග වශයෙන් දක්වා තිබෙනවා. ඒ අනුව සමස්ත අය වැය හිඟය රුපියල් බිලියන 1757ක් වන අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.1ක්. 2026 රජයේ අය වැයෙන් අපේක්ෂා කරන ප්‍රධානම අරමුණ වසර කිහිපයකදී ආර්ථිකයේ සියයට 7ක තිරසර වර්ධනයක් ඇති කර ගැනීමත් එම වර්ධනයේ ප්‍රතිලාභ රටේ සියලු ම ජනතාවට බෙදී යන පරිදි ජනතා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයක් අනුගමනය කිරීමත්.

උපාය මාර්ගික ක්‍රම 37ක් සහ වියදම් යෝජනා 62ක් දක්වා තිබෙනවා.

මහාචාර්ය නාරද්ද ගමගේ "අය වැයක සාධනීය ලක්ෂණ පවතිනවා ද යන්න සොයා බැලීම සඳහා භාවිත කළ හැකි මිනුම් කිහිපයක් තිබෙනවා. ඉන් පළමුවැන්න අපේක්ෂිත ආදායම. අර්බුදයකට ලක් වූ ආර්ථිකයක රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15කට වඩා ඉහළ මට්ටමක පවත්වා ගත යුතු වෙනවා. එම ආදායම අත්පත් කර ගැනීම සඳහා සුදුසු වාතාවරණයක් රටේ තිබිය යුතුයි. දෙවැන්න ප්‍රාථමික ගිණුමේ ශේෂය අය වැය ලේඛනයක සාර්ථක බව මැනීම සඳහා භාවිත කළ හැකි යහපත් මිනුමක්. තුන් වැනි ව අය වැය පරතරය සාමාන්‍යයෙන් සියයට 5ක මට්ටමේ පවත්වා ගැනීමටයි ආර්ථික විශ්ලේෂකයන් නිර්දේශ කරන්නේ. අවසන් වශයෙන් රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීම හා සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා ඉදිරිපත් ව ඇති යෝජනා පිළිබඳ ව අවධානය යොමු කිරීම ද අය වැයක සාර්ථකත්වය පිළිබඳ සොයා බැලීමේ නිර්ණායකයක්. 2025 වර්ෂයේ අය වැය අත්දැකීම් හා 2026 වර්ෂයේ අය වැය පිළිබඳ ව මේ කරුණු ඔස්සේ අවධානය යොමු කරන විට පෙනී යන්නේ මෙවර අය වැය ලේඛනය තිරසර වූ ආර්ථික සංවර්ධනයකට අවශ්‍ය පදනම සකසා තිබෙන බවත්."

රාජ්‍ය ආදායම් සීමාව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15.4ක් වීම හා 2025 අය වැය අනුව අපේක්ෂිත ආදායම් අත්පත් කර ගැනීමට මේ වන විටත් රජය සමත් ව තිබීම නිසාත් සාර්ව ආර්ථික දර්ශක අනුවත් අපේක්ෂිත ආදායම 2026 වර්ෂයේදී ළඟා කර ගැනීමට රජයට හැකියාව ලැබෙනු ඇතැයි විශ්වාසය පළ කළ හැකියි. ප්‍රාථමික ගිණුම් ශේෂය ධන අගයක පවත්වා ගැනීම හා 2025 අය වැය ප්‍රාථමික අතිරික්තය ද අපේක්ෂිත තත්ත්වයට ඉහළ මට්ටමක් අත්පත් කර ගැනීමත් නිසා එය ද ධනාත්මක ව පවතිනු ඇති. අය වැය හිගය ද දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 5.1ක මට්ටමේ පවත්වා ගැනීමට මෙවර අය වැයෙන් සැලසුම් කර තිබෙනවා.

නිෂ්පාදනය පුළුල් කිරීම හා වර්ධනය තහවුරු කිරීම, වර්ධනය වන ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාව අතර බෙදී යාම තහවුරු කිරීම, අඛණ්ඩ වර්ධනය උදෙසා නැවත නැවතත් ආයෝජන අවස්ථා බිහි වීමට අවශ්‍ය පරිසරය සකස් වී තිබීම යනුවෙන් සංවර්ධන අයවැයකින් ප්‍රධාන වශයෙන් ම ආවරණය විය යුතු ක්ෂේත්‍ර 03ක් තිබෙනවා.

ඒ අනුව 2026 වර්ෂයේ අයවැයෙන් ආයෝජන අවස්ථා පුළුල් කිරීම හා ඒවාට ඇති බාධක ඉවත් කිරීම, ජනතාව අතර ආර්ථිකයේ ප්‍රතිලාභ

රාජ්‍ය ආදායම් සීමාව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15.4ක් වීම හා 2025 අය වැය අනුව අපේක්ෂිත ආදායම් අත්පත් කර ගැනීමට මේ වන විටත් රජය සමත් ව තිබීම නිසාත් සාර්ව ආර්ථික දර්ශක අනුවත් අපේක්ෂිත ආදායම 2026 වර්ෂයේදී ළඟා කර ගැනීමට රජයට හැකියාව ලැබෙනු ඇතැයි විශ්වාසය පළ කළ හැකියි. ප්‍රාථමික ගිණුම් ශේෂය ධන අගයක පවත්වා ගැනීම හා 2025 අය වැය ප්‍රාථමික අතිරික්තය ද අපේක්ෂිත තත්ත්වයට ඉහළ මට්ටමක් අත්පත් කර ගැනීමත් නිසා එය ද ධනාත්මක ව පවතිනු ඇති. අය වැය හිගය ද දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 5.1ක මට්ටමේ පවත්වා ගැනීමට මෙවර අය වැයෙන් සැලසුම් කර තිබෙනවා.

බෙදී යාම පිළිබඳ අවධානය යොමු කර තිබීම, රටේ ශ්‍රම බලකායේ සිදුවන වෙනස්කම් පිළිබඳ අවධානය යොමු කරමින් කාර්යක්ෂම ශ්‍රම භාවිතාවකින් ආර්ථිකයේ වර්ධනය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සැලසුම් කිරීම ආදිය කෙරෙහි අවධානය යොමු කර තිබෙනවා. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ වයස්ගත වෙන ජනගහනය පිළිබඳ අවධානය යොමු කරමින් ආර්ථික වර්ධනයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා වන නිර්දේශ ලබා ගැනීම අත්‍යාවශ්‍ය හා කඩිනමින් අවධානය යොමු කළ යුතු කාරණයක්. ශ්‍රමබලකාය සඳහා කාන්තා දායකත්වය ඉහළ නංවා ගැනීමත් වැදගත්. විදේශ සෘජු ආයෝජන, අපනයන විවිධාංගිකරණය, සංචාරක කර්මාන්තය, ආර්ථිකය ඩිජිටල්කරණය, රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, විෂ මත්ද්‍රව්‍ය භාවිතය පිටු දැකීම, වංචාව හා දූෂණය අවම කිරීම, ණය තිරසරභාවය සහතික කිරීම සහ ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම යනාදී වශයෙන් පුළුල් වූ ක්ෂේත්‍ර රාශියක 2026 අය වැය අරමුණු ස්පර්ශ කිරීමට යෝජනා වී තිබෙනවා.

මේ හැර සමාජ සුභ සාධනය, වතු කම්කරුවන්ගේ ජීවන තත්ත්වය ඉහළ දැමීම සඳහා නිවාස සැපයීම හා වතු කම්කරුවන්ගේ වැටුප් ඉහළ දැමීම, ඉහළ නංවන ලද රාජ්‍ය සේවක වැටුප් හා රාජ්‍ය සේවකයන් සඳහා වන ණය හා අත්තිකාරම් පහසුකම්, රාජ්‍ය සේවය සඳහා නව බඳවා ගැනීම් ආදී සුභ සාධන කාර්ය රාශියක් පිළිබඳ ව ද මෙවර අය වැයෙන් අවධානය යොමු කර තිබෙනවා. අධ්‍යාපනය, සාහිත්‍ය හා කලාව, ක්‍රීඩා ක්ෂේත්‍රය, ප්‍රවාහනය, තොරතුරු තාක්ෂණය ආදී ක්ෂේත්‍ර කුසලතා පූර්ණ ජනතාවක් බිහි කිරීමෙන් රටේ සංවර්ධනයේ යහ පැවැත්ම තහවුරු කිරීම සඳහා දායකත්වය සපයා තිබීම සුවිශේෂයි.

විශේෂයෙන් සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීමේ ඇති විය හැකි ප්‍රමාද වළක්වා ගැනීමත් අපේක්ෂිත වියදම් නිසි කාලවකවානුවේදී සිදු කිරීමත් පවතින අභියෝගයක් වන අතර ඒ සඳහා නිසි කලට ක්‍රියාත්මක වීම රාජ්‍ය ආයතන හා නිලධාරීන්ගේ වගකීමක්.




# සකුරා දේශයේ සුපිපි මල

**නිහාල් පීරිස්**

ජපාන ජාතික 'සනායේ තකායිචි' (Sanae Takaichi) පසුගිය දිනවල ලෝක දේශපාලන කරළියේ වැඩි අවධානයක් දිනාගත් චරිතයක්. ඇය ජපාන ඉතිහාසයේ වෙන කිසිදු කාන්තාවකට කළ නොහැකි වූ දස්කමක් දක්වීමට සමත් වුණා. 2025 ඔක්තෝබර් 21 දින ජපානයේ අගමැති ධුරයට සනායේ පත් වුයේ කාන්තාවක ජපානයේ අගමැති ධුරයට පත් වූ පළමු අවස්ථාව සනිටුහන් කරමින්.

ජපානයේ පළමු වරට අගමැතිවරයකු පත් වූයේ 1885 වසරේ. ඔහු ඉතෝ හිරොබුමි (**Itō Hirobumi**). එදාමෙදාතුර ගත වී ඇති වසර 145ක කාලයේ ජපානයේ අගමැති පදවියට පත් සියලු දෙනා පිරිමින්.

64 හැවිරිදි සනායේ තරුණ කාලයේ එක්තරා සංගීත කණ්ඩායමක ඩ්‍රම්ස් සහ ගිටාර් වාදන ශිල්පිනියක ව සිට ඇති බව මාධ්‍ය අනාවරණය කරනවා. ඇය සංගීත වාදනයට මොනතරම් කැමැත්තක් දක්වනවාද යත් පාර්ලිමේන්තුව ආශ්‍රිත ව ඇති ඇගේ නිවසේ ද ඩ්‍රම්ස් කට්ටලයක් ඇති බව සඳහන්. මානසික වෙහෙස නැති කර ගැනීම සඳහා ඇය එය වාදනය කරන බවයි පැවසෙන්නේ. 1990 ගණන්වල ඇය තවත් අපූරු වෘත්තියක නිරත ව තිබුණා. ඒ, රූපවාහිනී නිවේදිකාවක වශයෙන්. සනායේ ශාස්ත්‍රීය පොතපත ද ලියා තිබෙනවා. මේ අනුව ඇය විවිධ ඉසව්වල සිය කුසලතා පෙන්වා ඇති සුවිශේෂ චරිතයක්.

සනායේ විවාහ වී සිටින්නේ ද දේශපාලනඥයකු සමඟ. තාකු යමාමොටෝ (Taku Yamamoto) නමැති ඔහු කලක් ජපාන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු ලෙස ක්‍රියා කළා. ඔවුන් දෙදෙනා මුලින් ම විවාහ වූයේ 2004 වසරේ. එහෙත් 2017 වසරේ ඔවුන් දික්කසාද වුණා. එහිදී සනායේ පවසා තිබුණේ තමන් දෙදෙනාගේ දේශපාලන අදහස් සහ අරමුණු අතර ඇති වෙනස්කම් නිසා මේ ආකාරයෙන් දික්කසාද වන බව. එහෙත් ඔවුන්ට වැඩි කාලයක් මෙසේ වෙන් වී සිටීමට හැකි වී නැහැ. 2021 වසරේ සනායේ සහ තාකු නැවතත් විවාහ දිවියට එළඹුණා.

මේ වනවිට ඇයගේ සැමියා සිටින්නේ අසනීපයෙන්. ඔහුට පුරස්ථි ග්‍රන්ථි පිළිකාවක් වැළඳී ඇති බව 2024 වසරේ සොයාගෙන තිබුණා. මේ අතර මාස කිහිපයකට පෙර ඇති වූ ආඝාත තත්ත්වයක් නිසා ඔහුගේ සිරුරේ දකුණු අංශය අප්‍රාණික ව ඇති බවක් ද

සඳහන්. විවිධ අභියෝග මැදින් ජීවිතයේ ඉදිරියට ආ සනායේට දැන් තිබෙන්නේ රට හමුවේ මෙන් ම ඇගේ පක්ෂය හමුවේ ද ඇති අභියෝග ජය ගැනීමේ අභියෝගය.

පසුගිය වසර 5ක කාලයේ ජපානයේ අගමැතිවරුන් සිව් දෙනෙකු මාරු වී තිබෙනවා. සනායේට කලින් අගමැති ධුරය දැරූ ෂිගේරු ඉෂිබා (Shigeru Ishiba) එම ධුරයේ සිටියේ වසරක් වැනි කෙටි කාලයක්. රටේ සහ ආණ්ඩු පක්ෂය වන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ පවතින අස්ථාවර තත්ත්වයයි මෙයින් මොනවට පැහැදිලි වන්නේ.

ජපානය ආර්ථික වශයෙන් ද බොහෝ අභියෝගවලට මුහුණ දී සිටින රටක්. විශ්ලේෂකයන් පෙන්වා දෙන ආකාරයට ජපානයේ ආර්ථික වර්ධනය බොහෝදුරට මන්දගාමී වී ඇත්තේ කාලයක සිට ම එරට උපත් අනුපාතය පහත වැටෙමින් තිබීම නිසා. එබැවින් ජපානයේ නිෂ්පාදන ක්‍රියාවලියට දායක විය හැකි තරුණ ජනගහනයේ දක්නට ලැබෙන්නේ අඩුවීමක්. එරට මහලු ජනගහනය වැඩි වීම ද ආර්ථිකයට අමතර බරක් එක් කර තිබෙන්නේ ඔවුන් රැකබලා ගැනීම සඳහා දරන්නට වන වියදම් ද ඉහළ යමින් පවතින නිසා. ජපානය යනු ඉතා දීර්ඝායුෂ භුක්ති විඳින උදවිය වැඩි ම රටක් බව නොරහසක්.

රටේ ආර්ථික වර්ධනය අඩාල වීම සහ රාජ්‍ය වියදම් ඉහළ යාම මත මේ වනවිට රාජ්‍ය ණය ප්‍රමාණය ද ඉහළ යමින් තිබෙනවා. ජපානය දියුණු රටවල් අතර වැඩි ම රාජ්‍ය ණය ප්‍රමාණයක් ඇති රටක් ලෙසයි සැලකෙන්නේ. එහි රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 235ක් පමණ වන බව සඳහන්. ඉහළ යන ජීවන වියදම නිසා ජනතාව දැඩි පීඩාවට පත් ව සිටීම ද එරට තවත් බරපතළ ප්‍රශ්නයක්. ජීවන වියදම් වැඩිවන ප්‍රමාණයට සාපේක්ෂ ව වැටුප් වැඩි නොවීම නිසා ජනතාව මහත් අපහසුතාවට පත් ව තිබෙනවා. මේ තත්ත්වය මත භාණ්ඩ සහ සේවා සඳහා වන ඉල්ලුම අඩුවෙමින් ඇති

ජපානය ආර්ථික වශයෙන් ද බොහෝ අභියෝගවලට මුහුණ දී සිටින රටක්. විශ්ලේෂකයන් පෙන්වා දෙන ආකාරයට ජපානයේ ආර්ථික වර්ධනය බොහෝදුරට මන්දගාමී වී ඇත්තේ කාලයක සිට ම එරට උපත් අනුපාතය පහත වැටෙමින් තිබීම නිසා. එබැවින් ජපානයේ නිෂ්පාදන ක්‍රියාවලියට දායක විය හැකි තරුණ ජනගහනයේ දක්නට ලැබෙන්නේ අඩුවීමක්. එරට මහලු ජනගහනය වැඩි වීම ද ආර්ථිකයට අමතර බරක් එක් කර තිබෙන්නේ ඔවුන් රැකබලා ගැනීම සඳහා දරන්නට වන වියදම් ද ඉහළ යමින් පවතින නිසා. ජපානය යනු ඉතා දීර්ඝායුෂ භුක්ති විඳින උදවිය වැඩි ම රටක් බව නොරහසක්.



සනායේ තකායිචි

අතර එය එරට ව්‍යාපාර ආදියට බලපාන්නේ අවාසිසහගත ලෙස. ජපානයේ අපනයන සඳහා වන ඉල්ලුම අඩු වෙමින් තිබීම ද රටේ ආර්ථික ගැටලු තීව්‍ර කිරීමට හේතු වී තිබෙනවා.

ජපාන ඉතිහාසයේ පළමු කාන්තා අගමැතිනියට දැන් භාර වී ඇත්තේ මෙවැනි රටක්. රටේ ප්‍රශ්න විසඳනවාට අමතර ව සනායේට ඇයගේ පක්ෂය වන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ද ගොඩ ගැනීමට සිදු වී තිබෙනවා. පසුගිය වසර 70කට ආසන්න කාලයක් ජපානය පාලනය කළේ මේ පක්ෂය. කෙසේ වෙතත් මේ වනවිට එහි ජනප්‍රියත්වය බෙහෙවින් පිරිහී තිබෙනවා. සනායේට කලින් එහි නායකත්වය සහ අගමැති ධුරය දැරූ ෂිගේරු ඉෂිබාට එම ධුරවලින් ඉල්ලා අස්වීමට සිදු වූයේ ද එම තත්ත්වය හේතුවෙන්. සනායේ එම තනතුරුවලට පත් වූයේ ඉෂිබා ඉල්ලා අස්වීමෙන් පසුව.

ඉෂිබාගේ නායකත්වය යටතේ පක්ෂය මුහුණ දුන් මැතිවරණ දෙකකින් ම එය විශාල පසුබෑමකට ලක් වුණා. වසර 15කට පමණ පසු පළමු වතාවට එම පක්ෂයට ජපාන පාර්ලිමේන්තුවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ බහුතරය ද අහිමි වී තිබෙනවා. පක්ෂයේ ඇතැම් අයට එරෙහි ව මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ චෝදනා එල්ලවීමත් පක්ෂය කෙරේ ජනතාවගේ විශ්වාසය බිඳ වැටීමට ප්‍රබල හේතුවක්.

2028 වසරේ ජපානයේ මීළඟ මහා මැතිවරණය පැවැත්වීමට නියමිත ව තිබෙනවා. එහිදී තවදුරටත් පසුබෑමට ලක්වීමෙන් බේරීමටනම් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය කෙරේ ජනතා ආකර්ෂණය නැවත දිනා ගත හැකි වැඩපිළිවෙළක් දියත් කිරීමට සිදුවීම අනිවාර්ය කරුණක්. මේ වගකීම ද දැන් පැටවී ඇත්තේ නව අගමැතිනිය මෙන් ම පක්ෂ නායිකාව ද වන සනායේගේ කරපිට.

# සැමටම ධනවාදය

## -Paz-

**ඩබ්ලිව්. එම්. ශාන්තප්‍රිය**



දක්ෂිණාංශික ප්‍රතිසංස්කරණවාදියෙකු ලෙස සැලකෙන සෙනෙට් සභික රොඩ්රිගෝ පාස් පෙරෙයිරා (Rodrigo Paz Pereira) 2025 අගෝස්තු මහ මැතිවරණයෙන් බොලීවියාවේ නව ජනාධිපතිවරයා ලෙස පත් වුණා. ඒ, මාස් (MAS) පක්ෂයේ (සමාජවාදය සඳහා වූ පක්ෂය) දශක දෙකකට ආසන්න පාලනය අවසන් කරමින්. මහ මැතිවරණයේ ජනාධිපති තෝරාපත් කර ගැනීමේ පළමු වටයේදී මුළු ඡන්ද ප්‍රමාණයෙන් 32.06%ක් ලබාගන්නා පාස් දෙවැනි වටයේ ඡන්ද විමසීමේදී ඡන්ද 54.96%ක් ලබා ගත්තා. 1989 සිට 1993 වර්ෂය දක්වා බොලීවියාව පාලනය කළ ජේම් පාස් සැමෝරාගේ පුත්‍රයා වන රොඩ්රිගෝ පාස් දශක දෙකකට වැඩි කාලයක් නීති සම්පාදකයෙකු හා නගරාධිපතිවරයෙකු ලෙස දේශපාලනයට සම්බන්ධ වී සිටියා. පාස්ගේ මැතිවරණයේ සටන් පාඨය වූයේ 'සැමට ධනවාදය' යන්න.

ලතින් ඇමරිකානු රටක් වන බොලීවියාවේ විශාලත්වය වර්ග කිලෝ මීටර මිලියන 1.044ක්. ජනගහනය මිලියන 12.41ක් ඉක්මවන අතර වැඩි දෙනෙකුගේ භාෂාව වන්නේ ස්පාඤ්ඤ භාෂාව. ප්‍රධාන ආගම ක්‍රිස්තියානි ආගම. ලොව විශාලතම ලිතියම් නිධිය පවතින්නේ ද බොලීවියාවේ.

වාමාංශික ජනතාවාදය නිතර ගලා යන කලාපයක් වන ලතින් ඇමරිකාවේ රටවල් රැසක ම වාමාංශික ආණ්ඩු බිහි වුණා. බොලීවියාව ද ඉන් එක් රටක්. බොලීවියාව ගැන කතා කරන විට ඊවෝ මොරාලෙස් (Evo Morales) කිසිවිටෙකත් අමතක කළ නොහැකියි. ඒ, මාස් පක්ෂයේ දශක දෙකකට ආසන්න පාලනයෙන් වසර 14කට ආසන්න කාලයක් එරට පාලනය කළේ මොරාලෙස්. 2006 සිට 2019 වර්ෂය දක්වා පැවැති මොරාලෙස්ගේ පාලන කාලයේ ශක්තිමත් ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමට හැකි වූ අතර සමාජ අසමානතාව අඩුකර ගැනීමට ද හැකි වුණා. බලශක්ති සම්පත් ජන සතු කිරීම සිදුවන්නේ ද ඊවෝ මොරාලෙස්ගේ පාලන කාලයේ. කෙසේ වුවත් මොරාලෙස්ගේ දෙවැනි පාලන සමයේ අවසාන භාගය වන විට රටේ ආර්ථික තත්ත්වයේ ඇති වුණේ යම් පිරිහීමක්. එයට ප්‍රධාන වශයෙන් බලපෑවේ ලෝක වෙළෙඳ පොළේ පෙට්‍රෝලියම් හා ස්වාභාවික ගෑස් මිල පහළ යාම. බොලීවියන් මූලික ව ආර්ථිකය රඳා පැවතියේ ස්වාභාවික ගෑස් මත වීම නිසා එහි මිල පහළ යාම ප්‍රබල ව දැනුණා. ආර්ථිකයේ ඇති වූ මේ අර්බුදය හේතුවෙන් මොරාලෙස් පාලනය කෙරෙහි ජනතා කලකිරීමක් වැඩෙන්නට වූ අතර දක්ෂිණාංශික බලවේග මතුවන තත්ත්වයක් පෙන්නුම් කළා. 2019 මහ මැතිවරණය පැවැත්වෙන්නේ මෙවැනි පසුබිමක (බොලීවියාවේ ජනාධිපති තෝරන්නේ ද මහ මැතිවරණයෙන්).

පැවති මැතිවරණ නීති අනුව මොරාලෙස්ට නැවත ජනාධිපති ධුරය සඳහා ඉදිරිපත් විය නොහැකි වුවත් ජනමත විචාරණයකින් ඒ වාරණය ඉවත් කර ගැනීමට මොරාලෙස් ජනමත විචාරණයක් පවත්වනවා. එහෙත් ජනමත විචාරණයෙන් 51-49 වශයෙන් මොරාලෙස් පරදිනවා. ජනමත තීන්දුවට එරෙහි ව ව්‍යවස්ථා අධිකරණයට යන මොරාලෙස් ඉන් ජය ගන්නා අතර ශ්‍රේෂ්ඨාධිකරණය ද එම තීන්දුව අනුමත කිරීමෙන් මොරාලෙස්ට සිව් වැනි වරටත් ජනාධිපති ධුරයට ඉදිරිපත් වීමට ඉඩ සැලසුණා. ඒ අනුව 2019 පැවති මහ මැතිවරණයේදී මොරාලෙස් ජනාධිපති ධුරය සඳහා ඉදිරිපත් වෙනවා. එහෙත් ඒ වන විට මොරලෙස්ට එරෙහි ව තරමක ජනමතයක් ගොඩ නැගෙමින් තිබුණා. මැතිවරණයෙන් මොරාලෙස් ජයග්‍රහණය කළ බව ප්‍රකාශයට පත් කෙරුණ ද එය ප්‍රශ්නකාරී වුණා. බොලීවියාවේ මැතිවරණ නීතියට අනුව පළමු වටයෙන් ම ජය ගැනීමටනම් පළමු තැනට පත් වන්නා වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 50%කට වැඩියෙන් හෝ 50% අඩුනම් දෙවැන්නාට වඩා 10%කට වැඩි ඡන්ද සංඛ්‍යාවක් සහිත ව අවම වශයෙන් 40%ක් හෝ ලබා ගත යුතුයි. ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළේ 80% ක් පමණ ඡන්ද ගණන් කිරීමෙන් පසු

ගණන් කිරීම නවතා පැය කිහිපයකට පසුව. ප්‍රතිඵලය වුණේ මොරාලෙස්ට 47.08%ක් ද ප්‍රතිවාදී ප්‍රධාන අපේක්ෂකයා වූ කාලෝස් මෙසාට 36.51%ක් ද වශයෙන්. ඒ අනුව දෙවැනි වටයකට යාම අවශ්‍ය වුණේ නැහැ. එහෙත් මෙහිදී මොරාලෙස්ට වාසිදායක ලෙස ඡන්ද මගඩියක් වූ බවට සැක සංකා මතු වූ නිසා ප්‍රතිඵලයට එරෙහි ව විරෝධතා නැගෙන්නට වුණා. විරුද්ධ පක්ෂය පමණක් නොව මධ්‍යස්ථ බලවේග ද විරෝධතා නගන්නට වූයේ ඡන්දයේ දෙවැනි වටයකට යා යුතු බවට ඉල්ලමින්.

කෙසේ වුවත් හමුදාව හා පොලිසිය ද බොලීවියානු කම්කරු මධ්‍යස්ථානය ද (බොලීවියානු කම්කරු මධ්‍යස්ථානය බොලීයාවේ ප්‍රධාන වෘත්තීය සමිති මධ්‍යස්ථානය වන අතර එහි සාමාජිකත්වය 20 ලක්ෂයකට වැඩියි) මොරාලෙස්ට ඉල්ලා අස්වන ලෙස කියා සිටියා. තත්ත්වය උත්සන්න වන විට මෙක්සිකෝව මොරාලෙස්ට දේශපාලන රැකවරණය ලබා දීමට ඉදිරිපත් වූ අතර ඔහු ඉල්ලා අස්වී මෙක්සිකෝවට ගියා.

අනතුරු ව පාර්ලිමේන්තුව විසින් විරුද්ධ පාක්ෂික සෙනෙට් සභිකාවක් වූ ජෙනී ආනියස් වැඩ බලන ජනාධිපති වශයෙන් පත් කරනු ලැබුවා. 2019 මැතිවරණ ප්‍රතිඵලය අවලංගු කර නව මහ මැතිවරණයක් පැවැත්වීමට පාර්ලිමේන්තුවට ගෙනෙන ලද යෝජනාවට මාස් පක්ෂයේ මන්ත්‍රීවරුන් ද සහය පළ කළ හෙයින් එය අනුමත වූ අතර අලුතෙන් පනවන ලද නීතියකින් මොරාලෙස්ට නැවත ජනාධිපති ධුරයට ඉදිරිපත් වීමේ වරම අහිමි වුණා. 2020 ඔක්තෝබර් මැතිවරණයට මාස් පක්ෂයෙන් ඉදිරිපත් කළේ මොරාලෙස් පාලනයේ මුදල් ඇමතිවරයා වූ ලුවී ආර්සි. මොරාලෙස් මෙක්සිකෝවේ සිට මැතිවරණ සටන මෙහෙය වූවා. මැතිවරණයෙන් ලුවී ආර්සි ඡන්ද 55%ක් ජයග්‍රහණය කළ අතර මොරාලෙස් ආපසු බොලීවියාවට පැමිණියා.

එහෙත් පක්ෂයේ අධිකාරය සම්බන්ධයෙන් ප්‍රධාන නායකයන් තිදෙනා වූ මොරාලෙස්, ලුවී ආර්සි හා ඇන්ඩ්‍රොනිකෝ රොඩ්‍රිගෙස් අතර මතභේද පැන නැගුණා. පක්ෂයේ ඇති වූ ගැටුම් හේතුකොටගෙන රටේ පාලනය අස්ථාවර වූ අතර දේශපාලන හා ආර්ථික වියවුල්තාවක් හට ගත්තා.

මොරාලෙස් පාක්ෂිකයන් හා ආර්සි ආධාරකරුවන් අතර බරපතළ ගැටුම් ඇවිළී ගිය අතර මොරාලෙස් හා ආර්සි එකිනෙකාට චෝදනා කර ගත්තේ එකිනෙකා ඝාතනය කරන්නට කුමන්ත්‍රණය කළ බවට. පක්ෂයේ පැන නැගි සමහන් කළ නොහැකි ගැටුම් හේතුකොටගෙන 2025 වර්ෂය වන විට පක්ෂය ඉතා දුර්වල වුණා.

මෙහි එක් ප්‍රතිඵලයක් වූයේ ඇන්ඩ්‍රොනිකෝ රොඩ්‍රිගෙස් පක්ෂයෙන් ඉල්ලා අස්වී 2025 මැතිවරණයේදී වෙන ම අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වීම. මැතිවරණයේ පළමු වටයේදී 8.5%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගැනීමට ඔහු සමත් වන අතර මාස් පක්ෂයෙන් ඉදිරිපත් වූ අපේක්ෂකයා වූ එඩුවාඩෝ ඩෙල් කැස්ටිලෝට ලබා ගත හැකි වූයේ 3.17%ක ඡන්ද සංඛ්‍යාවක් පමණයි. එහි ප්‍රතිඵලය වූයේ මැතිවරණයේ පළමු වටයෙන් ම දෙදෙනාට ම ඉවත්වීමට සිදු වීම.

පාලන පක්ෂයේ හටගත් බරපතළ ගැටුම් නිසා රටේ පාලනය අස්ථාවර වූ අතර දේශපාලන හා ආර්ථික වියවුල් හටගත්තා. විදේශ විනිමය සංචිත පිරිහෙන්නට වුණා. උද්ධමනය ශීඝ්‍ර ව වැඩී ගිය අතර ඉන්ධන පෝලිම්වල පැය ගණන් රස්තියාදු වන්නට ජනතාවට සිදුවුණා. විදේශ සංචිත පිරිහුණා. ස්වාභාවික ගෑස් අපනයනය කඩා වැටුණා. මේ වැටෙන ආර්ථික අර්බුදයට චෝදනාව එල්ල වූයේ ජනාධිපති ලුවී ආර්සිට.

මේ ආර්ථික අර්බුදයත් පක්ෂයේ මොරාලෙස් හා ආර්සි ආධාරකරුවන් අතර ඇවිළී ගිය බරපතළ ගැටුම් නිසාත් මාස් පාක්ෂිකයන් සැලකිය යුතු පිරිසක් දක්ෂිණාංශික අපේක්ෂක රොඩ්‍රිගෝ පාස් පෙරෙයිරා පිලට එක්වුණා. එහි ප්‍රතිඵලය වූයේ 2025 ජනාධිපතිවරණයේදී මාස් පක්ෂ අපේක්ෂකයා වූ ලුවී ආර්සි 55%ක ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත්තත් 2025 ජනාධිපතිවරණයේදී මාස් පක්ෂයෙන් ඉදිරිපත් වූ එඩුවාඩෝ කැස්ටිලෝට 5%කවත් ඡන්ද සංඛ්‍යාවක් ලබා ගැනීමට නොහැකිවීම. මෙවැනි තත්ත්වයකයි පාස් ජනාධිපතිවරයා ලෙස පත්වන්නේ.

දැනට රටේ මතු වී ඇති ආර්ථික අර්බුදය හමුවේ උද්ධමනය පාලනය, විදේශ සංචිත ස්ථාවර කිරීම, දෛනික ජීවිතයට බලපෑම් එල්ල කරන තෙල් හිඟය නැති කිරීම වැනි කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට ජනාධිපති පාස්ට සිදු වී තිබෙනවා. දැනටමත් ජනාධිපති පාස් ඇන්ඩියන් සංවර්ධන සංස්ථාව සමග ඩොලර් බිලියන 3.1ක ණයක් සඳහා ගිවිසුමකට එළඹී තිබෙනවා.

ආර්ථික ස්ථාවරත්වය ඇති කරන අතර ම සමාජ වැඩසටහන් ද පවත්වාගෙන යාමට පාස් පොරොන්දු වී ඇතත් මේ කාර්ය දෙක ම එකවර කළ නොහැකි බවයි ආර්ථික විද්‍යාඥයන්ගේ මතය.

පාස්ගේ ක්‍රිස්තියානු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට ව්‍යවස්ථාදායක සභාවේ ආසන 116න් 39%ක පමණක් බලයක් පවතින හෙයින් ඔහුට පාලනය ඉදිරියට ගෙන යාම සඳහා වෙනත් දේශපාලන කණ්ඩායම් සමග ශක්තිමත් සන්ධානයක් ගොඩනැගීමට සිදුවනු ඇති.



# ලෝක සැරිසර

**සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි**



## ගාසා සාමයේ උදාව

වසර දෙකක් තිස්සේ ඇදී ගිය ඊශ්‍රායල-පලස්තීන භීෂණාත්මක යුද්ධයේ යම් සංහිඳියාවකට ඔක්තෝම්බර් මස මුලභාගයේ එළැඹීමට මඟ පෑදුණා. ඒ, ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ගාසා සාම සැලැස්මේ පළමු අදියරේ කොටසක් ලෙස සටන් විරාමයක් ඇරඹීමත් සමඟ.

ඒ අනුව හමාස් සංවිධානය විසින් පැහැර ගනු ලැබ වසර දෙකක් තුගත උමං තුළ රඳවා සිටි ඊශ්‍රායල ප්‍රාණ ඇපකරුවන් ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය මාර්ගයෙන් ඊශ්‍රායල හමුදා භාරයට පත් කළා. ඊශ්‍රායල බන්ධනාගාරවල ජීවිතාන්තය දක්වා සිර දඬුවම් විඳිමින් සිටින පලස්තීන සිරකරුවන් 250 දෙනෙකු සහ ගාසා තීරයේ රැඳවියන් 1,700 දෙනෙකු නිදහස් කිරීම ද සිදුවුණා. ඔවුන් අතර බාලවයස්කරුවන් 15ක් සිටියා. ජාත්‍යන්තර මාධ්‍ය ඔස්සේ දක්නට ලැබුණේ එම නිදහස් කරන ලද පලස්තීන සිරකරුවන් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් විසින් පිළිගනු ලබන ආකාරයේ අනුවේදනීය රූප රාමු.

එහෙත් හමාස් සංවිධානය ඉල්ලා සිටි මාර්වාන් බර්ගවුටි සහ අහමඩ් සාදත් ඇතුළු ඊශ්‍රායල ජාතිකයන්ට එරෙහි ව මාරාන්තික ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් ජීවිතාන්තය දක්වා සිර දඬුවම් විඳිමින් සිටින ඉහළ පෙළේ රැඳවියන් මේ සිරකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වුණේ නැහැ.

ප්‍රාණ ඇපකරුවන් සහ සිරකරුවන් හුවමාරු කර ගැනීමෙන් අනතුරු ව ඊශ්‍රායලය වෙත ගොස් සිටි ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ඊශ්‍රායල පාර්ලිමේන්තුව ඇමතුවා. ඒ, 2008 වසරෙන් පසු ඇමරිකානු ජනාධිපතිවරයෙකු විසින් ඊශ්‍රායල පාර්ලිමේන්තුව අමතන ලද පළමු අවස්ථාව සනිටුහන් කරමින්. එහිදී ඩොනල්ඩ් ට්‍රම්ප් පැවසුවේ "දිගු හා වේදනාකාරී බියකරු සිහිනය අවසානයේ හමාරයි" යනුවෙන්. මේ දිනය මැදපෙරදිග "සියල්ල වෙනස් වීමට පටන් ගත් මොහොත සහ බොහෝ සෙයින් යහපත් අතට හැරෙන මොහොත" සනිටුහන් කරන බව ද එහිදී ඔහු කියා තිබුණා. ප්‍රාණ ඇපකරුවන් නිදහස් කිරීමට පෙර ඊශ්‍රායල හමුදා පසු බැස්සේ ඔවුන් එහි 53%ක පමණ භූමි ප්‍රදේශයකට සිය පාලනය සීමා කර ගනිමින්.

කරුණු 20කින් යුත් ට්‍රම්ප් සැලැස්ම අනුව දෙපාර්ශ්වය ම එකඟ වුවහොත් යුද්ධය 'වහා අවසන් වනු' නියත බවයි ප්‍රකාශ වුණේ. ගාසාව හමුදාකරණයෙන් නිදහස් කරන බවටත් සියලු 'මිලිටරි, ත්‍රස්ත සහ ප්‍රහාරාත්මක යටිතල පහසුකම්' විනාශ කරන බවටත් එහි සඳහන් ව තිබුණා.

එහෙත් ඔක්තෝබරය අවසන් වන විට හුවමාරු කළ පිරිස අතරට මියගිය ප්‍රාණ ඇපකරුවන්ගේ බව කියන සිරුරු කිහිපයක කොටස් ලබා දීමත් සමග හමාස් සංවිධානය එක්සත් ජනපදය මැදිහත් ව ඇරඹූ සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කළ බවට චෝදනා කරමින් ගාසා තීරයට නැවත ඊශ්‍රායලය ප්‍රහාර ඇරැඹුවා.

වාර්තා අනුව ගාසා තීරයේදී ප්‍රාණ ඇපකරුවන් 83 දෙනෙකු මරා දමා ඇති අතර දිවි ගලවා ගත් ප්‍රාණ ඇපකරුවන් 168 දෙනෙකු ආපසු ලබා දෙන ලද බවත් 2025 ඔක්තෝබර් 29 වන විට ප්‍රාණ ඇපකරුවන් 13 දෙනෙකු ගාසා තීරයේ සිටින බවත් වාර්තා වුණා. 2023 ඔක්තෝබර් 22 දින ප්‍රකාශයට පත් ව තිබුණේ ප්‍රාණ ඇපකරුවන් 204 දෙනෙකුගේ ලැයිස්තුවක්.

## නොබෙල් සාම තෑග්ග මාරියාට

ඇල්ෆ්‍රඩ් නොබෙල්ගේ කැමැත්ත පරිදි පිහිටුවන ලද ජාත්‍යන්තර සාම ත්‍යාගයක් වන නොබෙල් සාම ත්‍යාගය මෙවර හිමි වූයේ වෙනිසියුලාවට. 2025 ඔක්තෝබර් 10 දින එය පිරිනැමුණේ වෙනිසියුලාවේ මාරියා කොරිනා මචාඩෝ (María Corina Machado) වෙත. නෝර්වීජියානු නොබෙල් කමිටුව ඇය ප්‍රශංසාත්මක ව හඳුන්වා දී තිබුණේ "මෑත කාලයේ ලතින් ඇමරිකාවේ මතු වූ සිවිල් ධෛර්යයේ වඩාත් ම අසාමාන්‍ය උදාහරණවලින් එකක්" ලෙස.

ත්‍යාගය ප්‍රකාශයට පත් කරන අවස්ථාවේ ඇය සිටියේ නිකොලස් මදුරෝගේ රජයේ මර්දනයට බියෙන් වෙනිසියුලාවේ සැඟවී. 1980 වසරේදී ජීන් ඩවුසෙට් සහ ජෝර්ජ් ඩේවිස් ස්නෙල් සමග කායික විද්‍යාව හෝ වෛද්‍ය විද්‍යාව හෝ පිළිබඳ නොබෙල් ත්‍යාගය බෙදා ගත් බාරුජ් බෙනසෙරාෆ්ට පසුව නොබෙල් ත්‍යාගයක් ලැබූ දෙවැනි වෙනිසියුලානු ජාතිකයා ඇය.




## මැඩගස්කරයේ Gen-Z විරෝධතාව

මැඩගස්කරයේ තරුණ තරුණියන් ආරම්භ කළ දැවැන්ත විරෝධතාව සහ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් රජය විසුරුවා හැරීමට එරට ජනාධිපති ඇන්ඩ්‍රි රජොලිනාට (**Andry Rajoelina**) සිදුවුණා. එවැනි පසුබිමක බලය අල්ලා ගත් මැඩගස්කරයේ හමුද කුමන්ත්‍රණ නායක කර්නල් මයිකල් රැන්ඩ්‍රියනිරිනා (**Colonel Michael Randrianirina**), හිටපු ජනාධිපතිවරයා රටින් නෙරපා හැරීමෙන් පසු එරට ජනාධිපති ධුරයට පත් වූ අතර ඔහු විසින් නව අගමැතිවරයෙකු පත් කරන ලැබුවා. ජනාධිපති රැන්ඩ්‍රියනිරිනා ප්‍රකාශ කළේ ඔහුගේ අත්දැකීම් සහ වැඩ කරන ජාත්‍යන්තර සංවිධාන සමග

ඇති සම්බන්ධතා නිසා ව්‍යාපාරික හෙරින්ට්සලාමා රාජොනරිවෙලෝ (**Herintsalama Andriamiasy Rajaonarivelo)** නව අගමැති ලෙස තෝරා ගත් බව.

නැගෙනහිර අප්‍රිකානු රාජ්‍යයක් වන මැඩගස්කරයේ තරුණයන්ගේ මේ විරෝධතා ලොව පුරා Gen-Z මූලික මහජන සේවාවන් සහ මූලික අයිතිවාසිකම් ඉල්ලා සංවිධානය වන ආකාරය පිළිබඳ වඩාත් ම කැපී පෙනෙන නිරූපණයක්. රජයට එරෙහි මේ විරෝධතාවට දිගුකාලීන ජල විදුලි කප්පාදුව මූලිකත්වය ගෙන තිබුණා. Antananarivo අගනුවරින් ආරම්භ වූ විරෝධතාව පසුව රට පුරා තවත් නගර කරා ව්‍යාප්ත වූ අතර පසුව හමුදා සහාය ද ලැබීමෙන් මැඩගස්කරයේ බලය මිලිටරීකරණයට ලක් ව තිබෙනවා.




## ලූවර් ආභරණ කොල්ලය

ලොව වැඩි ම සංචාරක පිරිසක් පැමිණෙන ප්‍රංශයේ පැරිස් නුවර පිහිටි ලූවර් කෞතුකාගාරය කොල්ලයකට ලක්වුණා. මහ දවාලේ වෙස්මුහුණු පැළඳගත් සොරුන් සිව්දෙනෙකු එහි දෙවැනි මහලින් ඇපලෝ ගැලරියට කඩා වැදී එහි තිබුණු මිල කළ නොහැකි රාජකීය ආභරණ අටක් රැගෙන පලා ගොස් තිබුණේ ස්කූටර්වලින්. සොරකම් කළ භාණ්ඩ වටිනාකම ඩොලර් මිලියන 102ක්. මෙය, 1998 වසරේදී 'Le chemin de Sèvres' සිතුවම සොරකම් කිරීමෙන් පසු ලූවර් කෞතුකාගාරයේ සිදු වූ පළමු කලා සොරකම.



## බ්‍රසීලයේ දැවැන්ත මෙහෙයුම

සංවිධානාත්මක අපරාධකරුවන් ඉලක්ක කරගනිමින් 2025 ඔක්තෝබර් 28 දින බ්‍රසීලයේ රියෝ ද ජැනයිරෝහි ඇරඹුණේ දැවැන්ත පොලිස් වැටලීමක්. මේ වැටලීමේදී පොලිස් නිලධාරින් 04 දෙනෙකු ඇතුළු ව අවම වශයෙන් පුද්ගලයන් 121 දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් ඝාතනයට ලක් වූ බව සඳහන්.

බ්‍රසීලයේ බලවත් ම මත්ද්‍රව්‍ය ජාවාරම් කණ්ඩායමක් ඉලක්ක කර ගනිමින්, සන්නද්ධ වාහන සහ හෙලිකොප්ටර්වල සහාය ඇති ව දැඩි ලෙස සන්නද්ධ හමුදා සහ සිවිල් පොලිස් නිලධාරින් 2,500ක් පමණ මේ මෙහෙයුම දැඩි කළේ ඇලෙමියෝ සහ පෙන්හා අසල්වැසි ප්‍රදේශවල කැලෑබද ප්‍රදේශ කරා අපරාධකරුවන් යැයි කියන පුද්ගලයන් සීමා කර ගනිමින්. පැය ගණනක් පැවති දැඩි වෙඩි හුවමාරුවලින් පසුව, සන්නද්ධ වාහන සහ හෙලිකොප්ටර් ද ප්‍රහාර සඳහා එක් ව තිබුණා. පසුව දා වනාන්තර ප්‍රදේශයට ගිය ගම්වැසියන් මළ සිරුරු විශාල සංඛ්‍යාවක් සොයා ගත් අතර ඔවුන් ඒවා පෙන්හා අසල්වැසි ප්‍රදේශයේ චතුරශ්‍රයකට ගෙනැවිත් තිබුණා. වැටලීමේදී පොලිසිය විශාල මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් අත්අඩංගුවට ගත් බව රියෝ ද ජැනයිරෝ ප්‍රාන්ත ආණ්ඩුකාර ක්ලෝඩියෝ කැස්ත්‍රෝ මාධ්‍ය හමුවකදී වාර්තාකරුවන්ට පැවසුවා. මෙහෙයුම අතරතුර අවම වශයෙන් රයිෆල් 118ක් අත්අඩංගුවට ගත් බව ද කියා සිටියා. අඟහරුවාදා දහවල් xහි පළ කළ සටහනකින් කැස්ත්‍රෝ ප්‍රකාශ කළේ මේ වැටලීම 'රියෝ ද ජැනයිරෝ ඉතිහාසයේ විශාලතම මෙහෙයුම' වන බව.



## වයස්ගතම රාජ්‍ය නායකයා

ලෝකයේ දැනට සිටින වයස්ගත ම රාජ්‍ය නායකයා ලෙස සැලකෙන කැමරූන් රාජ්‍යයේ ජනාධිපති පෝල් බියා (**Paul Biya)** 08 වැනි වරටත් නැවත පදවියට පත් වී තිබෙනවා. ඒ අනුව ඔහුට වයස අවුරුදු 100 පිරෙන තුරු ම රාජ්‍ය පාලනයේ යෙදීමේ අවස්ථාව උදා වී තිබීම විශේෂත්වයක්.

92 හැවිරිදි වියේ පසුවන පෝල් බියා ජනාධිපති පදවියට මුල්වරට පත්වුණේ 1982 වසරේදී. එරට දෙවැනි ජනාධිපතිවරයා ලෙස පත්වූ එවකට 49 හැවිරිදි වියෙහි පසුවූ පෝල් බියා එතැන් සිට මේ දක්වා අඛණ්ඩ ව ජනාධිපතිවරණ 8කින් ජයගෙන තිබෙනවා. දැඩි ව බලය රඳවා ගැනීමට සමත් වූ ඔහු ජනාධිපති ධුරයේ සිටීමේ උපරිම සීමාවට ළඟා වූයේ 2008 වසරේදී. එතැන් සිට දිගින් දිගට ම ඉතා පහසුවෙන් නැවත ජයග්‍රහණ ලබා ගත්තා. මේ වසරේ ඔහුට ප්‍රබල අභියෝගයක් එල්ල වූයේ ඔහුගේ ම රජයේ රැකියා ඇමැති සහ රජයේ මාධ්‍ය ප්‍රකාශක ලෙස කටයුතු කළ 70 හැවිරිදි වියේ පසුවන Issa Tchiroma Bakary ඇති වූ මතභේදයකින් පසු විපක්ෂයේ සහ සිවිල් සංවිධාන එකතුවක් සමග විශාල ජනාකර්ෂණයක් දිනා ගනිමින් ඡන්ද සටනක් ආරම්භ කිරීමත් සමගින්. මෙවර පෝල් බියා ජනපති ධුරයට පත්වූයේ 53.7%ක ඡන්ද ලබමින්. Issa Tchiroma Bakary ලැබුවේ ඡන්ද 35.2%ක්.

# මිහිතලයේ සම්මුතිය

චන්දන මාරසිංහ




දිනෙන් දින උග්‍ර වෙමින් පවතින පාරිසරික ගැටලු හමුවේ ඒ පිළිබඳ ගෝලීය අවධානය යොමු වීම නිරන්තරයෙන් සිදු වන්නක්. එහෙත් මේ දිනවල 'දේශගුණ විපර්යාස' පිළිබඳ සංවාදය ජාත්‍යන්තරයේ පවතින්නේ දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ (**UNFCCC**) 30 වැනි පාර්ශ්වකරුවන්ගේ සමුළුව (**Conference of the Parties - COP 30**) නොවැම්බර් 10 සිට 21 දින දක්වා බ්‍රසීලයේ බෙලෙම්හිදී පැවැත්වෙමින් තිබෙන හෙයින්. ඒ නිසා ම මෙවර දෙසතිය කවරයේ කතාවේ කතාබහ ද ඒ ඇසුරින් සිදු වෙනවා. ඒ අනුව දේශගුණික විපර්යාස හමුවේ එහි බලපෑම පුළුල් ව සංවාදයට ලක් කරන්නේ ඊට මුහුණදීමට පවතින ගෝලීය හා ශ්‍රී ලංකාවේ සූදානම ද විමසුමට ලක් කරමින්.

දේශගුණ විපර්යාස යනු පෘථිවියේ සාමාන්‍ය උෂ්ණත්වයේ සහ කාලගුණික තත්ත්වයේ දිගුකාලීන බලපෑම් නිසා ඇතිවන්නක්. පසුගිය වසර 100ක කාලයේ සිට ලෝකයේ උණුසුම ඉහළ යමින් තිබෙනවා. 1980 වසරේ සිට සෑම කාලයක ම උණුසුම වැඩි වී ඇති බව එක්සත් රාජධානියේ කාලගුණ විද්‍යා කාර්යාංශය පෙන්වා දෙන කරුණක්. ලෝක කාලගුණ විද්‍යා සංවිධානයට අනුව ලොව උණුසුම් ම වසර දහය වාර්තා වී තිබෙන්නේ 2015 වසරේ සිට. දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය (The Intergovernmental Panel on Climate Change - IPCC) පෙන්වා දෙන ආකාරයට මේ දේශගුණ විපර්යාස සඳහා වැඩි වශයෙන් හේතු වී තිබෙන්නේ මිනිස් ක්‍රියාකාරකම්. කර්මාන්ත ශාලා, ප්‍රවාහනය, ෆොසිල ඉන්ධන, ගල් අඟුරු, තෙල් සහ ගෑස් භාවිතය ඊට හේතු වී ඇති ප්‍රමුඛ කාරණා.

කාර්මික විප්ලවය ආරම්භයේ සිට ම වායුගෝලීය උණුසුම ඉහළ ගොස් තිබෙනවා. තාප තරංග ඇතිවීම, අයිස් තට්ටු දියවීම, මුහුදු මට්ටම ඉහළ යාම සහ කුණාටු ඇතිවීම ද මේවායේ අයහපත් ප්‍රතිඵල. 2025 වසරේ ජනවාරි මාසයේ ලොස් ඇන්ජලීස් ආශ්‍රිත ව හටගත් ලැව් ගින්නෙන් පමණක් ඩොලර් බිලියන 100ක පමණ හානියක් සිදු ව තිබෙනවා. ලොව බිලියන 3.3 සිට 3.6 දක්වා පිරිසක් දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට මුහුණ දෙනවා. අධික උෂ්ණත්වය සමග ඇති වූ නියඟය



### එහෙත් සුළි - මෙහෙත් සුළි

'මෙලීසා' සුළි කුණාටුව කැරීබියන් දූපත් මුහුදු තීරය ඔස්සේ ජැමෙයිකාවට කඩා වැදුණා. ජාත්‍යන්තර සුළි කුණාටු වර්ගීකරණයේ පස් වැනි කාණ්ඩයට අයත් බව කියන 'මෙලීසා' පැයට කිලෝ මීටර් 280කට අධික වේගයකින් ජැමෙයිකාවට කඩා වැදුණේ චණ්ඩ මාරුතයක් බවට පරිවර්තනය වෙමින්. ලෝක කාලගුණ විද්‍යා සංවිධානය විසින් මෙලීසා නම් කරනු ලැබුවේ 2025 වසරේ ලොව වඩාත් ම දරුණු සුළි කුණාටුව ලෙස.

මෙලීසා දින ගණනාවක් කලාපය හරහා හමා ගොස් විනාශයේ මාවතක් ඉතිරි කළ අතර එයට බිලිවූ මිනිසුන් දුසිම් ගණනක්. හයිටියේ අවම වශයෙන් පුද්ගලයන් 30 දෙනෙකු මිය ගිය අතර කියුබාව ද ගංවතුර සහ නායයෑම්වලට ලක්වුණා.

දකුණු ආසියාවටත් සුළි කුණාටුවක් කඩා වැදුණා. ඒ, ඉන්දියාවට කඩා වැදුණු 'මොන්තා'. බෙංගාල බොක්කෙහි ඇති වූ ගැඹුරු පීඩන අවපාතය දරුණු තත්ත්වයට වර්ධනය වීමෙන් පසු ඉන්දියාවේ අන්ද්‍රා ප්‍රාන්තයෙන් එය කඩා වැදී තිබුණේ ගොඩබිමට. ඒ, පැයට කිලෝ මීටර් 100ක වේගය ඉක්මවමින්. මොන්තා සුළි කුණාටුවෙන් ඔඩිෂා සහ තමිල්නාඩු ප්‍රාන්තවලට ද බලපෑම් එල්ල වනු ඇතැයි අනාවැකි පළ වී තිබුණා.

හේතුවෙන් මේ වන විට සෝමාලියාවේ පමණක් ලක්ෂ 12ක පිරිසක් අවතැන් වී ඇති බවයි වාර්තා වන්නේ.

එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන සිය නවතම වාර්තාවෙන් පෙන්වා දෙන්නේ ඉදිරි දශකයේ ගෝලීය උණුසුම් වීමේ සීමාව 1.5°C ඉක්මවා යාමට බොහෝදුරට ඉඩ ඇති බව. ඒ සඳහා බලපාන සාධක රැසක් මේ වන විට නිර්මාණය වෙමින් තිබෙනවා. එහි එක් අවස්ථාවක් වන්නේ ලෝකයේ බොහෝ කලාපවල ඇතිවන දූවිලි කුණාටු. මෙක්සිකෝව ආශ්‍රිත කාන්තාර ප්‍රදේශවල, ඇමරිකාවේ ටෙක්සස් ප්‍රාන්තයේ, මැදපෙරදිග සහ උතුරු අප්‍රිකාවේ බොහෝ ප්‍රදේශවල මෙවැනි කුණාටු වාර්තා වී තිබෙනවා. මෙහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය සියවසේ සහරා කාන්තාරය 18%කින් පුළුල් වී ඇති බව විද්‍යාඥයන්ගේ ප්‍රකාශ උපුටා දක්වමින් බිබිසි සේවය සඳහන් කර තිබෙනවා.

නවතම අධ්‍යයනයකින් හෙළි වී තිබෙන්නේ දේශගුණ විපර්යාස සහ සන්නද්ධ අරගල හේතුවෙන් ලොව බිලියන ගණනකගේ සෞඛ්‍යයට ද තර්ජන එල්ල වී ඇති බව. ලන්ඩන් විශ්වවිද්‍යාල විද්‍යායතනය සමඟ ලෝක සෞඛ්‍ය සංවිධානය ඒකාබද්ධ ව සිදු කර ඇති මේ අධ්‍යයනය අනුව 1990 ගණන්වල සිට තාපය ආශ්‍රිත ව සිදු වූ මරණ සංඛ්‍යාව 23%කින් ඉහළ ගොස් තිබෙන අතර 2024 වසරේදී හටගත් ලැව් ගිනිවල සියුම් අංශු හේතුවෙන් ලොව මරණ 154,000ක් වාර්තා වෙනවා.

දේශගුණ විපර්යාස පාලනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ඉදිරිපත් වන්නේ විවිධ යෝජනා. දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලයට අනුව ෆොසිල ඉන්ධන සහිත වාහන සහ බලාග ාරවලින් නිකුත්වන අහිතකර ද්‍රව්‍ය ඇතුළු ව මිනිසා විසින් ඇති කරනු ලබන වායු විමෝචනය 2030 වසර වන විට අඩකින් අඩු කළ යුතු වෙනවා. එසේ ම 2035 වසර වන විට එය 60%කින් අඩු කළ යුතුයි. මේ අහිතකර විමෝචනයට වැඩි වශයෙන් දායක වන්නේ සංවර්ධිත රටවල් වුවත් ඇමරිකාව වැනි රටවල් ඒ පිළිබඳ වැඩි අවධානය යොමු කළ යුතු බවයි COP සමුළුව අතරතුරදී ප්‍රකාශ කෙරෙන්නේ. 2050 වසර වන විට දළ කාබන් විමෝචනය ශුන්‍ය කෙරුණු (Carbon net zero) ආර්ථිකයක් ඇතිකර ගැනීමට සියලු රටවල් ක්‍රියා කිරීම ගෝලීය ඉලක්කයක්.

මෙය කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන ක්‍රමවේද ඔස්සේ ඉටු කළ ළඟා කර ගත යුත්තක්. United Nations University පවසන්නේ වර්තමානය වන විට කාබන් විමෝචනයෙන් 75%ක් නාගරික ප්‍රදේශ පදනම් කරගෙන සිදුවන බව. ලතින් ඇමරිකාවේ නගර මේ වන විටත් දේශගුණ විපර්යාසවල බලපෑමට ලක් ව තිබෙනවා. මෙක්සිකෝව, බ්‍රසීලය සහ ආර්ජන්ටිනාව යන රටවල අධික තාපය, ජල අර්බුද හා වායු දූෂණය වැනි තත්ත්ව බහුල ව දැකගත හැකියි.

දේශගුණ විපර්යාාසවලින් සිදුවන හානි අවම කර ගැනීම සඳහා කෘත්‍රිම බුද්ධි තාක්ෂණය (AI) භාවිත කිරීම සම්බන්ධයෙන් ලොව පුරා අවධානය යොමු කර තිබීම විශේෂත්වයක්. විශේෂයෙන් දේශගුණ විපර්යාස නිසා සිදු වන හානි තක්සේරු කිරීම මෙන් ම පූර්ව නිගමනවලට එළඹීමෙන් සිදුවිය හැකි අනතුරු අවම කර ගැනීම වැනි කරුණු පිළිබඳ ව එහිදී සාකච්ඡාවට ලක් ව තිබෙනවා.

දේශගුණ විපර්යාස හේතුවෙන් සිදුවන බරපතළ හානි අවම කිරීම ලෝකයේ සෑම රටක ම වගකීමක්. එහිදී ලෝකයේ කාර්මික රටවලින් වැඩි වශයෙන් බලපාන සාධක අවම කිරීම ප්‍රධාන ඉලක්කයක් විය යුතුයි. අනෙකුත් සෑම රටක ම ඒ

> දේශගුණ විපර්යාස හේතුවෙන් සිදුවන බරපතළ හානි අවම කිරීම ලෝකයේ සෑම රටක ම වගකීමක්. එහිදී ලෝකයේ කාර්මික රටවලින් වැඩි වශයෙන් බලපාන සාධක අවම කිරීම ප්‍රධාන ඉලක්කයක් විය යුතුයි. අනෙකුත් සෑම රටක ම ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුත්තේ මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදුවන හානි අවම කිරීමට. එසේ නොවුණහොත් ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම ප්‍රමුඛ කාරණා පදනම් කරගනිමින් ලොව පුරා නිර්මාණය වන අහිතකර තත්ත්ව වැළැක්වීම අසීරු කාර්යයක් වනු ඇති.




සමුළුව ආරම්භක දින සාකච්ඡාවේදී

සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුත්තේ මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදුවන හානි අවම කිරීමට. එසේ නොවුණහොත් ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම ප්‍රමුඛ කාරණා පදනම් කරගනිමින් ලොව පුරා නිර්මාණය වන අහිතකර තත්ත්ව වැළැක්වීම අසීරු කාර්යයක් වනු ඇති.

වර්ෂාපතන රටාව වෙනස්වීමෙන් නියඟය හා ගංවතුර ඇතිවීම, අධික වැසි හේතුවෙන් පාංශු ඛාදනය හා නාය යෑම් වැනි ආපදා වාර්තා වීම, මිරිදිය ජලයට කරදිය මිශ්‍රවීම හේතුවෙන් ඇතැම් අවස්ථාවල පානීය ජල ගැටලු මතු වීම, බෝවන රෝග ව්‍යාප්තිය මෙන් ම ජෛව විවිධත්වයට හානි සිදුවීම ආදිය දේශගුණ විපර්යාස හේතුවෙන් ශ්‍රී ලංකාවට එල්ල වී ඇති බලපෑම්. මේ බලපෑම් අවම කිරීමට පරිසර විනාශය අවම කිරීම හෝ නතර කිරීම, පුනර්ජනනීය බල ශක්තිය වෙත යොමු වීම, ස්මාර්ට් නගර සංකල්පය ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත්. සැලසුම් සහගත නොවන නාගරීකරණය හේතුවෙන් මතුවන ගැටලු නතර කිරීම හෝ අවම කිරීම මෙන් ම හරිතාගාර වායු විමෝචනය ක්‍රම ක්‍රමයෙන් අවම කරමින් සුහුරු නගර නිර්මාණය කළ යුතු වෙනවා. වැසි ජලය කළමනාකරණය කරමින් ජලය බැහැර කිරීමේ නිසි ක්‍රමවේද සකස් කිරීමත් දේශගුණ විපර්යාස පාලනය සඳහා දායක වන්නක්.

## ජාත්‍යන්තර ප්‍රවේශය

දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය (UNFCCC) අනුමත වූයේ 1992 වසරේ බ්‍රසීලයේ රියෝ ද ජැනෙයිරෝහි පැවති මිහිතල සමුළුවේදී. 1994 වසරේදී බලාත්මක වන මෙය ශ්‍රී ලංකාව අනුමත කළේ 1993 වසරේදී. පාර්ශ්වකරුවන්ගේ සමුළුවේ (**Conference of the Parties - COP**) ආරම්භය සිදු වන්නේ 1995 වසරේදී. දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ පාර්ශ්වකරුවන් ලෙස මේ රටවල් ක්‍රියා කරනවා. මෙහි තිබෙන්නේ ප්‍රධාන පසු අවස්ථා 2ක්. ඒ, 1997 වසරේදී අත්සන් තැබුණු කියොතෝ ප්‍රොටෝකෝලය (Kyoto Protocol) සහ 2015 සැප්තැම්බර් මාසයේ පාර්ශ්වකරුවන්ගේ 21 වැනි සමුළුවේදී සම්මත කළ පැරිස් දේශගුණික විපර්යාස පිළිබඳ ගිවිසුම (Paris Agreement).

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී හර්ෂණී හේරත් අබේරත්න පැහැදිලි කරන ආකාරයට ජාත්‍යන්තරය සමඟ ශ්‍රී ලංකාවට ප්‍රධාන කාර්ය හා වගකීම් රැසක් පැවරී තිබෙනවා. ඇය; දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය යටතේ අප ජාතික ව නිර්ණය කළ දායකත්ව (Nationally Determined Contributions) යටතේ වාර්තා ඉදිරිපත් කිරීම, ද්විත්ව වාර්තා (Biennial Update Reports - BURs) ඉදිරිපත් කිරීම, ජාතික ග්‍රීන්හවුස් වායු දත්ත සටහන (National Greenhouse Gas Inventory) ඉදිරිපත් කිරීම, ජාතික අනුකූලන ක්‍රියාමාර්ග (National Adaptation Plans - NAPs) සැලසුම් සකස් කර ඉදිරිපත් කිරීම කළ යුතුයි. එසේ ම 2024න් පසුව, UNFCCC යටතේ සියලු රටවලට Enhanced Transparency Framework (ETF) යටතේ ප්‍රවේශ වාර්තා (Biennial Transparency Reports - BTRs) ඉදිරිපත් කිරීම අනිවාර්ය වනවා. මෙය පැරිස් ගිවිසුමේ නව වගකීමක්. මේ නිසා ශ්‍රී ලංකාව 2026ට පෙර එහි පළමු සැකසීම කළ යුතුයි.”


## පාර්ශ්වකරුවන්ගේ සමුළුව පවත්වන්නේ ඇයි ?

දේශගුණ විපර්යාස පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පවත්වන ප්‍රධානතම සමුළුව වන්නේ පාර්ශ්වකරුවන්ගේ සමුළුව. හරිතාගාර වායු (***Greenhouse Gases*** - GHG) විමෝචනය අවම කිරීම, දේශගුණ විපර්යාසවල බලපෑම්වලට අනුවර්තනය වීම සහ අවදානමට ලක් විය හැකි රටවලට අරමුදල් සැපයීම වැනි කරුණු පිළිබඳ ව මේ සමුළුවේදී සාකච්ඡා කරනවා. දේශගුණ විපර්යාසවලට එරෙහි සටනේදී මේ සමුළුව ඉටු කරන්නේ සුවිශේෂ කාර්යභාරයක්.

දේශගුණ විපර්යාස සඳහා ගෝලීය ප්‍රතිචාරය ශක්තිමත් කිරීම වෙනුවෙන් විවිධ අවස්ථාවල විවිධ ක්‍රියාමාර්ග මේ සමුළුවේදී ගෙන තිබෙනවා. එහි එක් සන්ධිස්ථානයක් වන්නේ කියොතෝ ප්‍රොටොකෝලය සම්මත කර ගැනීම. මෙහි පාර්ශ්වකරුවන් සංඛ්‍යාව 192ක්. 1997 දෙසැම්බර් 11 දින සම්මත කරගන්නා ලද කියොතෝ ප්‍රොටොකෝලය සංකීර්ණ අනුමත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් බලාත්මක වූයේ 2005 වසරේ පෙබරවාරි 16 දින සිට. හරිතාගාර වායු විමෝචනය අඩු කිරීමට කැපවීමයි මෙහි ප්‍රධානතම අරමුණ. කාර්මික රටවල් කෙරෙහි වැඩි අවධානය යොමු කර තිබෙන මෙහි නව සංශෝධනය 2020 දෙසැම්බර් මාසයේ සිට බලාත්මක කෙරුණා. ඉලක්කය වූයේ හරිතාගාර වායු විමෝචනය 1990 වසරේ පැවැති මට්ටමට වඩා 18%කින් අඩු කිරීම.

දේශගුණ විපර්යාස පාලනය කිරීමේ වැඩසටහන්වල තීරණාත්මක සන්ධිස්ථානය වූයේ පැරිස් ගිවිසුම (Paris Agreement) ඇති කර ගැනීම. 2015 වසරේ දෙසැම්බර් 12 දින ප්‍රංශයේ පැවති COP 21 සමුළුවේදී සම්මත කරගන්නා මෙය බලාත්මක වූයේ 2016 වසරේ නොවැම්බර් 04 දින. මේ ගිවිසුමේ ප්‍රධාන ඉලක්කය වූයේ ගෝලීය සාමාන්‍ය උෂ්ණත්වය 2°Cට වඩා බෙහෙවින් අඩු මට්ටමක තබා ගැනීම සහ පූර්ව කාර්මික යුගයට වඩා උෂ්ණත්වය වැඩිවීම 1.5°C දක්වා සීමා කිරීම. එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය පෙන්වා දෙන ආකාරයට උෂ්ණත්වය 1.5°C ඉක්මවා යාමෙන් දරුණු නියඟ, ජලගැලීම්, තාප තරංග ඇතුළු දරුණු දේශගුණික විපර්යාස ඇති විය


රටවල නියෝජිතයන්, සංවර්ධන බැංකු, ආයෝජකයන් සහ සිවිල් සමාජ සංවිධාන සාකච්ඡා කරමින්



හැකියි. මේ ඉලක්කයට ළඟාවීමටනම් 2030 වසර වන විට හරිතාගාර වායු විමෝචනය 43%කින් අඩු කළ යුතු වෙනවා. ඉලක්ක සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් 2025 වසරේ ඩොලර් බිලියන 100ක අරමුදල් අවශ්‍ය බවයි ඇත්තමේන්තු ගත කර තිබෙන්නේ. ඒ, දේශගුණ විපර්යාස නිසා ඇති වන අභියෝග සමඟ ක්‍රියා කිරීමට සංවර්ධනය වෙමින් පවතින රටවලට ප්‍රමාණවත් ධාරිතාවක් නොමැති නිසා.

## පාර්ශ්වකරුවන්ගේ සමුළුව (COP 30)

දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ (UNFCCC) පාර්ශ්වකරුවන්ගේ සමුළුව වන මෙය 30 වැනි වරට (COP 30) 2025 වසරේ පැවැත්වෙන්නේ බ්‍රසීලයේ ඇමසන් වනාන්තරය ආශ්‍රිත ව බෙලෙම් (BELEM)හිදී. එයට රාජ්‍ය නායකයන්, නිලධාරීන් මෙන් ම විවිධ සංවිධාන මට්ටමින් නියෝජිතයන් එක් වෙනවා. මීට සමගාමී ව නොවැම්බර් 6-7 දෙදින රාජ්‍ය නායක සමුළුව ද පැවැත්වුණා. මේ සමුළුවේදී (COP 30) ප්‍රධාන වාර්තා තුනක් සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබෙනවා. පැරිස් ගිවිසුමේ අන්තර්ගත කරුණු ක්‍රියාත්මක කර ඇති ආකාරය සහ එහි ප්‍රගතිය, එක් එක් රටවල ජාතික දේශගුණික සැලසුම්, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ ජාතික අනුවර්තන සැලසුම් එම වාර්තාවල ඇතුළත් කාරණා.

ලෝක නායකයන් සහභාගි වන දෙදින සමුළුවේදී ප්‍රධාන වශයෙන් අවධානය යොමුවුණේ එක් එක් රටවල ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිළිබඳ ව. එක්සත් ජාතීන්ගේ මහලේකම් **António Guterres** පෙන්වා දෙන ආකාරයට පුනර්ජනනීය බලශක්ති විප්ලවයයි මේ පැමිණ තිබෙන්නේ. පුනර්ජනනීය බල ශක්තිය සඳහා ආයෝජනය කරන සෑම ඩොලරයක් ම ෆොසිල ඉන්ධන සඳහා ආයෝජනය කරන ඩොලරයට වඩා තුන් ගුණයකින් රැකියා නිර්මාණය කරනවා. 2030 වසර වන විට පුනර්ජනනීය බල ශක්ති ධාරිතාව වැඩි කළ යුතු වන්නේ තුන් ගුණයකින්. ලෝකය තවමත් පැහැදිලි ව ම 2°Cකට වඩා වැඩි උෂ්ණත්වයක් කරා ගමන් කරමින් සිටිනවා. මේ සියවස අවසන් වන විට 1.5°Cට ළඟා වීමටනම් 2030 වසර වන විට ගෝලීය හරිතාගාර වායු විමෝචනය අඩකින් අඩු විය යුතුයි.

බ්‍රසීල ජනාධිපති **Luiz Inacio Lula da Silva** සමුළුවේදී පෙන්වා දුන්නේ ලෝකයේ දේශගුණික ප්‍රතික්ෂේප කිරීම් පරාජය කළ යුතු බව. ප්‍රතික්ෂේප කරන කණ්ඩායම්වලට නව පරාජයක් ලබාදීමට කාලය එළඹ ඇති බව ඔහු ප්‍රකාශ කළේ කිසිවෙකුගේ නමක් සඳහන් නොකරමින්. ව්‍යාජ ප්‍රවෘත්ති සහ නිරූපණය කිරීම ප්‍රතික්ෂේප කිරීමේ කාලය එළඹ ඇති බවත් ඇතැම් කණ්ඩායම් වෛරය හා භීතිය පතුරුවන බවත් ව්‍යාජ ප්‍රවෘත්තිවලට එරෙහි ව සටන් කළ යුතු බවත් බ්‍රසීල ජනාධිපතිවරයා පෙන්වා දුන්නා.

දේශගුණ විපර්යාසවලට අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා වන ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 1.3ක අරමුදල සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡා වී තිබෙනවා. අප්‍රිකා සංගම් කොමිසමේ සභාපති Mahamoud Ali Youssouf පෙන්වා දුන්නේ දේශගුණ අර්බුදයේ වඩාත් හානිකර බලපෑම්වලින් පෙළෙන රටවල් දේශගුණික යුක්තිය ඉල්ලා සිටිය යුතු බව.



COP30 සමුළුවේදී බාකු සිට බෙලෙම් දක්වා මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම පිළිබඳ පළමු රැස්වීමේදී රටවල් සහයෝගය පළ කළ ආකාරය

COP 30 සමුළුවට සමගාමී ව Germanwatch ආයතනය දේශගුණ අවදානම් දර්ශකය නිකුත් කර තිබෙනවා. එහි දැක්වෙන ආකාරයට දේශගුණික විපත් ලොව බිලියන 1.3ක ජනතාවකට බලපා තිබෙනවා. 1995-2024 වසර දක්වා ඇමරිකානු ඩොලර් බිලියන 170කට ආසන්න ආර්ථික හානියක් සිදු වී ඇති අතර දේශගුණයට සම්බන්ධ සිදුවීම් 9700ක් වාර්තා වෙනවා. එසේ ම ලක්ෂ 08කට වැඩි ජීවිත සංඛ්‍යාවක් අහිමි වී තිබෙන අතර බිලියන 5.7කට බලපෑම් එල්ල වී තිබෙනවා.

දේශගුණ අවදානම් දර්ශකය අනුව මේ කාලයේ වැඩි ම බලපෑමක් එල්ල වී තිබෙන්නේ ඩොමිනිකා රාජ්‍යයට. ඒ, ඇමරිකා ඩොලර් බිලියන 1.8ක හානියක් සිදු වීමෙන්. දෙවැනි ස්ථානයේ මියන්මාරය පසු වන අතර හොන්ඩුරාස් රාජ්‍යය තුන් වැනි ස්ථානයේ රැඳී සිටිනවා. චීනය එම දර්ශකයේ නව වැනි ස්ථානයේත් ඉන්දියාව දහ වැනි ස්ථානයේත් වැඩි ම බලපෑම් එල්ල වූ රටවල් අතර සිටිනවා. 2024 වසරේදී වැඩි ම බලපෑමක් එල්ල වී ඇති රටවල් අතරට නේපාලය, පිලිපීනය, මියන්මාරය සහ වියට්නාමය අයත්. COP 30 සමාරම්භක සැසිවාරේදී බ්‍රසීලය, දකුණු අප්‍රිකාව, චීනය ඉන්දියාව යන රටවල් වෙනුවෙන් ප්‍රකාශයක් නිකුත් කරමින් ඉන්දියාව සඳහන් කළේ දේශගුණික මූල්‍යකරණය පිළිබඳ පැහැදිලි අර්ථකථනයක් තිබිය යුතු බව. පැරිස් ගිවිසුමට අනුව සංවර්ධනය වෙමින් පවතින රටවලට මූල්‍ය සම්පත් සැපයීම සඳහා සංවර්ධිත රටවලට වගකීමක් ඇති බවත් එහිදී ඉන්දියාව පෙන්වා දුන්නා.

COP 30 සමුළුව අතරතුර මාධ්‍ය හමුවකට එක්වෙමින් එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ විධායක ලේකම් Simon Stiell සඳහන් කළේ 2019 වසරේ මට්ටමට සාපේක්ෂ ව 2025 වසර වන විට හරිතාගාර වායු විමෝචනය 12%කින් පහත වැටෙනු ඇති බව. එහිදී එම ප්‍රගතිය වේගවත් කිරීමට පාර්ශ්වකරුවන් ක්‍රියා කළ යුතු බව ද ඔහු පෙන්වා දී තිබෙනවා.

මේ සමුළුව අතරතුරදී ආදිවාසීන් පිරිසක් සහ විරෝධතාකරුවන් පිරිසක් විරෝධතා ව්‍යාපාරයක නිරත වී සිටියේ ස්වදේශික ඇඳුම්වලින් සැරසී. ඒ,

# සාමූහික ප්‍රයත්නයක්



මහාචාර්ය
**එරන්දතී ලොකුපිටිය**
සත්ත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයන අංශය
කොළඹ විශ්වවිද්‍යාලය

දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය (UNFCCC) අනුව දේශගුණ විපර්යාස යනුවෙන් හැඳින්වෙන්නේ සෘජු ව හෝ වක්‍ර ව හෝ මිනිසාගේ දයකත්වය නිසා වායුගෝලීය සංයුතිය වෙනස් වීමෙන් ඇති වන දේශගුණයේ වෙනස්වීම. එනම් ගෝලීය උණුසුම ඉහළ යාම. මෙය වායුගෝලයේ හරිතාගාර වායු සාන්ද්‍රණය වැඩිවීමෙන් සිදු වන්නක්. දේශගුණික විපර්යාස යනු ස්වාභාවික ව දේශගුණයේ සිදු වන

දේශගුණ විපර්යාස සහ වන විනාශය හේතුවෙන් තම නිජබිම් අහිමිවන බව දක්වමින්. 2025 වසර මුලදී නිකුත් කළ එක්සත් ජාතීන්ගේ වාර්තාවක සඳහන් වන්නේ ආදිවාසී ජනතාව හේතුවෙන් ජෛව විවිධත්වයෙන් 80%ක් ආරක්ෂා වන නමුත් ජාත්‍යන්තර දේශගුණික අරමුදල්වලින් ඔවුන් වෙනුවෙන් ලබා ගන්නේ 1%කටත් අඩු ප්‍රමාණයක් බව.

'දේශගුණ විපර්යාස පිළිබඳ තොරතුරු අඛණ්ඩතාව සඳහා වන ගෝලීය මුල පිරීම' මෙවර සමුළුවට සමගාමී ව ආරම්භ වුණා. දේශගුණික විපර්යාස පිළිබඳ වැරදි තොරතුරු ප්‍රචාරය වැළැක්වීම සඳහා වැළැක්වීම සහ දේශගුණික ගැටලු පිළිබඳ නිවැරදි සාක්ෂි මත පදනම් වූ තොරතුරු ප්‍රවර්ධනයයි එහි අරමුණ වුණේ. මේ ප්‍රකාශනය දැනට රටවල් 10ක් අනුමත කර තිබෙනවා. බ්‍රසීලය, කැනඩාව, ප්‍රංශය, ජර්මනිය සහ ස්වීඩනය ද ඒ අතරට අයත්.

ලෝකයේ භූමියෙන් 6%ක් පමණ ඇමසන් සහ කොංගෝ වැනි වැසි වනාන්තර ආවරණය වන අතර එහි ගබඩා කරගෙන තිබෙන්නේ ලෝකය උණුසුම් කරන වායු ටොන් බිලියන ගණනාවක්. එම වැසි වනාන්තර ආරක්ෂා කරගැනීමේ අවශ්‍යතාව පිළිබඳ ව ද සමුළුවේදී අවධාරණය කර තිබෙනවා. එහි මූලික සැලසුම්වලදී බ්‍රිතාන්‍යය වැනි සංවර්ධිත රටවලින් ඒ සඳහා ඩොලර් බිලියන 25ක අරමුදල් රැස්කිරීමට බලාපොරොත්තු වන බව බ්‍රසීල ජනාධිපතිවරයා සඳහන් කර තිබෙනවා.

දේශගුණික කම්පනවලට ඔරොත්තු දීමේ සහ අඩු විමෝචන ආර්ථිකයක් වෙත සංක්‍රමණය වීමේ අවශ්‍යතාව ගැන ද සමුළුවේදී අවධානය යොමු වුණා. බලපෑමට ලක් වූ රටවලට සහ ජනතාවට සහාය වීම වෙනුවෙන් රජයන්, දේශගුණික අරමුදල සහ පෞද්ගලික ආයෝජකයන්ගේ ඒකාබද්ධ පද්ධතියක් නිර්මාණය කිරීමයි මෙහි මූලික අරමුණ. බහුපාර්ශ්වික සංවර්ධනයක් සහ රැකියා නිර්මාණය කිරීමෙන් දේශගුණික බලපෑම් අවම කිරීමත් මෙහි අරමුණක්.

2035 වසර වන විට සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දේශගුණික මූල්‍යකරණයක් නිර්මාණය කිරීම නව සැලසුම් අතරට අයත්. එය ගෝලීය දේශගුණ ක්‍රියාමාර්ගයක්. දේශගුණ විපර්යාස පාලනය කිරීමේ ආයෝජන දිරිමත් කිරීම, ඉදිරියේදී මතුවිය හැකි අභියෝග අවම කරවීම ගැන ද මෙවර සමුළුවේදී අවධානය යොමු කර තිබෙනවා.

දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන හානි වැළැක්වීමට සහ ප්‍රතිචාර දැක්වීමට රාජ්‍යවලට නීතිමය යුතුකමක් ඇති බව ජාත්‍යන්තර අධිකරණය දැනුම් දී තිබීම මෙහිදී සුවිශේෂ තත්ත්වයක්. එයින් පැහැදිලි වන්නේ දේශගුණික විපර්යාස පිළිබඳ පවතින ගෝලීය ගැටලුව හමුවේ කිසිදු රටකට හෝ රාජ්‍යයකට හෝ සිය යුතුකම පැහැර හැරීමට නීතියෙන් ද ඉඩක් නොමැති බව.

| ප්‍රධාන හරිතාගාර වායු |
|---|
| කාබන් ඩයොක්සයිඩ් ($CO_2$) |
| නයිට්‍රස් ඔක්සයිඩ් ($N_2O$) |
| හයිඩ්‍රොෆ්ලෝරෝ කාබන් (HFC) |
| ක්ලෝරෝෆ්ලෝරෝ කාබන් (CFC) |
| සල්ෆර් හෙක්සාෆ්ලෝරයිඩ් ($SF_6$) |
| මීතේන් ($CH_4$) |
| ඕසෝන් ($O_3$) |
| ජල වාෂ්ප |



විචල්‍යතාවන්ට අමතර ව සිදු වන්නක් ලෙසත් එම රාමුගත සම්මුතියේ අර්ථ දක්වනවා.

ෆොසිල ඉන්ධන භාවිතය, වන හායනය, කෘෂිකාර්මික කටයුතු ආදී කාර්මික විප්ලවයේ සිට මේ දක්වා කළ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් වායුගෝලයට නිකුත් කෙරෙන කාබන්ඩයොක්සයිඩ්, නයිට්‍රස් ඔක්සයිඩ්, මීතේන් වැනි වායුවල බලපෑම දේශගුණික විපර්යාසවලට ඍජු ව ම බලපා ඇති සාධක. මේ හේතුවෙන් ඇති වන දේශගුණ විපර්යාස නිර්මාණයට දයක වන ප්‍රධාන රටවල් තිබෙනවා. 1992 වසරේදී දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය ඇති කර ගැනෙන්නේ ම මේ සඳහා විසඳුම් සෙවීමට. ඒ වන විට ලෝකයේ රටවල් හඳුනාගෙන තිබුණා දේශගුණික විපර්යාසවලට බොහෝවිට දයක වන්නේ දියුණු රටවල් බවට. මේ සම්මුතියෙදී ද එම කරුණ තහවුරු වුණා. සමුළුව අවසානයේදී එම රටවල් මොනවාද යන්නත් ලැයිස්තුගත කෙරුණා. වර්තමානයේදීත් දේශගුණික විපර්යාසවලට ඍජු ව දයක වන්නේ එම රටවල් බව පැහැදිලි වෙනවා.

එම සම්මුතියට අනුව ශ්‍රී ලංකාව ඇතුළු දියුණුවෙමින් පවතින රටවල් හරිතාගාර වායු විමෝචනයට දයක වන්නේ ඉතා අඩුවෙන්. පැරිස් ගිවිසුමට පෙර හඳුනා ගැනෙනවා චීනය, ඉන්දියාව වැනි දියුණු වෙමින් පවතින රටවල් ද දේශගුණික විපර්යාස සඳහා වැඩි බලපෑමක් කරන බව. එහෙත් ඇමරිකාව, කැනඩාව, රුසියාව, ජපානය වැනි රටවලටයි මුල් කාලයේ සම්මුතිය ඔස්සේ වැඩි වගකීම පැවරුණේ.

දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය ප්‍රායෝගික ව ක්‍රියාවට නැංවෙන්නේ 1997 වසරේ පිහිටුවා ගත් කියොතෝ ප්‍රොටෝකෝලය අනුව. ඒ යටතේ 80%ක් පමණ දේශගුණ විපර්යාසවලට දායක වන දියුණු රටවලට ඉලක්කයක් ලබා දුන්නා අඩු ම වශයෙන් 1990 වසරේ කළ කාබන් විමෝචනය 5%කින්වත් අඩු කළ යුතු ය යන්න. ඒ සඳහා 2008-2012 දක්වා කාලසීමාවක් ලබා දුන්නා. මේ සඳහා හඳුන්වා දුන් එක් යාන්ත්‍රණයක් වන්නේ පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (Clean Development Mechanism). මෙහිදී දියුණු රටවලට පුළුවන් දියුණු වෙමින් පවතින රටවලට සුළං බලය සූර්ය බලය, ජල විදුලි බලය ආදී ව්‍යාපෘති සඳහා මුදල් යොදවන්නට. එවිට කාබන් විමෝචනය අවම කිරීමට තමා දයක වූ බව පෙන්වන්නට එයින් පුළුවන්. එය දියුණු වෙමින් පවතින රටවලට උදව්වක් වනවා මෙන් ම එම රටවල තිරසර සංවර්ධනයට දායකත්වයක් ලෙස වැදගත්.

දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය ප්‍රායෝගික ව ක්‍රියාවට නැංවෙන්නේ 1997 වසරේ පිහිටුවා ගත් කියොතෝ ප්‍රොටෝකෝලය අනුව. ඒ යටතේ 80%ක් පමණ දේශගුණ විපර්යාසවලට දායක වන දියුණු රටවලට ඉලක්කයක් ලබා දුන්නා අඩු ම වශයෙන් 1990 වසරේ කළ කාබන් විමෝචනය 5%කින්වත් අඩු කළ යුතු ය යන්න. ඒ සඳහා 2008-2012 දක්වා කාලසීමාවක් ලබා දුන්නා. මේ සඳහා හඳුන්වා දුන් එක් යාන්ත්‍රණයක් වන්නේ පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (Clean Development Mechanism). මෙහිදී දියුණු රටවලට පුළුවන් දියුණු වෙමින් පවතින රටවලට සුළං බලය සූර්ය බලය, ජල විදුලි බලය ආදී ව්‍යාපෘති සඳහා මුදල් යොදවන්නට. එවිට කාබන් විමෝචනය අවම කිරීමට තමා දායක වූ බව පෙන්වන්නට එයින් පුළුවන්. එය දියුණු වෙමින් පවතින රටවලට උදව්වක් වනවා මෙන් ම එම රටවල තිරසර සංවර්ධනයට දායකත්වයක් ලෙස වැදගත්.

ගෝලීය උෂ්ණත්වය වැඩිවීම විවිධාකාරයෙන් මානව හා පාරිසරික පැවැත්මට බලපානවා. මුහුදු ජල මට්ටම ඉහළ යාම නිසා දූපත් රටවල් ජලයෙන් යට වෙනවා වගේ ම වෙරළ තීරවල පරිසර පද්ධතිවලටත් එයින් හානි සිදු වෙනවා. වායුගෝලයේ ජල වාෂ්ප වැඩිවීම හේතුවෙන් නියං සහ ගංවතුර වැනි ස්වාභාවික විපත් බහුල වශයෙන් ඇති වීම, මේ නිසා කෘෂිකාර්මික භෝග විනාශය සහ ඵලදාව අඩුවීම ආදිය නොවැළැක්විය හැකි තත්ත්ව.

පැරිස් ගිවිසුම යටතේ සෑම රටකට ම එක හා සමාන ව වගකීමක් පැවරෙනවා. ශ්‍රී ලංකාව ද මේ සඳහා බැඳී සිටින නිසා පුනර්ජනනීය බලශක්තියට නැඹුරුවීම, හරිත ප්‍රවාහනය, වන විනාශය අවම කිරීම මෙන් ම නොයෙකුත් හරිත ක්‍රියාකාරකම් සඳහා දැනටමත් යොමු ව අවසන්.

ජාතික මට්ටමේ ක්‍රියාකාරකම්වලින් මේ සඳහා දායක වීමේදී ජාතික ව නිර්ණය කරන ලද දායකත්ව (Nationally Determined Contributions -NDCs) සැලසුම ඉතා වැදගත්. වසර පහකට වරක් මෙය දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියට ඉදිරිපත් කළ යුතුයි. ශ්‍රී ලංකාව එය 2016, 2021 සහ 2025 වසරවල ඉදිරිපත් කළා .

දේශගුණ විපර්යාස අවම කිරීම සඳහා ක්‍රියා නොකළහොත් 21 වැනි සියවස අවසානය වෙද්දී කාර්මීකරණයට පෙර තිබූ ගෝලීය උෂ්ණත්වයට සාපේක්ෂ ව ගෝලීය උණුසුම 5°Cට වඩා වුවත් වැඩි විය හැකි බවට අනාවැකි පළ කර තිබෙනවා. මේ නිසා පැරිස් ගිවිසුමෙන් අවධාරණය කරන්නේ මේ ශතවර්ෂයේ අවසාන විට එම උෂ්ණත්වය වැඩි වීම 2°Cට වඩා අඩුවෙන් තබා ගැනීමට රටවල් ක්‍රියා කළ යුතු බව.

මේ අනුව හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා ශ්‍රී ලංකාව 2030 වසර වන විට බලශක්තියෙන් 70%ක් පුනර්ජනනීය බලශක්තියෙන් සපුරා ගැනීම, 2030 වසර වන විට වන ගහනය 32% දක්වා වැඩි කිරීම, 2050 වසර වන විට දළ කාබන් විමෝචනය ශුන්‍ය කිරීම (Carbon net zero) යනාදිය අපේක්ෂා කරනවා. ශ්‍රී ලංකාව මේ සඳහා මාර්ග සිතියමක් ( Carbon net zero 2050 Roadmap) සකස් කළා. ඊට අමතර ව ජාතික අනුහුරුවීමේ සැලසුම (National adaptation plan), පළාත් අනුහුරුවීමේ සැලසුම්, ප්‍රජා අනුහුරුවීමේ සැලසුම් යනාදියත් පිළියෙල කර තිබෙනවා.

කෙසේ වෙතත් මේ සියල්ල ක්‍රියාවට නැංවීමේදී එළඹෙන අභියෝග අප ජය ගත යුතු ව තිබෙනවා. මෙහිදී මතු වන මූලික ම අභියෝගය වන්නේ සැලසුම් සකස් කළත් ඒවා නිසි ලෙස ක්‍රියාත්මක නොවීම හා ආයතනික කාර්යභාරය ඉටු නොවීම. එනම් ආයතන කිහිපයක් එකට සම්බන්ධ වන විට මෙවැනි සැලසුම් ක්‍රියාකාරී වන්නේ ඉතා සෙමෙන්. මේ නිසා සාමූහික ව ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍යයි. නිලධාරීන් නොමැතිකම, තාක්ෂණික දැනුම හා තාක්ෂණික හැකියාව අඩුවීම, ධාරිතා ගැටලු, මූල්‍ය අපහසුතා මෙහිදී කැපී පෙනෙන අනෙකුත් අභියෝග. දේශගුණික විපර්යාස හේතුවෙන් දේශීය හා ගෝලීය වශයෙන් සිදුවන ආපදා හා විපත් සඳහා වැඩි බරක් දැරීමට සිදුවීමත් අභියෝගාත්මක කරුණක්.

දේශගුණික විපර්යාස සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම අත්‍යවශ්‍ය වෙනවා. හරිතාගාර වායු ප්‍රභව, පරිසර පද්ධති විසින් හරිතාගාර වායු අවශෝෂණය, පස සහ ශාක මගින් කාබන් අවශෝෂණය, කෘෂිකාර්මික බලපෑම අවම කිරීම, ජල සුරක්ෂිතතාව, ආර්ථික හානිය, වර්ෂාපතන රටාවේ වෙනස්වීම නිසා සිදුවන බලපෑම ආදිය පිළිබඳ බොහෝ විට පර්යේෂණ සිදු කර තිබෙනවා. එහෙත් පර්යේෂණ ප්‍රතිඵල අදළ කාර්ය සඳහා යොදා ගන්නේ ද යන්න තිබෙන්නේ ගැටලුවක්. මේ නිසා සුදුසු පර්යේෂණ අදළ කර ගනිමින් දේශගුණික විපර්යාස හමුවේ සිදු වන බලපෑමට නිසි විසඳුම් සෙවීමට වගකිව යුතු පාර්ශ්වවල අවධානය යොමු වීම කාලීන අවශ්‍යතාවක්.

# අඩු කාබන් ආර්ථිකයක්




**හර්ෂණී හේරත් අබේරත්න**
ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා දේශගුණ අරමුදල පුද්ගලික සමාගම
පරිසර අමාත්‍යාංශය


ශ්‍රී ලංකා දේශගුණ අරමුදල අරමුදල (SLCF), 2008 පෙබරවාරි මස පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ එළඹි තීරණයක් අනුව ස්ථාපිත කෙරුණා. ඒ අනුව එය සංස්ථාපනය කෙරුණේ 2008 අප්‍රේල් 09 දින 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පී. වී 63781 අංකයෙන්. ආරම්භයේදී 'ශ්‍රී ලංකා කාබන් අරමුදල (පුද්ගලික සමාගම)' ලෙස මෙය හඳුන්වා තිබෙනවා. 2016 ජනවාරි 29 දින සිට ආයතනයේ කාර්ය කාබන්වලට පමණක් සීමා වූයේ නැහැ. විවිධ පාරිසරික ව්‍යාපෘති දක්වා එය ව්‍යාප්ත වුණා. මේ නිසා ආයතනයේ නාමය 'ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික සමාගම)' ලෙස වෙනස් කළා. එහෙත් බොහෝ ආයතන මෙය හඳුන්වන්නේ 'කාබන් අරමුදල' යන නමින්. 2020 සැප්තැම්බර් 25 දින අතිවිශේෂ ගැසට් පත්‍රයකින් පරිසර අමාත්‍යාංශ විෂය පථය යටතට 'ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම' ඇතුළත් කර තිබෙනවා.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල රජය සතු පෞද්ගලික ආයතනයක්. මෙයට මහා භාණ්ඩාගාරයෙන් ආරම්භක ප්‍රාග්ධනයක් (මිලියන 25ක්) ලැබුණත් වාර්ෂික ව රජයෙන් ප්‍රතිපාදන නොලබන, සමාගමේ ආදායම් සමාගම ම ජනනය කරගන්නා (Self-Generated Income) ආයතනයක්. 'අරමුදල' (Fund) යන නමින් මේ ආයතනය හැඳින්වුවත් ශ්‍රී ලංකා දේශගුණ අරමුදල මූල්‍ය ආධාර ලබාදීමට ස්ථාපිත කරන ලද ආයතනයක් නොවෙයි. වාර්ෂික ආදායම උපයා ගන්නේ දේශීය හා විදේශීය ව්‍යාපෘතිවලින්.

දේශගුණ අරමුදලේ ප්‍රධාන ම අරමුණ වන්නේ කාබන් විමෝචනය සත්‍යාපනය කිරීම. එමගින් අඩු කාබන් ආර්ථිකයක් ගොඩනැගීම සඳහා ආයතනවලට සහාය වෙනවා. අඩු කාබන් ආර්ථිකයක් ගොඩනැගීම. කාබන් උදාසීන (Carbon Neutral) සහ දේශගුණයට ඔරොත්තු දෙන නීල හරිත ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීම සමාගමේ දැක්ම වෙනවා. ශ්‍රී ලංකාව 2050 වර්ෂය වන විට හරිතාගාර වායු අවම කරගෙන කාබන් ශුන්‍ය වීමට දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය (UNFCCC) වෙත ප්‍රතිඥා දී තිබෙනවා. එම ජාතික ඉලක්කයට සහය වීමට 2048 වන විට කාබන් උදාසීනතාව ළඟා කර ගැනීමට සහය වීම සඳහා අඩු කාබන් සහ දේශගුණයට ඔරොත්තු දෙන ව්‍යාපෘති සහ වැඩසටහන් සංවර්ධනය කිරීම වෙනුවෙනුයි ශ්‍රී ලංකා දේශගුණ අරමුදල සිය මෙහෙවර සකස් කරගෙන තිබෙන්නේ. මේ සියල්ල සිදු කරන්නේ අන්තර්ජාතික පාරිසරික සම්මුති හා සංවිධානවල එකඟතාව මත සහ ඒවායේ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල මූලික ව ම තෙවැනි පාර්ශ්වීය සත්‍යාපන ආයතනයක් (Third Party Verification Body) ලෙස ක්‍රියා කරනවා. ප්‍රධාන වශයෙන් තිරසර පරිසරයක් උදෙසා වූ ව්‍යාපෘති හා උපදේශන සේවා ක්‍රියාත්මක කිරීමයි ආයතනයේ මූලික කාර්යය වන්නේ. එහිදී ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් තිබෙනවා. හරිතාගාර වායු සහ ජල පිය සටහන් සත්‍යාපනයේදී (GHG and Water Footprint Verification) වන්නේ ඕනෑ ම ආයතනයක සිදුවන ක්‍රියාකාරකම් (විදුලි භාවිතය, ප්‍රවාහනය, ඉන්ධන, අමුද්‍රව්‍ය ආදී) නිසා සිදුවන හරිතාගාර වායු විමෝචනය ගණනය කිරීමෙන් ලැබෙන වාර්තා සත්‍යාපනය කිරීම. මෙයින් අදාළ ආයතනයට

තෙවැනි පාර්ශ්ව සහතිකයක් (Certification) ලබා දීම සිදු වෙනවා.

ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් (Sri Lanka Carbon Crediting Scheme) ආයතනවලට අභ්‍යන්තර ව (Internal) අවම කරගත නොහැකි වූ හරිතාගාර වායු විමෝචන ප්‍රමාණ හිලව් කර ගැනීමට (Offsetting) අවස්ථාව ලැබෙනවා. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක හරිතාගාර වායු විමෝචන අවම කරන සුදුසුකම් සහිත ව්‍යාපෘති (උදා: ජලවිදුලි බලාගාර, සූර්ය බලශක්ති, වන වගා) මේ ක්‍රමය යටතේ ලියාපදිංචි කර, ඒවා කාබන් ණය (Carbon Credits) බවට පරිවර්තනය කර වෙළෙඳ පොළේ අලෙවි කිරීමට සහය ලබා දීමයි මෙහිදී සිදු කරන්නේ. අදාළ ව්‍යාපෘතිය කාබන් වෙළෙඳාමට සුදුසු ද යන්න පිළිබඳ ව වලංගුකරණය සහ සත්‍යාපනය කිරීම සිදු කරනු ලබන්නේ ද දේශගුණ අරමුදල විසින්.

දේශගුණික සහ බලශක්ති සහතිකකරණයත් ප්‍රධාන ක්‍රියාකාරකමක්. එහිදී ශුද්ධ ශුන්‍ය බලශක්ති සහතිකය (Net Zero Energy Certificate) සහ දේශගුණික ධනාත්මක සහතිකය (Climate Positive Certificate) වැනි සහතික ලබා දෙනවා. ඒ, ආයතන ෆොසිල ඉන්ධන භාවිතයෙන් බැහැර වී පුනර්ජනනීය බලශක්ති (Renewable Energy) භාවිතය සඳහා යොමු කිරීම දිරිමත් කිරීමට. උපදේශන සහ තාක්ෂණික සේවා සැපයීමේදී දේශීය ව හා විදේශීය ව ආයතන සඳහා පාරිසරික උපදේශන සේවා (Environmental Consultancy Services), විද්‍යාව මත පදනම් වූ ඉලක්ක (Science Based Targets) වැනි සංකීර්ණ සහතිකකරණ ක්‍රියාවලි සඳහා උපදේශන සේවා, පරිසරය සම්බන්ධ ව්‍යාපෘති සඳහා අදාළ තාක්ෂණික සහ විශේෂඥ සේවා (Technical E·pertise) සපයනවා.

වර්තමානයේ දේශගුණික විපර්යාස (Climate Change) හේතුවෙන් කාලගුණික විපර්යාස (වැඩි වර්ෂාව, අධික උෂ්ණත්වය) වැඩි වී ඇති නිසා මේ සඳහා අන්තර්ජාතික ව එකතු වී ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වෙනවා. ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස, දියුණු රටවල් හා සැසඳීමේදී හරිතාගාර වායු විමෝචනය කරන්නේ ඉතාමත් අඩු මට්ටමක. 2010 වසරේදී ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල හරිතාගාර වායු විමෝචනය ටොන් 1.02ක් වූ අතර 2019 වසරේදී එහි ගෝලීය සමුච්චිත දායකත්වය 0.03%ක්. එහෙත් රටේ සංවර්ධන කටයුතු (කර්මාන්තශාලා, ආයෝජන) වැඩි වන විට විමෝචනය වැඩි වීමේ අවදානමක් තිබෙනවා. මේ තත්ත්වය පාලනය කෙරෙන්නේ මධ්‍යම පරිසර අධිකාරිය (CEA) වැනි ආයතනවල නියාමන (Regulations) ගැසට් පත්‍රිකාවලින් ප්‍රකාශයට පත් කිරීමෙන් හා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPL) වැනි දේ නිකුත් කරමින්.

අනාගතයේදී, විශේෂයෙන් ඇඟලුම් වැනි අපනයන කේන්ද්‍ර කරගත් කර්මාන්ත (Apparel Industry) ජාත්‍යන්තර වෙළෙඳ පොළ ඉලක්ක කරන විට ගැනුම්කරුවන්ගේ (Buyers) පරිසර අනුකූලතා පිළිබඳ නීතිරීති දැඩි වෙමින් පවතිනවා. යුරෝපා සංගමය (EU) වැනි විදේශීය පාර්ශ්ව විසින් පාරිසරික අවශ්‍යතා (environmental regulations) පනවනවා. මෙහිදී ආයතන කාබන් හා ජල පිය සටහන් සත්‍යාපනය කර තිබීම, පුනර්ජනනීය බලශක්ති භාවිත කිරීම සහ විමෝචන අඩු කිරීමේ ක්‍රියාකාරකම් සිදු කර ඇති බවට සාක්ෂි (evidence) සැපයීමට අවශ්‍ය වෙනවා.

අනාගතයේදී වෙළෙඳපොළේ රැඳී සිටීමටනම්, කර්මාන්තශාලාවලට පාරිසරික වශයෙන් හිතකර (environmentally friendly) ක්‍රියාකාරකම්වලට මාරු වීම අවශ්‍ය වෙනවා. නුදුරේදී සත්‍යාපන ක්‍රියාවලි ඒ සඳහා අනිවාර්ය වනු ඇති.

වර්තමානයේ සහ අනාගතයේ ඕනෑ ම නිෂ්පාදන හා සේවා අංශයකට ලාභය (Profit), ජනතාව (People) සහ පෘථිවිය/පරිසරය (Planet) යන අංශ තුන ම (සමාජමය, ආර්ථිකමය, පාරිසරිකමය) පිළිබඳ සැලකිලිමත් වීමට සිදු වෙනවා. මේ සංක්‍රාන්තියේදී ශ්‍රී ලංකා දේශගුණ අරමුදල පරිසරය සුරැකීම සඳහා පාරිසරික නීති රීතිවලට අනුගත වෙමින් ලෝක ප්‍රජාවට හා මානව සංහතියේ අභිවෘද්ධිය වෙනුවෙන් අසහාය කාර්යභාරයක් ඉටු කරනු ඇති.



# ජාතික සැලසුම්කරණයෙන් විසඳුම්




**ලීල් රන්දෙණි**
අධ්‍යක්ෂ
දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය


දේශගුණික විපර්යාස යනු ගෝලීය පාරිසරික ගැටලුවක් ලෙස පිළිගැනෙන නිසා ඒ සම්බන්ධ ප්‍රධාන වගකීම් සහ ක්‍රියාකාරකම් රැසක් අප වෙත පැවරෙනවා. මේ නිසා දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලයේ මූලික කාර්යභාරය වන්නේ ජාත්‍යන්තර දේශගුණික සම්මුති යටතේ ශ්‍රී ලංකාවේ ජාතික යුතුකම් ඉටුකිරීම.

එහිදී හරිතාගාර වායු (**Greenhouse Gases** - GHG) විමෝචනය අවම කිරීම සහ සිය ආර්ථිකය සඳහා අනුවර්තන උපායමාර්ග සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රජාවට වග කියන අතර ම දේශගුණික විපර්යාස සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති, ජාතික ක්‍රියාකාරී සැලසුම් සහ ව්‍යුහගත වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. එසේ ම දේශගුණික විපර්යාසවල බලපෑමට ගොදුරු විය හැකි ආර්ථික අංශ සහ ප්‍රජාව කෙරෙහි මෙන් ම දේශගුණික ප්‍රතිරෝධය (Climate Resilience) ඉහළ නැංවීමේ පියවර කෙරෙහිත් අවධානය යොමු කරනවා.

මෙහිදී පාර්ශ්වකරුවන්ගේ සහයෝගිතාව ඉතා වැදගත්. ඒ අනුව ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා පුළුල් ලෙස මෙහිදී සහභාගි වන්නේ සියලු ම පාර්ශ්වකාර ආයතන, ප්‍රජාව සහ පෞද්ගලික අංශය. රජයේ ආයතන, සිවිල් සංවිධාන, ශාස්ත්‍රීය ආයතන (Academia) සහ පෞද්ගලික අංශය (වාණිජ මණ්ඩල වැනි) සමඟ කටයුතු කිරීමට පොදු වේදිකාවක් භාවිත කරනවා.

හරිතාගාර වායු අඩු කිරීම/ඉවත් කිරීම (Mitigation) සහ අනුවර්තනය (Adaptation) සඳහා සහයෝගය ලබා ගැනීමට සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින ජාතීන් ඇතුළු ගෝලීය ප්‍රජාවෙන් අපට ලැබෙන සහායත් මෙහිදී වැදගත්. ප්‍රධාන වශයෙන් පැරිස් ගිවිසුම ඔස්සේ ලැබෙන දේශගුණික මූල්‍යකරණය (Climate Finance), තාක්ෂණ හුවමාරුව සහ ධාරිතා වර්ධනය මීට ඇතුළත්.

ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම්වලට ඉතා සංවේදීයි. 2017 සහ 2019 අතර අඛණ්ඩ ව ඇති වූ ගංවතුර වැනි දරුණු සිදුවීම් හේතුවෙන් ගෝලීය දේශගුණික අවදානම් දර්ශකයේ (Global Climate Risk Index) ශ්‍රී ලංකාව ඉහළ ම දස දෙනා අතර ශ්‍රේණිගත කර තිබෙනවා. මෙහිදී නිරීක්ෂණය කළ හැකි දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් අතර අන්ත දේශගුණික තත්ත්ව කැපී පෙනෙනවා. නිතර ගංවතුර ඇතිවීම සහ වැසි රටා වෙනස්වීම නිසා කැලණි ගඟ, කළු ගඟ පිටාර ගැලීම නිතර සිදු වන්නක්. දීර්ඝ නියඟ හේතුවෙන් ජල හිඟය ඇතිවීම, වී සහ අනෙකුත් භෝගවලට බලපෑම් ඇති කිරීම සුලබ ව සිදු වෙනවා. වියළි කලාප වඩාත් වියළි වීමත් තෙත් කලාප වඩාත් තෙත් වීමත් ප්‍රාදේශීය ව සිදු වන වෙනස්වීම්. වෙරළ ඛාදනය වැඩිවීම, මුහුදු ජලය ඇතුළු වීම (Freswater ප්‍රභවවල ලවණතාවට හේතු වීම), මුහුදු දියවැල්වල වෙනස්වීම්, මධ්‍යම කඳුකරයේ පාංශු ඛාදනය සහ නායයෑම් වැඩිවීම දේශගුණික විපර්යාසවල තවත් අහිතකර තත්ත්ව.

දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ (UNFCCC) සහ පැරිස් ගිවිසුමේ ජාතික සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කරන්නේ පරිසර අමාත්‍යාංශය. 2013 වසරේදී ජාතික දේශගුණික ප්‍රතිපත්තිය අප සකස් කර එය 2020 වසරේදී යාවත්කාලීන කර තිබෙනවා. 2016 වසරේ සිට පැරිස් ගිවිසුමේ පාර්ශ්වකරුවෙකු ලෙස ශ්‍රී ලංකාව ගෝලීය හරිතාගාර වායු විමෝචනය අඩු කර ගැනීමට සහ දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීමට පියවර ගත්තා. මෙහිදී ජාතික ව නිර්ණය කරන ලද දායකත්ව (Nationally Determined Contributions -NDC) සැලැස්මක් අප සකස් කර එය 2016, 2021 වසරවලදී යාවත්කාලීන කළා. එහි තුන් වැනි යාවත්කාලීන කිරීම කළේ 2025 සැප්තැම්බර් මාසයේදී.


වී සහ අනෙකුත් භෝගවලට බලපෑම් ඇති කිරීම සුලබ ව සිදු වෙනවා. වියළි කලාප වඩාත් වියළි වීමත් තෙත් කලාප වඩාත් තෙත් වීමත් ප්‍රාදේශීය ව සිදු වන වෙනස්වීම්. වෙරළ ඛාදනය වැඩිවීම, මුහුදු ජලය ඇතුළු වීම (Freswater ප්‍රභවවල ලවණතාවට හේතු වීම), මුහුදු දියවැල්වල වෙනස්වීම්, මධ්‍යම කඳුකරයේ පාංශු ඛාදනය සහ නායයෑම් වැඩිවීම දේශගුණික විපර්යාසවල තවත් අහිතකර තත්ත්ව.


ශ්‍රී ලංකාවේ වත්මන් ඉලක්කය වන්නේ පෙර ඉලක්කය වූ 14.4% සිට 2035 වන විට හරිතාගාර වායු විමෝචනය 20.09%කින් අඩු කිරීම. මේ සඳහා හරිතාගාර වායු අවම කිරීමේ ක්ෂේත්‍ර ලෙස විදුලිය (බලශක්තිය), ප්‍රවාහනය, කර්මාන්ත, කසළ කළමනාකරණය, වනාන්තර හා කෘෂිකර්මාන්තය යන ක්ෂේත්‍ර 06ක් ද අනුහුරුවීමේ ක්ෂේත්‍ර ලෙස කෘෂිකර්මාන්තය, ධීවර, පශු සම්පත්, ජලය, ජෛව විවිධත්වය, වෙරළබඩ හා සමුද්‍ර, සෞඛ්‍ය, නාගරික සැලසුම්කරණය හා මානව ජනාවාස, සංචාරක හා විනෝදාස්වාදය යන ක්ෂේත්‍ර 09ක් සහ අලාභ හානි ක්ෂේත්‍ර ඇතුළත් වෙනවා.



එසේ ම හරිතාගාර වායු අවම කිරීමට හෝ ඊට අනුවර්තනය වීමට නොහැකි දරුණු ප්‍රතිවිපාක ඇති බව ද අප පිළිගත යුතුයි. විමධ්‍යගත සැලසුම්කරණයත් අපේ කාර්යභාරයට අයත්. ඒ යටතේ ජාතික අනුවර්තන සැලසුම් (NAPs), පළාත් නවයේ ම පළාත් දේශගුණික අනුවර්තන සැලසුම් (PCAP) ක්‍රියාත්මක වෙනවා.

ගෝලීය දේශගුණික සමුළු (COP) සමග අපගේ මැදිහත්වීම ඉතා සුවිශේෂයි. පාර්ශ්වකරුවන්ගේ සමුළුව (COP) යනු සාමාජික රටවල් 198ක නියෝජිතයන් පැරිස් ගිවිසුම ක්‍රියාත්මක කිරීම, සමාලෝචනය කිරීම සඳහා සාමාන්‍යයෙන් සති දෙකක් සඳහා රැස්වන ස්ථානය. මෙවර පැවැත්වෙන්නේ 30 වැනි ගෝලීය දේශගුණික සමුළුව (COP 30). ඊට සහභාගි වන රටවල් ඔවුන්ගේ දේශගුණික ක්‍රියාමාර්ගවල ප්‍රගතිය ඉදිරිපත් කර සමාලෝචනය කරන අතර විමෝචන දත්ත ලැයිස්තුගත කිරීම, නිර්මාණය කිරීම සහ ජාතික ව නිර්ණය කරන ලද දායකත්ව (Nationally Determined Contributions -NDC) සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ඵලදායිතාව සමාලෝචනයත් සිදු කරනවා.

මෙහිදී රටවල් ඔවුන්ගේ හොඳම භාවිතයන් සහ ලද අත්දැකීම් හුවමාරු කර ගන්නා අතර ම තවදුරටත් ජාත්‍යන්තර සහයෝගය (මූල්‍ය, තාක්ෂණික) අවශ්‍ය ක්ෂේත්‍ර පිළිබඳ සාකච්ඡා කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා. සම්මුතිවල තාක්ෂණික හා නීතිමය අංග සාකච්ඡා කර අවසන් කිරීම සඳහා ද්විපාර්ශ්වික සාකච්ඡා, වට මේස සහ ඉහළ මට්ටමේ පූර්ණ සැසි පවත්වන මේ සමුළුවේදී ශ්‍රී ලංකා දූත පිරිස් සක්‍රිය ව සහභාගී වී විවිධ වගන්ති සහ තීරණ සඳහා තොරතුරු සපයමින් සහ විවාද කරමින් ඊට දායක වෙනවා. ප්‍රධාන ගෝලීය තීරණ බොහෝ විට COPවලදී අවසන් වෙනවා. උදාහරණයක් ලෙස, අලාභ හා හානි අරමුදල (Loss and Damage Fund) පිහිටුවීම ඩුබායිහි පැවති COP 28 (2023)හිදී ගත් වැදගත් තීරණයක්. දේශගුණික මූල්‍යකරණය සඳහා පෞද්ගලික අංශය ඉතා වැදගත්. ආයෝජන සංසදවලට සහ කාබන් වෙළෙඳ යාන්ත්‍රණ (පැරිස් ගිවිසුමේ 6 වැනි වගන්තිය) පිළිබඳ සාකච්ඡාවලට ශ්‍රී ලංකාව සහභාගි වෙනවා.

ආයතනික ව්‍යුහ ශක්තිමත් කිරීම, ජාත්‍යන්තර දේශගුණික මූල්‍යකරණය සහ තාක්ෂණික සහයෝගිතාව මත ශ්‍රී ලංකාවේ අනාගත සැලසුම් සහ මාර්ග සිතියම සකස් ව තිබෙනවා. මෙහිදී පියවර ගෙන තිබෙන්නේ ඉහළ මට්ටමේ තීරණ ගැනීම සඳහා අන්තර් අමාත්‍යාංශ කමිටු (පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සභාපතිත්වය දරන) ඇතුළු ව ශක්තිමත් ආයතනික රාමුවක් ස්ථාපිත කිරීමට. අංශ ක්‍රියාකාරී සැලසුම් සහ ඇගයීම් කමිටු නිරන්තරයෙන් (මාස හයකට වරක්) රැස්වී NDCs සහ NAPsවල ප්‍රගතිය සමාලෝචනය, පරතර හඳුනා ගැනීම සහ සම්බන්ධීකරණය සහතික කරනවා.

ශ්‍රී ලංකාවට සමාන ආර්ථික හා සමාජ අවදානම්වලට මුහුණදෙන අප්‍රිකාව, ලතින් ඇමරිකාව සහ ආසියාවේ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් සමග දකුණු-දකුණු සහයෝගිතාවේ නිරත වීමත් විශේෂිත තත්ත්වයක්. ගෝලීය විමෝචනයට අවම වශයෙන් දායක වුවත් දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම්වලින් දැඩි ලෙස පීඩාවට පත් වූ සංවර්ධනය වෙමින් පවතින රටවල් 64කින් යුත් කණ්ඩායමක් වන දේශගුණික අවදානමට ලක්විය හැකි සංසදය (Climate Vulnerable Forum-CVF)හි ශ්‍රී ලංකාව සාමාජිකයෙක්.

ශ්‍රී ලංකාව NDCs සහ NAPsවලින් වෙනස් වන දේශගුණික සමෘද්ධි සැලැස්ම (CPP) සකස් කර තිබෙනවා. මෙහි අවධානය යොමු කරන්නේ දේශගුණික විපර්යාසවලට අනුහුරු වීම සහ සමෘද්ධිය ඉහළ නැංවීම සඳහා ක්ෂණික ව අරමුදල් ලබා ගැනීමට සූදානම් ව ඇති විශේෂිත 'ප්‍රමුඛතම ව්‍යාපෘති' (Flagship Projects) සංකල්ප සහ යෝජනා සඳහා. එහිදී හරිත දේශගුණික අරමුදල (GCF), අනුවර්තන අරමුදල (Adaptation Fund), විශේෂ දේශගුණික අරමුදල ඇතුළු ප්‍රධාන දේශගුණික අරමුදල් වෙත ශ්‍රී ලංකාව සක්‍රිය ව යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. නව අලාභ හා හානි අරමුදලට ද යෝජනාවක් ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබෙනවා.

ශ්‍රී ලංකාව ද්විවාර්ෂික විනිවිදභාවය පිළිබඳ වාර්තා (BTRs) සකස් කිරීමෙන් සිදු කරන්නේ ජාත්‍යන්තර විනිවිදභාවය සුරක්ෂිත කිරීම. එහි පළමුවැන්න 2024 දෙසැම්බර් 31 වන දිනට සකස් කළා. දෙවැන්න 2026 වසරේදීත් ජාතික සන්නිවේදනයන් (NCs) 2027 වසරේදීත් සැකසීමට නියමිතයි. මේ වාර්තාවලින් ප්‍රගතිය ඇගයීම, ලැබුණු ජාත්‍යන්තර සහයෝගයේ (මූල්‍ය, තාක්ෂණ, ධාරිතාව) ප්‍රමාණවත් බව තක්සේරු කිරීම සහ අරමුදල් ඵලදායි ලෙස භාවිත කිරීම සහතික කරනවා.

මෙලෙස ශ්‍රී ලංකාවේ අඛණ්ඩ කාර්ය ඔස්සේ පෙන්නුම් කරන්නේ ප්‍රතිපත්ති සම්පාදනයේ සිට ක්‍රියාකාරී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ජාත්‍යන්තර වගවීම දක්වා සිය ජාතික සැලසුම්කරණයට, දේශගුණික ක්‍රියාකාරකම් ඒකාබද්ධ කිරීමට කැප වූ උත්සාහය.



# තුන් කල් දුටු මිනිසුන්ගේ නිහඬ හඬ

ප්‍රියාන් ආර් විජේබණ්ඩාර

"ආදරණීය සහෝදර සහෝදරියනි, අද මේ මංගල රැලිය මා අමතන්නේ මරණ වරෙන්තුව අතේ තබාගෙන. සුදු අධිරාජ්‍යවාදීන් අපගේ මාතෘ භූමිය බලහත්කාරයෙන් අත්පත් කර ගැනීමෙන් පසුව කන්ද උඩරට අඩි 5000ට වඩා උස භූමිය කපා විනාශකොට තේ වගා කළා. ඉන්පසුව කළු සුද්දෝ ඉතිරි වනාන්තර ටිකත් කපා මහා විනාශයක් සිදුකරමින් ඉන්නවා. මේ මහා විනාශය නැවැත්තුවේ නැතිනම් දශක තුනක් හතරක් ඉදිරියට යද්දී නායයාම්, සෝදාපාළුව, ගං වතුර, කඳු කඩා වැටීම්වලින් ජන සංහාරයක් සිදුවෙනවාමයි.

මේ මාතෘ භූමියේ භූගෝලීය තත්ත්වය හමුවේ ස්වාභාවික පරිසරයේ සමතුලිතභාවය රැකීමටනම් අනිවාර්යයෙන් අඩි 5000ට වඩා උස භූමිය වන වගා කළ යුතුයි. කළු සුද්දනි, මේ මහා විනාශය දැන්වත් නවත්තපල්ලා. තොපි එසේ නොකළහොත් එදාට මා ජීවතුන් අතර සිටින්නටත් නොසිටින්නටත් පුළුවන්. නමුත් නායයාම්වලින්, කඳු කඩා වැටීම්වලින් සිය දහස් ගණන් ජනයා මිය යාම වළක්වාලන්න බැහැ"

අදින් වසර 55කට පෙරාතුව එනම් 1970 වසරේදී කොළඹ හයිඩ් පිටියේදී මේ ප්‍රකාශය කරන ලද්දේ ජවිපෙ නිර්මාතෘ රෝහණ විජේවීර විසින්. එයින් වසර 19කට පසු 1989 මෙවැනි නොවැම්බරයකදී ඔහු ඝාතනයට ලක් වුණා. ඒ, අදින් වසර 36කට පෙරාතුව.

නොබෝද පැවති දේශගුණ විපර්යාස පිළිබඳ සමුළුවේ ආරම්භය සනිටුහන් කරමින් බ්‍රසීල ජනාධිපති ලුයිස් ඉනාසියෝ ලූලා සිය කතාවේදී මෙසේ කියා සිටියා.

"අපි නිවැරදි දිශාවට ගමන් කරනවා, නමුත් වැරදි වේගයකින්."

ලෝකයේ සංවර්ධනය පිළිබඳ පවත්නා ලිබරල් ධනේශ්වර දෘෂ්ටිවාදය යනු සීමිත පිරිසකගේ උපරිම තෘප්තිය වෙනුවෙන් ලෝකයේ අනාගත පරම්පරාව බිලි දීම. සාමූහික අරගලයකින් මිස ඊට පිළියම් තිබිය නොහැකියි.

"සංක්‍රාන්තියේ ආර්ථික විද්‍යාව අවිවාදිතයි. ලෝකයේ ප්‍රධාන බලශක්ති ප්‍රභවය ලෙස පුනර්ජනනීය බලශක්තිය දැනටමත් ගල් අඟුරු අභිභවා ගොස් තිබෙනවා. දැන් අභිලාෂය සංයුක්ත ක්‍රියාවක් බවට පත් කිරීමට කාලයයි. බහුපාර්ශ්විකත්වය තවමත් ප්‍රතිඵල ලබා දෙන බව අප ලෝකයට පෙන්වන්නේ එලෙසයි." ලූලා එහිදී වැඩිදුරටත් සඳහන් කරන්නේ එය.

එහෙත් මේ, දේශගුණ විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර සමුළුව ගැනවත් බ්‍රසිල ජනාධිපති ලූලා ගැනවත් නොවෙයි. දශක ගණනාවකට ඉහතදී අධිරාජ්‍යවාදීන්ගේ හෝ ධනේශ්වර පංතියේ අවිධිමත් සංවර්ධන සැලසුම්, ඊනියා සංවර්ධන වැඩසහන් මානව සංහතියේ පැවැත්මට තර්ජනයක් විය හැකි අන්දම පෙන්වා දුන් තුන් කල් දුටු මිනිසා ගැන. ඒ මිනිසා ඇතුළු දහස් ගණනක් වධ හිංසා පමුණුවා අමු අමුවේ අකාලයේ ඝාතනය කළ ඉතිහාසය ගැන. එකී කෲරතර සිදුවීම් ජාලයක කූටප්‍රාප්තිය සලකුණු කළේ 1989 නොවැම්බර් 13 දින.

1989 නොවැම්බර් 12 දින දහවල් 1.00ට පමණ බ්‍රිගේඩියර් ජානක පෙරේරා සහ කර්නල් ගාමිණී හෙට්ටිආරච්චි ඇතුළු හමුදා කණ්ඩායමක් ජවිපෙ නිර්මාතෘ රෝහණ විජේවීර උලපනේදී අත්අඩංගුවට ගත්තා. 'ඔබ්ස් කොම්බයින්' විශේෂ හමුදා කණ්ඩායම ප්‍රථමයෙන් පැමිණියේ ගලහ නිවෙසට. උදෑසන නිවෙසින් බැහැර යෑමට සූදානම් ව සිටි පියදාස රණසිංහ, එච්.බී. හේරත් එහිදී අත්අඩංගුවට පත්වුණා. පස්වරු 1.00 පමණ වන විට ඔවුන් උලපනේ සෙන්ට් මේරිස්හි විජේවීර පදිංචි ව සිටි නිවෙසට පැමිණියේ හමුදා භටයකු විසින් පදවනු ලැබූ පියදාස රණසිංහ පාවිච්චි කළ මෝටර් රථයෙන්. එම මෝටර් රථය නිවසේ අයට අමුත්තක් වුණේ නැහැ. විජේවීර අත්අඩංගුවට ගැනීම සහ ඉනික්බිති ව සිදු වූ ඔහුගේ මරණය දක්වා වූ සිදුවීම් දැන් මෙරට ජනයාට තවදුරටත් සැඟවිය හැකි කාරණා නොවෙයි.

ගම්පොළ උලපනෙන් පිටත් ව එවක ජවිපෙ ලේකම්වරයා වූ උපතිස්ස ගමනායක බණ්ඩාරගම මහවිල නිවෙසට පැමිණියේ 11 දින රාත්‍රියේදී. 12 දින උදෑසන ඔහු නිවෙසින් පිටත් ව ගියේ යොදාගෙන තිබූ පක්ෂයේ කිසියම් සාකච්ඡාවක් සඳහා. දහවල් ඔහු නැවත නිවෙසට පැමිණෙන විට වෙලාව දහවල් 1.00 පමණ වන්නට ඇති. දිවා ආහාර ගැනීමෙන් පසු නිවෙසින් පිටත් ව යෑමට ඔහු තීරණය කර තිබුණා. ගමනායකගේ බිරිය කරුණා පවසා තිබූ අන්දමට ඔහු එදින සිට ඇත්තේ කැළඹීමෙන්.

> 1987 වසරේදී ජවිපෙට එරෙහි ව ආරම්භ වූ සාහසික මර්දනයේදී පක්ෂයේ නායක රෝහණ විජේවීර ඇතුළු දේශපාලන මණ්ඩලය සමඟ ඉතා සමීප ඇසුරක් පැවැත්වූ තිදෙනෙකු 1989 ඉල්මහේ මහා සංහාරයට කලකට පෙර ඝාතනය කෙරුණා. මෙයින් විජේවීර සහ ගමනායක ඇතුළු දේශපාලන මණ්ඩලය රැස්වන බණ්ඩාරවෙල සහ ගලහ නිවෙස් දැනසිටි දේශපාලන මණ්ඩල සභිකයෙකු වූ පී.ඩී.එන්. විජේනායක නොහොත් සුමිත් අතුකෝරාල ප්‍රථමවරට ඝාතනයට ලක්වූ අයෙක්. ඒ වනවිට සුමිත් අතුකෝරාල රට වටා යමින් ජවිපෙ සංවිධානය කරමින් සිටියා. 1988 අගෝස්තු මස පුත්තලම ලුණුවිල දෙමටපිටියේදී පාවාදෙන්නෙකුගේ තොරතුරක් මත අත්අඩංගුවට ගත් ඔහු වධ හිංසනයට ලක්කොට ඝාතනය කර සිරුර බඩල්ගම මහඔය පාලමෙන් විසි කර දමා තිබුණා. ඒ, 1988 සැප්තැම්බර් 4 දින.

සෝමවංශ අමරසිංහ පක්ෂ තහනමින් පසු 'සිරි අයියා' නම භාවිත කර පසුව එම නම ද ඉවත් කර 'රිචඩ්' යන නම භාවිත කරමින් සිටියා. 11 දින නිවෙසට පැමිණි අවස්ථාවේ ගමනායක සිය බිරිඳ කරුණා සමඟ පවසා ඇත්තේ දින කිහිපයකින් ම රිචඩ් ගැන ආරංචියක් නැති බව.

"එහෙනම් ඇයි තවත් බල බල ඉන්නේ මෙතැනින් ඉවත් වෙන්න ඕන නේදැයි" කරුණා විමසා තිබෙනවා.

ගමනායක ඊට පිළිතුරු දී ඇත්තේ තමා හෙට දවසේ පිට ව යෑමට තීරණය කර ඇති බව. 12 දින දහවල් කාලයේ පිටතට ගොස් නැවත පැමිණි ගමනායක පසුදින ප්‍රදේශයෙන් පිටත් ව යෑම සඳහා සූදානම් වෙමින් සිටියා.

සිවිල් ඇඳුමෙන් සැරසුණු ආරක්ෂක අංශ සාමාජික පිරිසක් ඔවුන්ගේ නිවෙසට කඩා වැදුණේ ඒ මොහොතේ. නිවෙසේ සිටියේ ගමනායකත් බිරියත් අත්උදව්වට සිටි පුෂ්පිකාත් පමණයි. නව හැවිරිදි දියණියත් හය හැවිරිදි පුතාත් ඒ වනවිට සිටියේ අමතර පන්ති පැවැත්වෙන නිවෙසකට ගොසින්. ආරක්ෂක අංශ නිවෙසට ඇතුළු වන විට කරුණා එම පිරිස අතරින් එළියට ගියේ නිවෙසේ පවත්වාගෙන ගිය කඩෙන් බඩු ගැනීමට පැමිණි කාන්තාවක ලෙස.

දඩයම ලුහුබැඳ ගිය පිරිස කරුණාගේ ඉවතට යෑම ගැන සැලකිල්ලක් දැක්වූයේ නැහැ. කරුණා නොපෙනී ගියා. ඩයස් මුදලාලි යනුවෙන් පානදුර මහවිල ප්‍රදේශයේ පෙනී සිටි උපතිස්ස ගමනායක අත්අඩංගුවට පත් වූයේ එලෙස. හමුදාව පිටත් ව ගියේ ගමනායකගේ මෝටර් රථයේ ම ඔහු ව නංවාගෙන.

1987 වසරේදී ජවිපෙට එරෙහි ව ආරම්භ වූ සාහසික මර්දනයේදී පක්ෂයේ නායක රෝහණ විජේවීර ඇතුළු දේශපාලන මණ්ඩලය සමඟ ඉතා සමීප ඇසුරක් පැවැත්වූ තිදෙනෙකු 1989 ඉල්මහේ මහා සංහාරයට කලකට පෙර ඝාතනය කෙරුණා. මෙයින් විජේවීර සහ ගමනායක ඇතුළු දේශපාලන මණ්ඩලය රැස්වන බණ්ඩාරවෙල සහ ගලහ නිවෙස් දැනසිටි දේශපාලන මණ්ඩල සභිකයෙකු වූ පී.ඩී.එන්. විජේනායක නොහොත් සුමිත් අතුකෝරාල ප්‍රථමවරට ඝාතනයට ලක්වූ අයෙක්. ඒ වනවිට සුමිත් අතුකෝරාල රට


රෝහණ විජේවීර


උපතිස්ස ගමනායක


දයා වන්නිආරච්චි


ලයනල් බෝපගේ

වටා යමින් ජවිපෙ සංවිධානය කරමින් සිටියා. 1988 අගෝස්තු මස පුත්තලම ලුණුවිල දෙමටපිටියේදී පාවාදෙන්නෙකුගේ තොරතුරක් මත අත්අඩංගුවට ගත් ඔහු වධ හිංසනයට ලක්කොට ඝාතනය කර සිරුර බඩල්ගම මහඔය පාලමෙන් විසි කර දමා තිබුණා. ඒ, 1988 සැප්තැම්බර් 4 දින.

තිස්සමහාරාමයේ නන්දතිලක ගලප්පත්ති, පක්ෂය බිහි කළ ඉහළ ම බුද්ධිමය පරිචයක් ඇති අධ්‍යාපන අංශයේ ඉදිරිපෙළ නායකයෙක්. 1989 මැද භාගයේදී කෑගල්ල දිසා කම්ටුව රඹුක්කනදී රැස්වූ අවස්ථාවකදී එය වැටලූ ආරක්ෂක අංශ ඔවුන්ට යටත්වන ලෙස නියෝග කළ ද යටත් නොවී සටන් කිරීම නිසා එහි සිටි පිරිසෙන් 5 දෙනෙකු එම ස්ථානයේදී ඝාතනයට ලක්වුණා. එසේ යටත් නොවී සටන් වැදුණු පිරිස අතර නන්දතිලක ගලප්පත්ති ද සිටියා. පසුව ඔහු මත්තේගොඩ හමුදා කඳවුරට රැගෙනවිත් ඝාතනය කර තිබුණේ දෙතිස් වධ බන්ධනයට යටත්කොට.

ජවිපෙ දේශපාලන මණ්ඩලය නියෝජනය කළ පී.බී විමලරත්න නොහොත් ටිරින්කෝ විමල්, 1989 සැප්තැම්බර් 12 දින බදුල්ලේ සිට බසයකින් කොළඹට පැමිණෙමින් සිටියදී ලැබුණු ඔත්තුවකට අනුව 'ප්‍රා' සංවිධානයේ පිරිසක් බස්රථය මහමග නවත්වා ඔහු පැහැර ගත්තා. මේ පැහැරගැනීමෙන් පසු ආරක්ෂක අංශ වෙත බාර දී ඇති ඔහු ද ඔහුගේ බිරිඳ ද පසුව ඝාතනයට ලක්වුණා.

ජවිපෙ නායකත්වය රහසිගත ව ජීවත්වූ ස්ථානය පවා දැනසිටි මොවුන් කුරිරු වධ බන්ධනයට ලක් වුව ද උතුම් අමුණක් වෙනුවෙන් සංවිධානය වූ තම සගයන් පිළිබඳ ව කිසිදු තොරතුරක් අනාවරණය නොකොට නිහඬ ව ම මරණය වැලඳ ගත්තා.

අඳුරු වලාකුළුවලින් ඔබ්බට හිරු බබළන බවත් අඳුරු වලාකුළු පහ ව යන බවත් අපි විශ්වාස කරනවා. ඒ වගේ ම අන්ධකාරය මැද දීප්තිමත් රිදී රේඛා නිශ්චිත ව ම පායන බවත් අප විශ්වාස කරනවා. අපි යන මේ ගමනේදී සතුරන්ගේ වියරු කෑගැසීම් අපට නෑසෙන බවත් රටේ පුරවැසියන්ගේ අධිෂ්ඨානශීලී බලාපොරොත්තු සහගත දෑස් පමණක් අපට පෙනෙන බවත් සිහිපත් කරනවා.

රටේ සැබෑ නිදහස සහ යහපත් අනාගතයක් උදාකිරීම වෙනුවෙන් ජීවිතයෙන් වන්දි ගෙවූ ජවිපෙ නිර්මාතෘ රෝහණ විජේවීර ඇතුළු දහස් සංඛ්‍යාත මිනිසුන්ගේ සිහිනය, යථාර්ථයක් බවට පත් කරමින් ජවිපෙ ප්‍රමුඛ ජාතික ජනබලවේගය වඩා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රතිසංස්කරණ ඔස්සේ රට ස්ථාවර කරමින් සංවර්ධනයේ දිගු අරමුණ කරා ගමන් කරමින් සිටිනවා.

ජනාධිපති අනුර කුමාර දිසානායක නොබෝද 2026 අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත්කොට එකී කතාව අවසන් කළේ මෙලෙස.


“ඉතිහාසයේ වේදනාබර සිදුවීම් අපට කියන්නේ මේ රට ගොඩනගන්න කියලා. අහිමිවීම්, නොසලකාහැරීම්, පීඩා, තර්ජන, ගර්ජන පිරි අතීතය අපිට කියන්නේ මේ රට ගොඩනගන්න කියලා.

සැබෑ ආඩම්බරයකින් කතා කරන්න බැරිවුණා. නමුත්, අනාගත පරම්පරාව ඒ ඛේදවාචකයෙන් මුදවා ගත යුතුයි. වඩා ලස්සන රටක් වෙනුවෙන් තමන්ගේ සෑම සිහිනයක් ම කැප කරමින්, ඒ ලස්සන රට බිහිවෙන්නට පෙර මියගිය සෑම හදවතක ම ප්‍රාර්ථනාව තිබුණේ මේ රට ලස්සන රටක් කරනවා දකින සිහිනය. අපි දෙවුර මතට ගෙන තියෙන්නේ ඒ පවිත්‍ර මිනිස්සුන්ගේ මරණාසන්න ප්‍රාර්ථනා. ඒ ප්‍රාර්ථනා දේව වාක්‍ය තරම් වුවමනාවකින් අපි ඉටුකරනවා.

අඳුරු වලාකුළුවලින් ඔබ්බට හිරු බබළන බවත් අඳුරු වලාකුළු පහ ව යන බවත් අපි විශ්වාස කරනවා. ඒ වගේ ම අන්ධකාරය මැද දීප්තිමත් රිදී රේඛා නිශ්චිත ව ම පායන බවත් අප විශ්වාස කරනවා. අපි යන මේ ගමනේදී සතුරන්ගේ වියරු කෑගැසීම් අපට නෑසෙන බවත් රටේ පුරවැසියන්ගේ අධිෂ්ඨානශීලී බලාපොරොත්තු සහගත දෑස් පමණක් අපට පෙනෙන බවත් සිහිපත් කරනවා. ”

88-89 යුගයේ උතුම් අරමුණක් වෙනුවෙන් දිවි පිදූවන්ට සැබෑ කෘතගුණ දැක්විය හැක්කේ ඔවුන් සිහිකර ගුණ වැයීමෙන් නොව ඔවුන් පැතූ ලෝකය ගොඩනැගීමෙන්. ජනාධිපතිවරයා ප්‍රමුඛ වත්මන් ආණ්ඩුවට පැවරී ඇත්තේ එකී වගකීම. අප ද රට ගොඩනැගීමේ එකී සත් කාර්යයේ කොටස්කරුවන් බැව් අමතක නොකළ යුතුයි.

# මනසෙන් මාධ්‍යයට මාධ්‍යයෙන් මනසට



**නුවන් කුමාර කටුගම්පල**

ලෝක මානසික සෞඛ්‍ය දිනය (ඔක්තෝබර් 10) මෙවර සැමරුණේ, ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) ප්‍රකාශයට පත් කළ පරිදි 'හදිසි මානුෂීය අවශ්‍යතාවලදී මානසික සෞඛ්‍ය' (Mental Health in Humanitarian Emergencies) යන තේමාවෙන්. මේ සැමරුම ආරම්භ වුණේ 1992 වසරේදී ලෝක මානසික සෞඛ්‍ය සම්මේලනය මූලික වීමෙන්. එය මානසික සෞඛ්‍ය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම, ඒ පිළිබඳ සමාජයේ පවතින ඍණාත්මක සහ අපකීර්තිමත් ස්වභාවය අවම කිරීම සහ ගුණාත්මක මානසික සෞඛ්‍ය සේවාවක් සඳහා ප්‍රවේශ වීම වෙනුවෙන් පෙනී සිටීමත් සඳහා වන ගෝලීය ව්‍යාපාරයක්.

ලෝකයේ සිදුවන ස්වාභාවික විපත්, සන්නද්ධ ගැටුම්, වසංගත රෝග, ආර්ථික අර්බුද සහ විවිධ බේදවාචක යනාදියෙන් එල්ල වන පීඩන හේතුවෙන් ඔවුන්ගේ ජීවිතවලට භෞතික ව මෙන් ම චිත්තවේගී ව ඇති කරන්නේ දැඩි අහිතකර බලපෑම්. මෙවැනි බලපෑම්වලට ලක්වන ජනතාවගෙන් අවම වශයෙන් 1/4ක් මානසික අවපීඩනය, විෂාදය හෝ පශ්චාත් කම්පන ආතතිමය ආබාධවලට හෝ ගොදුරු වනවා. ශ්‍රී ලංකාවේත් 1988-89 භීෂණ සමය, තිස් අවුරුදු යුද්ධය, කොවිඩ් වසංගතය සහ ආර්ථික අර්බුදය මෙන් ම පවුලෙන් සහ සමාජයෙන් එල්ල වන තර්ජනවලට පුද්ගලික ව යටපත්වීම වැනි හේතු නිසා ආතතිය සහ විෂාදය වැනි තත්ත්වවලට ගොදුරු වී සියදිවි හානි කරගත් අවස්ථා පවා වාර්තා වනවා.

රජයට මෙන් ම ප්‍රජාවට මෙහිදී ප්‍රධාන කාර්යභාරයක් පැවරෙනවා. එනම් ව්‍යසනයකින් පසු ඊට මුහුණ දුන් අය බලගැන්වීම සඳහා ඔවුන් තුළ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම, ප්‍රකෘතියට පත්වන තුරු මානසික අවශ්‍යතා පිළිබඳ අවධානය යොමු කරලීම සහ ඔවුන් අත්හැර නොයාම. පූර්ව සූදානම, ආපදාව වළක්වා ගැනීම සහ ආපදාවට හසු නොවී සිටීම සඳහා ක්‍රියාත්මක වීම, ආපදාවට ලක් වීමෙන් සිදු වූ කම්පන තත්ත්වයට හොඳින් මුහුණ දීම, ඔවුන්ගේ ජීවිත නැවත ගොඩනැඟීම, පුනරුත්ථාපනය, දේපොළ වත්කම් අහිමිවීමකදී ඒවා ප්‍රතිසංස්කරණය හෝ අලුත්වැඩියා කිරීම, මානසික ගැටලු වර්ධනය වීම වැළැක්වීම යනාදී සෑම අදියරකදී ම මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජීය සහයෝගය ලබා දීම ද අවශ්‍යතාවක්.

හදිසි අවස්ථාවලදී මානසික සෞඛ්‍ය සේවා සැපයීමට ස්ථාවර යාන්ත්‍රණයක් වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති සහ සැලසුම් මෙතෙක් සකස් වී නැති නිසා සාම්ප්‍රදායික ලෙස ලෝක මානසික සෞඛ්‍ය දිනය සැමරීමෙන් ඔබ්බට ගොස් ජාත්‍යන්තරය සමඟ සම්බන්ධ වී ශ්‍රී ලංකාවට ඔරොත්තු දෙන මානසික සෞඛ්‍ය සේවාවක් ස්ථාපිත කිරීමට සහ මානසික සෞඛ්‍යයේ වැදගත්කම මහජන මනසේ තැන්පත් කිරීමට රජය අපේක්ෂා කරනවා. මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඇතුළු රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල එකමුතුවෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහයෝගය ඇති ව ශ්‍රී ලංකාවේ මානසික සත්කාරක සේවා දිස්ත්‍රික් මට්ටමින් විමධ්‍යගත කිරීම, අදාළ අංශවල මානව සහ භෞතික සම්පත් ධාරිතාව වැඩි කිරීම, මානසික සෞඛ්‍ය අංශ සමඟ සම්බන්ධතා ඇති කර ගැනීමට මහජනයාට පහසුකම් වැඩි කිරීම යනාදී ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා.

ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනයේ ස්ථාපිත 1926 දුරකතන අංකය ඔස්සේ ඇමතුම් සේවාව (Hotline), SMS සේවාව සහ 0755551926 වට්ස්ඇප් කෙටි පණිවුඩ හුවමාරු චැට් සේවාව (WhatsApp Chat Service) තවදුරටත් ව්‍යාප්ත කිරීම මේ වෙනුවෙන් සාධනීය එළැඹුමක්. දිනකට ඊට ලැබෙන මහජන ඇමතුම් සංඛ්‍යාව වේගයෙන් වර්ධනය වීම මානසික ගැටලු නිරාකරණය සහ මානසික සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ මෙරට මහජන අවධානය සහ පිළිගැනීම වර්ධනය වී ඇති බවට සාක්ෂ්‍යයක්. 2025 වර්ෂයේ ගතවූ මාස 10ක කාලයේ පමණක් ඊට ලැබුණු අමතුම් අතරින් ප්‍රතිචාර දක්වා ලියාපදිංචි කර අඛණ්ඩ ව සම්බන්ධතා පවත්වා ගනිමින් උපදේශන සහ ප්‍රතිකාර සේවාවලට යොමු කර ඇති සංඛ්‍යාව 23,775ක්. සේවාව ආරම්භයේ සිට මේ දක්වා සේවා ලබා ගත් සමස්තය 164 627ක්. ගෙවුණු ඔක්තෝබර් මාසයේ පමණක් 2899ක් එහි ලියාපදිංචි වී තිබෙනවා. චැට් සේවාව සඳහා ලියාපදිංචි වී ඇති ගණන 7000කට අධිකයි. මේ සේවාව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන ත්‍රෛභාෂා මාධ්‍යයෙන් ම ක්‍රියාත්මක වන




ආචාරශීලී මාධ්‍ය සංස්කෘතියක් සාම්ප්‍රදායික සහ නව මාධ්‍ය ඔස්සේ ඇතිකර ගැනීම අත්‍යවශ්‍යයි. ඒ සඳහා සාක්ෂි මත පදනම් වූ තොරතුරු සැපයීම, ගෞරවනීය භාෂාව භාවිත කිරීම, වාර්තා කිරීමේදී මානසික සෞඛ්‍ය විශේෂඥයන්ගෙන් විමසීම, උපකාරක දුරකතන තොරතුරු සැපයීම, හානිකර හැසිරීම් ආකර්ෂණීය කිරීම හෝ සංවේදී කිරීම හෝ වළක්වා ගැනීම යනාදිය මාධ්‍ය වෘත්තිකයන් අනුගමනය කළ යුතු යහපත් පිළිවෙත්. එවිට මාධ්‍ය සහ මානසික සෞඛ්‍ය වෘත්තිකයන් අතර සහයෝගිතාව සහ සම්බන්ධතාව තවදුරටත් ප්‍රවර්ධනය වනු ඇති.

අතර තවදුරටත් පුළුල් කළ යුතු බවත් එහි උපදේශිකා විශේෂඥ මනෝ වෛද්‍ය පුෂ්පා රණසිංහ ප්‍රකාශ කළා.

මාධ්‍යවේදීන් ද සිය රාජකාරිවලදී මුහුණපාන විවිධ සිද්ධි නිසා මානසික ගැටලුවලට මුහුණ දෙන බව නොරහසක්. තමන් සම්පාදනය කරන වාර්තා සිය මාධ්‍යයේ සංස්කාරක, කර්තෘ, නිෂ්පාදක හෝ ආයතන හිමිකාරීත්වයේ හෝ බලපෑම අනුව ඔවුන්ගේ අවශ්‍යතා ඉටු වන පරිදි මහජනයාගේ පාර්ශ්වය නොසලකා පළ කිරීමට බලපෑම් එල්ල කිරීම, කාලය සහ වේලාව නොසලකා වැඩෙහි යෙදෙන වෘත්තියක් නිසා පවුල්වල දෛනික කාර්යයන් අතපසු වීමෙන් පවුල තුළ ගොඩනැගෙන අප්‍රසාදය, ඇතැම් අවස්ථාවල නීතිමය ප්‍රශ්නවලට ගොදුරු වීමට සිදුවීම, පාතාල සහ මැර ක්‍රියාවලින් ආත්මාරක්ෂාව සලසා ගැනීමට සිදුවීම, නිසි කලට වේලාවට ආහාරපාන ලබා ගැනීමට නොහැකි නිසා ශරීර සෞඛ්‍ය දුර්වල වීම යනාදිය මානසික ගැටලු ඇති කරන එවැනි සිද්ධි. තව ද තමා අකමැති එහෙත් රාජකාරිය නිසා වාර්තා කිරීමට සිදුවන විවිධ අනපේක්ෂිත සිද්ධිවලදී අසතුට, සංවේගය, කනගාටුව, පසුතැවීම වැනි සංවේදනා සහිත ව ක්‍රියා කිරීමට සිදු වීම නිසාත් මානසික පීඩනය, ආතතිය සහ විෂාදය වැනි රෝගවලට ගොදුරු වන බව මාධ්‍යවේදීන් පෙන්වා දෙනවා.

විශේෂඥ මනෝ වෛද්‍ය විදුරංග කොතලාවල ඒ සම්බන්ධයෙන් දක්වන්නේ මෙවැනි අදහසක්. ඔහු; "මාධ්‍යවේදීන්ට ගැටලු පවතීනම් හැකි සෑම විට ම සරල නිදහස් වීමේ ව්‍යායාමවල (Relaxation Exercises) යෙදීම, පළපුරුදු මනෝ උපදේශකවරයෙකු ලවා උපදෙස් ලබා ගැනීම, උග්‍ර ලෙස විෂාදය පවතීනම් චිකිත්සක ක්‍රමවේද සහ ප්‍රතිකාර අනුගමනය කිරීම යන පියවර වෙත යොමුකරවන්න. ජනතාව දැනුවත් කිරීමේ රාජකාරියේ නියුතු වන මාධ්‍යවේදීන් ඉතා පිරිසිදු සහ යහපත් මානසිකත්වයෙන් සිටීම වැදගත්. මානසික අවශ්‍යතා සන්තර්පණය කර ගැනීම සඳහා මොළයේ ඩොපමින් (Dopamine) ශ්‍රාවය කිරීමේ ක්‍රියාවලිය ප්‍රශස්ත මට්ටමක රඳවා තබා ගත යුතුයි. එය නිරෝගී මනසකට අත්‍යවශ්‍යයි."

**වෛද්‍ය විදුරංග පවසන ආකාරයට මානසික සෞඛ්‍ය සඳහා මූලික ව බලපාන සතුට අහිමි කරවන අභ්‍යන්තර සහ බාහිර සාධක තිබෙනවා. යහපත් ආහාර පාන පුරුදු නොසලකා සිටීම, ශාරීරික සහ මානසික ව්‍යායාමවල නොයෙදීම, මත්පැන්, දුම්වැටි සහ මත්ද්‍රව්‍ය භාවිතය, කායික සෞඛ්‍යය ගැන අනවධානය, සංගීතය සහ කලාව ඇසුරු නොකිරීම, විනෝදාංශවල නොයෙදීම, සතිමත්භාවය පවත්වා නොගැනීම, රාජකාරී ස්ථානයේ සහ නිවසේ අපිළිවෙළ, අනවශ්‍ය සංවේදනවලට නිතර හසුවීම, කාල කළමනාකරණයක් නොමැති වීම, ආරක්ෂිත ව පහසුවෙන් ළඟාවිය හැකි තමාගේ කැමැත්තට සරිලන කාලීන ඉලක්ක තබා නොගැනීම, අන්‍යයන් සමඟ තමා සංසන්දනය කිරීම, වැරදි සමාජ සම්බන්ධතා පවත්වා ගැනීම, බාහිර පුද්ගලයන්ට ආවේගමය ක්ෂණික ප්‍රතිචාර දැක්වීම, හැඟීම්බර වීම වැනි මානසික ආතතිය වර්ධනය වන හේතු ඊට අයත්.**

මානසික රෝගවලට ගොදුරුවූවන් පිළිබඳ වාර්තාකරණයේදී වින්දිතයාගේ අනන්‍යතාව ඉස්මතු වන ආකාරයේ පෞද්ගලික තොරතුරු ඇතුළත් නොකිරීමට මාධ්‍යවේදියා ක්‍රියා කළ යුතුයි. එසේ අවශ්‍ය වන්නේ ඔහුගේ/ඇයගේ රෝගී තත්ත්වය සුව කළ පසු හෝ පාලනය කළ පසු හෝ නැවත සමාජගත වී සාමාන්‍ය පරිදි ජීවත්වීමට රෝගියාට අවකාශ සලසා දිය යුතු වන නිසා බව විශේෂඥ මනෝ වෛද්‍ය මධුෂානී ඩයස් සඳහන් කළා. මේ පිළිබඳ අවධාරණය කළ විශේෂඥ මනෝ වෛද්‍ය කපිල රණසිංහ පැවසුවේ එසේ නොවුණහොත් එවැනි වාර්තාකරණයක අවසාන ප්‍රතිඵලය සියදිවි නසා ගැනීමක් දක්වා ගමන් කළ හැකි බව. ඒ නිසා වගකීමෙන් යුතු, ආචාරශීලී මාධ්‍ය සංස්කෘතියක් සාම්ප්‍රදායික සහ නව මාධ්‍ය ඔස්සේ ඇතිකර ගැනීම අත්‍යවශ්‍යයි. ඒ සඳහා සාක්ෂි මත පදනම් වූ තොරතුරු සැපයීම, ගෞරවනීය භාෂාව භාවිත කිරීම, වාර්තා කිරීමේදී මානසික සෞඛ්‍ය විශේෂඥයන්ගෙන් විමසීම, උපකාරක දුරකතන තොරතුරු සැපයීම, හානිකර හැසිරීම් ආකර්ෂණීය කිරීම හෝ සංවේදී කිරීම හෝ වළක්වා ගැනීම යනාදිය මාධ්‍ය වෘත්තිකයන් අනුගමනය කළ යුතු යහපත් පිළිවෙත්. එවිට මාධ්‍ය සහ මානසික සෞඛ්‍ය වෘත්තිකයන් අතර සහයෝගිතාව සහ සම්බන්ධතාව තවදුරටත් ප්‍රවර්ධනය වනු ඇති.

සාමාන්‍යයෙන් මානසික රෝගයකට ගොදුරු වූවෙකු මුහුණදෙන, නමුත්

වගකිවයුතු අංශවල නිසි අවධානයක් යොමු නොවන සිද්ධි තිබෙනවා. ඒ, එවැනි රෝගියකු රෝහලට රැගෙන එන්නේ පොලිසිය හෝ උසාවිය හෝ වෙනත් නීතිමය අංශවලින් වීම, මාධ්‍ය සහ අනෙකුත් ආකාරවලින් ප්‍රචාරණයට ලක්වීමෙන් පසු වීම යනාදිය. එවිට මානසික රෝගියෙකු පූර්ණ සුවය ලබා හෝ රෝගය පාලනය කර හෝ නැවත සමාජගත වුව ද ඔහු/ඇය මානසික රෝගියෙකු ලෙස සලකන්නටයි සමාජය පෙළඹෙන්නේ. එවිට සුව වූ පුද්ගලයා යළි රෝගී වීමේ අවදානමක් පවතිනවා.

මානසික රෝග සම්බන්ධයෙන් සම්මත කරගත් අණපනත් ඇත්තේ 1956 තරම් ඈත කාලයකට අදාළ ව. වර්තමාන සංකීර්ණ සමාජයට අදාළ ව ඒවා යාවත්කාලීන වී නොතිබීම නිසා මානසික රෝගවලට ගොදුරුවූවන් සාමාන්‍ය සමාජයේදී විවිධ අඩන්තේට්ටම්, උසුළු විසුළු, සමච්චල්, නොසලකා හැරීම් යනාදියට මුහුණපානවා. මානසික රෝග සඳහා ප්‍රතිකාර ගැනීම සමාජයෙන් කොන්වීමට හේතුවක් වෙතැයි යන බියත් සැකයත් නිසා රෝගය තීව්‍ර වන තෙක් සඟවාගෙන සිටීම ද තවත් බාධකයක්. මේ නිසා මාධ්‍යවේදියා තම වාර්තාකරණය ඔස්සේ මානසික සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඇතිවිය හැකි පසු බලපෑම කුමක් ද? මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය වන ආකාරයට තම ප්‍රවෘත්තිය හෝ විශේෂාංගය හෝ වාර්තා කරන්නේ කෙසේ ද? යන ප්‍රශ්න තමාගෙන් ම අසාගෙන වාර්තා කිරීම ඉතා වැදගත්. ආගමික ඇදහිලි, ගුප්ත විද්‍යා සහ මිත්‍යා විශ්වාස මත මානසික රෝග සඳහා ප්‍රතිකාර කිරීම සහ නිසි වෛද්‍ය ප්‍රතිකාර නොකර සිටීම නුසුදුසු බවත් ඒ පිළිබඳ සමාජයේ දැනුවත්භාවය පුළුල් කළ යුතු බවත් මනෝ වෛද්‍ය උපදේශිකා විශේෂඥ වෛද්‍ය ගයනි සිරිවර්ධනගේ අදහස.

මානසික රෝග කාණ්ඩ කිහිපයකට අයත්. ඒ අතර මායාවන් හා භ්‍රාන්ති තත්ත්ව (Psychotic Illness), මනෝ සංකුලතා (Mood Disorders), කාංසාව (Anxiety Disorders), ඇබ්බැහිවීම් (Addictions), නින්ද නොයාම හා ලිංගික දුර්වලතා (Disorders of Sleep and Sexuality), අමතක වීම (Dementia), සහ ගැටවර වියේ ඇතිවන මානසික ගැටලු (Psychiatric Illness in Children and Adolescents) ප්‍රධාන වෙනවා.

හින්නෝන්මාදය, ලිංගික සැකය (Pathological Jealousy), මත්ද්‍රව්‍ය භාවිතය වැනි හේතු නිසා මායාවන් හා භ්‍රාන්ති තත්ත්ව ඇති විය හැකියි. මනෝභාවයන්ගේ සංකුලතා නිසා විෂාදය සහ භාවික උන්මාදය (Bipolar Disorders) ඇතිවිය හැකියි. විෂාදයත් මේනියා සහ විෂාදය අතර දෝලනය වන අතරමැදි ලක්ෂණ සහිත භාවික උන්මාදයත් කාංසා තත්ත්වයත් සෞඛ්‍යමය වශයෙන් එල්ල කරන්නේ දැඩි බලපෑම්. කාංසාවේ ආකාර කිහිපයක් දකින්නට පුළුවන්. නිරතුරු ව පවතින කාංසාව (Generalized anxiety), හදිසි කාංසාව (Panic Disorders), සමාජ භීතිකාව (Social Phobia), විශේෂ භීතිකා තත්ත්ව (Specific Phobia), ග්‍රස්තිය (Obsessive Compulsive Disorders) ඊට අයත්. ඇබ්බැහි වීමේ මානසිකත්වය ඇතිවන්නේ විශේෂයෙන් මත් වන ද්‍රව්‍ය භාවිත කිරීමෙන්. එපමණක් නොව අනවශ්‍ය ලෙස අසීමාන්තික ව අන්තර්ජාල භාවිතය, සූදුව, අරමුණක් නොමැති ව ඉබාගාතේ ඇවිදීම සහ වෙනත් අත්හළ නොහැකි අහිතකර පුරුදු ද ඇබ්බැහියට බලපානවා. සමාජ සම්මත නොසලකා ක්‍රියා කිරීම අහිතකර ඇබ්බැහිවීම්වලට බලපාන අතර ඊට ගොදුරුවූවන්ගේ සමාජ තත්ත්වය (Social Status) පහත වැටෙනවා.

**මානසික ආබාධ නිසා නින්ද නොයාම, ආහාර අරුචිය සහ ලිංගික ගැටලු ඉස්මතු විය හැකියි. ඊට අමතර ව ඩිමෙන්ෂියා තත්ත්වය සහ ළමා සහ ගැටවර වියේ ඇතිවන මානසික ගැටලු ඇති රෝගීන් පිළිබඳ වාර්තා කිරීමේදී සහ ඔවුන් සමග ක්‍රියා කිරීමේදී ද ප්‍රවේශම් විය යුතු වනවා. ඒ, මොවුන්ට පියවි සිහියෙන් වැඩ කිරීමට අපහසු නිසා. මෙවැනි රෝගීන් නිසි උපදේශකවරුන්, වෛද්‍යවරුන් සහ චිකිත්සකයන් වෙත යොමු කර සුවපත්භාවය උදෙසා ක්‍රියා කිරීම, සමාජයේදී ඔවුන්ගේ ආරක්ෂාව සහ පරෙස්සම ගැන කල්පනාකාරී වීම, ඔවුන් වෙනස්කොට සහ ප්‍රතික්ෂේපකොට නොසැලකීම, ඔවුන්ගෙන් අන්‍යයන්ට හෝ තමාට හෝ හානියක් සිදුවීමට ඇති අවකාශ ඇහිරීම යනාදී කාරණා පිළිබඳ සමාජය දැනුවත් කිරීමේ වගකීමත් මාධ්‍යවේදියා සතුයි.**

විශේෂඥ මනෝ වෛද්‍ය සජීවන අමරසිංහ ප්‍රකාශ කළ පරිදි සෑම පුද්ගලයන් සිව් දෙනෙකුගෙන් එක් අයෙකු තම ජීවිතයේ යම් අවස්ථාවකදී මානසික හෝ ස්නායු හෝ ආබාධයකින් පීඩාවට පත් වන බව ලෝක සෞඛ්‍ය සංවිධානය හඳුනාගෙන තිබෙනවා. එසේ ම මානසික අවපීඩනය සහ කාංසාව පමණක් හේතුවෙන් ගෝලීය ආර්ථිකයට වසරකට ඩොලර් ට්‍රිලියනයකට වඩා අහිමි වනවා. ඊට සෞඛ්‍ය සේවා (චිකිත්සාව, ඖෂධ, රෝහල්ගත කිරීම වැනි) සඳහා වන සෘජු පිරිවැය සහ ඵලදායිතාව නැතිවීම (රැකියාවට නොපැමිණීම, රැකියාවේ සිටියත් ක්‍රියා කිරීමට නොහැකි වීම, ආබාධිත ප්‍රතිලාභ සහ විරැකියාව වැනි) යන වක්‍ර පිරිවැය ද ඇතුළත්. මේ අතර රැකබලා ගැනීමට සිදු වීම (පවුලේ සාමාජිකයන්ගේ වැඩ කරන වේලාව අඩු වීම, රැකවරණය සැපයීම සඳහා ශ්‍රම බලකායෙන් සම්පූර්ණයෙන් ම ඉවත් වීම වැනි), පොදු සමාජ පද්ධති කෙරෙහි ඇතිවන පීඩනය (සමාජ සුභ සාධනය සහ ආබාධිත සහාය වැනි), පරම්පරාගත බලපෑම (දෙමාපියෙකුගේ මානසික රෝගයක් දරුවෙකුගේ සංවර්ධනය, අධ්‍යාපනය සහ අනාගත ආර්ථික තත්ත්වයට සිදු කරන බලපෑම වැනි) නිසා ද ලෝක ආර්ථිකයට එල්ල වන පීඩාව අතිමහත් බවයි වෛද්‍ය සජීවන පෙන්වා දෙන්නේ. මේ නිසා මානසික සෞඛ්‍ය කෙරෙහි සමස්ත සමාජයේ අවධානය යොමු වීම රටේ ආර්ථික සහ සමාජීය ප්‍රගමනය සම්බන්ධයෙන් අත්‍යවශ්‍යයෙන් ම සිදුවිය යුත්තක්.

(ශ්‍රී ලංකා ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනයේ මාධ්‍යවේදීන් සඳහා පැවති වැඩමුළුවක් ඇසුරෙන්)





# නෙලු

හෝර්ටන් තැන්න ආශ්‍රිත රක්ෂිත වනාන්තරය නෙලු මලින් සැරසී ඇති නිසා එය බොහෝ පිරිසකගේ ආකර්ෂණයට ලක් ව තිබෙනවා. පරිසර විද්‍යාඥයන්ගේ නිගමන අනුව වසර 12-13කට වරක් විකසිත වේ යැයි සැලකෙන නෙලු මල් මීට පෙර හෝර්ටන් තැන්න ආශ්‍රිත ව එක යායට විකසිත ව ඇත්තේ 2013 වසරේදී, 2013 වසරට පෙර 2001 වසරේදීත් එයාකාරයෙන් මෙහි නෙලු මල් පිපී තිබෙනවා. මේ, ඒ පිළිබඳ සුවිශේෂ කතාබහක්.




ආචාර්ය

**නිලන්ති රාජපක්ෂ**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව


නෙලු ශාකය පළමු වරට සොයාගෙන තිබෙන්නේ 1826 වසරේ බටහිර ජාවාවලින්. මෙහි විශේෂ 450කට අධික සංඛ්‍යාවක් ඉන්දියාව, මැලේසියාව, ඉන්දුනීසියාව, මියන්මාරය, තායිලන්තය, නැගෙනහිර ඕස්ට්‍රේලියාව, ජපානය, කොරියාව ඇතුළු රටවල් රැසක දක ගත හැකියි. නෙලු මල් පිපෙන්නේ කඳුකර සහ සදාහරිත වනාන්තර ආශ්‍රිත ව.

ශ්‍රී ලංකාවේ නෙලු ශාකය වැවෙන්නේ හෝටර්න් තැන්නේ පමණක් නොවෙයි. කඳුකර පෙදෙස් ආශ්‍රිත ව පිදුරුතලාගල, නකල්ස්, ශ්‍රී පාදය, එරත්න, අග්ගබෝපත් තලාව, දොළොස්බාගේ, කිකිළියාමාන, නමුණුකුල, මන්දාරම්නුවර, සිංහරාජය ඇතුළු රක්ෂිත වනාන්තර ගණනාවක නෙලු ශාක විශේෂ ගණනාවක් ම දැක ගන්නට පුළුවන්. එහෙත් නෙලු ශාකය වැඩි වශයෙන් දකින්නට ලැබෙනවා හෝර්ටන් තැන්නේ ඔහිය, පට්ටිපොළ, කිරිගල්පොත්ත සහ තොටුපොළ කන්ද යන ප්‍රදේශවල.

බ්‍රිතාන්‍ය ජාතික තෝමස් ෆාගේ වාර්තාවක 19-20 වැනි සියවස්වල හෝර්ටන් තැන්න ආශ්‍රිත ව වසර 12කට වරක් නෙලු මල් පිපී ඇති බව වාර්තා වෙනවා. තෝමස් ෆා 19 වැනි සියවසේ ලංකාවේ වාසය කළ බ්‍රිතාන්‍ය පරිසර විද්‍යාඥයෙක්. ඔහු 1881 සහ 1905 වසරවලදී හෝර්ටන් තැන්න ආශ්‍රිත ව නෙලු මල් පිපී තිබුණු අයුරු සියැසින් දැකගත් අයෙක්. ඔහුගේ වාර්තාවල ඒ ගැන සඳහන් වෙනවා. නෙලු මල් වසර 12කට වරක් පිපෙන බව පළමුවෙන් ම උපකල්පනය කර ඇත්තේත් තෝමස් ෆා. මෑතකදී ජේ. ආර්. අයි. වුඩ් රචනා කළ වාර්තාවකත් නෙලු මල් පිළිබඳ වටිනා තොරතුරු රැසක් අනාවරණය කරනවා.

මෙරට ප්‍රදේශ කිහිපයකින් නෙලු ශාක විශේෂ 35ක් පමණ වාර්තා වෙනවා. එයින් 33ක් ශ්‍රී ලංකාවට ආවේණික ඒක දේශීය ශාක විශේෂ. ශ්‍රී ලංකාවේ වඩාත් දැක ගත හැකි වන්නේ දම් පැහැය හෝ දම් පැහැයේ විවිධ වර්ණ පරාසවලින් හෝ යුත් නෙලු මල්. සුදු පැහැති නෙලු මල් විශේෂ අපේ රටේ දුලබ වුණත් ඉන් විශේෂ 2ක් හෝර්ටන් තැන්නේදී දැක ගන්නට පුළුවන්. පහතරට තෙත් කලාපයේත් සුදු පැහැති නෙලු මල් විශේෂයක් හමු වෙනවා. කහ සහ තැඹිලි වර්ණවලින් යුත් නෙලු මල් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් හමුවීමත් විශේෂයි. වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනතෙන් මෙරට වාර්තා වන බොහෝ නෙලු මල් විශේෂ සංරක්ෂණය කර තිබෙනවා.

නෙලු මල ඉංග්‍රීසි භාෂාවෙන් හඳුන්වන්නේ Strobilanthes යන නමින්. කෝන් එකක

හැඩය යන්නයි එහි සිංහල අරුත. කෝන් එකක හැඩය මෙහි සෑම මලක ම පාහේ පොදු ලක්ෂණයක්. මෙහි නිපත්‍ර හොඳින් ඉස්මතු වෙනවා. කෝන් එකෙන් මතු වන නාලය ඇතුළත බූව පේළි 2ක් ලෙස දකින්නට ලැබෙනවා. එයත් සෑම නෙලු මල් විශේෂයක ම පොදු ලක්ෂණයක්. මෙහි සෑම විශේෂයක ම රේණු තිබෙන්නේ ඒකාබද්ධ ව. සාමාන්‍යයෙන් පැළෑටි සහ පඳුරු ලෙස වැඩෙන නෙලු ශාකයේ වර්ධනය වූ වෘක්ෂ කලාතුරකින් දකින්නට පුළුවන්.

නෙලු ශාකයේ මල් හට ගැනීම වසර 12ක් පාසා සිදුවන්නක් බව නිශ්චිත ව ම කියන්නට බැහැ. මෙහි මල් හට ගන්නේ අක්‍රමවත් ආකාරයෙන්. සෑම විශේෂයක ම වසර 12කට වරක් මල් පිපෙන්නේ නැහැ. ඇතැම් නෙලු මල් විශේෂවල වසරක් පාසා මල් පිපෙනවා. ඇතැම් විශේෂවල මල් පිපෙන්නට ගත වන කාලය වසර දෙකක්, තුනක්, හතරක්, පහක්, හයක් ලෙස විවිධ වෙනවා. සාමාන්‍යයෙන් නෙලු මල් පිපෙන්නේ වසරක සැප්තැම්බර් සිට දෙසැම්බර් මාස අතර කාලයේ. සෑම වසරක ම පාහේ නෙලු මල් අතරින් පතර හෝ දැක ගන්නට පුළුවන්. එහෙත් විශාල වශයෙන් මල් හට ගැනීම සිදු වන්නේ වසර 12කට වරක් නිසා නැවතත් නෙලු මල් වසන්තයක අසිරිය හෝර්ටන් තැන්නේදී දැක ගත හැකි වන්නේ 2037 වසරේදී.

නෙලු මල මව් මරා ඉපදෙන මලක් ලෙස ප්‍රචලිතයි. මල් පිපී, පල ගැනීමෙන් පසු නෙලු ශාකය මැරෙනවා. සාමාන්‍යයෙන් නෙලු ශාකය වැඩී, මල් පිපීමට ගත වන කාලය වසර 12ක්. ඒ මල්වලින් එහි පල හට ගන්නවා. නැවතත් නෙලු මල් වසන්තය එළැඹෙන්නේ ඒ පල ආශ්‍රයෙන් වැඩෙන ශාකවලින්. ඒ ශාකවල මල් පිපෙන්නට තවත් වසර 12ක් ගත වෙනවා. එක් අවස්ථාවක මල් විශාල සංඛ්‍යාවක් දැක ගැනීමට වසර 12ක් ගත වන්නේ මේ හේතුවෙන්. එවැනි සුවිශේෂ අවස්ථාවල පැමිණෙන සංචාරකයන් නෙලු මල් කඩා දැමීම අපරාධයක්. එය නෙලු මල හට ගැනීමට බාධාවක්. ඒ නිසා ම අපට නැවතත් වසර 12කින් නෙලු මල් වසන්තයක් දැක ගැනීමට වරම් නොලැබෙන්නත් පුළුවන්.

ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වන වලිකුකුළාගේ ප්‍රියතම ආහාරයක් වන්නේ නෙලු ගෙඩි. වලිකුකුළා වගේ ම හබන්කුකුළා, මයිලගොයා ඇතුළු පක්ෂීන් රැසක් නෙලු බීජවලින් යැපෙනවා. මේ බීජ වැඩි වශයෙන් ආහාරයට ගත් විට මත් වන නිසා මේ සමයේ නෙලු ගෙඩි ආහාරයට ගන්නා වලිකුකුළන්, මයිලගොයන් මත් වී බිම ඇද වැටී සිටීම සුලබ දර්ශනයක්. එලෙස සිහිසුන් ව ඇද වැටෙන පක්ෂීන් කඳුකර දිවියන්ට ගොදුරු වෙනවා. ඒ අනුව නෙලු ශාකය ආහාර දාමයක් ලෙස පරිසරය තුලනය කරනවා. එසේ ම නෙලු මල්වල පරාගණය සිදු කරන මී මැස්සන්, බඹරුන් එම මල් පැණියෙන් පෝෂණය වෙනවා.

මෙවර නෙලු මල් වාරය වඩාත් සුවිශේෂයි. අප මේ ගැන පර්යේෂණ රැසක් සිදු කළා. එයින් වසර ගණනාවකින් වාර්තා නොවූ දුර්ලභ නෙලු ශාක, නව නෙලු විශේෂ සහ ප්‍රභේද සොයා ගන්නට හැකි වුණා. මේ සියල්ල ඉදිරියේදී පර්යේෂණ පත්‍රිකා ලෙස එළි දක්වනවා.

සාකච්ඡාව සහ සටහන
**පසිඳු මිහිරාන් රැටියල**



# රුසියානු සිනමා දැක්ම

කථිකාචාර්ය මනීෂ දුක්ගන්නාරාළ



ප්‍රේක්ෂකාගාරය



රුසියානු චිත්‍රපට ශිල්පීන්, නළු නිළියන්



**පළමු අන්තර්ජාතික රුසියානු චිත්‍රපට උලෙළ සහ සම්මන්ත්‍රණය, නොවැම්බර් මස 01 සිට 04 දක්වා කොළඹ රුසියානු සංස්කෘතික මධ්‍යස්ථානයේදී පැවැත්වුණා. ඒ, රුසියානු විදේශ කටයුතු අමාත්‍යාංශය හා කොළඹ රුසියානු සංස්කෘතික මධ්‍යස්ථානය එක් ව කැලණිය විශ්වවිද්‍යාලයේ නාට්‍ය සිනමා හා රූපවාහිනි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලයේ හොරණ ශ්‍රී පාලි මණ්ඩපය, රත්මලාන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ රූපවාහිනි සහ චිත්‍රපට නිෂ්පාදන තාක්ෂණික අංශය, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ සිනමාකරණය පිළිබඳ ඩිප්ලෝමාව හදාරන ශිෂ්‍යයන් සහ මහරගම ජාතික තරුණ සේවා සභාවේ නෙස්කෝ වීඩියෝ ආයතනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහභාගිත්වයෙන්. මේ, ඒ පිළිබඳ සිනමාත්මක විමසුමක්.**

වර්ෂ 1963 සෝවියට් චිත්‍රපට උලෙළක් සංවිධානය වීමෙන් අනතුරු ව නැවත වසර 62කට පමණ පසුව සංවිධානය වූ එක ම සිනමා උළෙල බවට පත් වූයේ පළමු අන්තර්ජාතික රුසියානු චිත්‍රපට උලෙළ. මෙහි විශේෂත්වය වූයේ ඒ ඒ දිනවල ප්‍රදර්ශනය කළ චිත්‍රපටවල රංගන ශිල්පීන්, ශිල්පිනියන් සහ සංගීත අධ්‍යක්ෂවරුන්, නිෂ්පාදකයන් රුසියාවේ සිට මෙරටට පැමිණීම. චිත්‍රපට ප්‍රදර්ශනයෙන් අනතුරු ව ඒ ඒ චිත්‍රපට ශිල්පීන් සමග අධ්‍යාපනික සැසි පැවැත්වීම ද විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ සහ ප්‍රේක්ෂක ප්‍රජාවගේ ඇගයීමට ලක් වූ කාරණයක්. එසේ ම මෙරට විශ්වවිද්‍යාලවල සහ අනෙකුත් අධ්‍යාපන ආයතනවල චිත්‍රපට කලාව ඉගෙන ගන්නා විද්‍යාර්ථීන් 200ක් පමණ එක ම ප්‍රේක්ෂකාගාරයක හිඳගෙන චිත්‍රපට නැරඹීමත් චිත්‍රපට කලාවේ ප්‍රායෝගික තලය ඒ ඒ කලාකරුවන්ගෙන් ම ඉගෙන ගැනීමට හා සංවාද කිරීමට ලැබීමත් මෙහි සුවිශේෂත්වයක්. විද්‍යාර්ථීන් පමණක් නොව විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්, කථිකාචාර්යවරුන්, චිත්‍රපට අධ්‍යක්ෂවරුන්, රංගන ශිල්පීන්, සහය අධ්‍යක්ෂවරුන්, කලා අධ්‍යක්ෂවරුන් ඇතුළු චිත්‍රපට කලාවේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන නිර්මාණකරුවන් මෙන් ම ජනමාධ්‍යවේදීන් එක ම ප්‍රේක්ෂකාගාරයක හිඳගෙන කලාත්මක න්‍යායාත්මක සහ ප්‍රායෝගික සිනමා සම්මන්ත්‍රණයකට එක් වූ පළමු අන්තර්ජාතික චිත්‍රපට සම්මන්ත්‍රණය ලෙස මෙය ඉතිහාසයට එක්වනු ඇති.

මේ චිත්‍රපට උලෙළ ආරම්භ වුණේ තිමූර් හවාන් සහ අලෙක්සන්ධාර් ගුරුයානෆ් එක් ව අධ්‍යක්ෂණය කළ සෙන්පති (Commander) චිත්‍රපටය ප්‍රදර්ශනයෙන්. එහි ධාවන කාලය විනාඩි 144ක්. 2024 වර්ෂයේ නිෂ්පාදිත මේ චිත්‍රපටය රුසියාවේ විශාල ප්‍රේක්ෂක ප්‍රජාවක් නරඹා ඇති, ඉතා ජනප්‍රියත්වයට පත් වූ, සම්මාන ලබා ඇති චිත්‍රපටයක්. ගෙනා දි සාහිත්සෙෆ් පිටිසර උරාල් ගම්මානයක සාමාන්‍ය ගැටවරයෙක්. පියා නොමැති ව බොහෝ දරුවන් ඇති පවුලක හැදී වැඩී ඇති නමුත් ඔහු යුදකාලීන ළමා වියේ සහ පශ්චාත් යුද විනාශයේ දුෂ්කරතාවලින් නොනැසී සිටීමට සමත් වුණා. ඇල්ෆා ත්‍රස්ත විරෝධී ඒකකයේ නිර්මාතෘවරයෙකු බවට පත්වීමට ද ඔහුට හැකියාව ලැබුණා. 1988 දෙසැම්බර් 01 දින අර්ජෙනිකිත්සේ (වර්තමාන වලදිකාෆ්කාස්) නගරයේදී ත්‍රස්තවාදීහු 32ක් ගුරුවරයෙක් සහ රියැදුරෙක් ප්‍රාණ ඇපයට ගත්තා. සයිට්සෙෆ්ගේ

නායකත්වයෙන් සංකීර්ණ මෙහෙයුමක් දියත් කෙරුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස සියලු ම ප්‍රාණ ඇපකරුවන් නිදහස් කර ත්‍රස්තවාදීන් අත්අඩංගුවට ගැනුණා. එම කතාව සත්‍ය සිදුවීමක් මත පදනම් වූ චරිතාපදානයක්. මේ ආරම්භක චිත්‍රපටය මනුෂ්‍යත්වය පිළිබඳ අදහස උත්කර්ෂයට නැංවූ චිත්‍රපටයක් වුවා සේ ම යුද්ධයේ ඇති ම්ලේච්ඡත්වයත් අපගමනයක් පිළිබඳ සාකච්ඡාවත් ප්‍රේක්ෂකයා වෙතට ගෙන ආවා. එසේ ම ප්‍රේක්ෂකයාගේ කුතුහලය වැඩි වූයේ මේ චිත්‍රපටයේ ප්‍රධාන රංගන ශිල්පියා වූ කිරිල් සයිත්සෙෆ් (Kirill Saithsef) සමග චිත්‍රපටයේ සැබෑ අත්දැකීම් පිළිබඳ ව සාකච්ඡා කිරීමට. එම සාකච්ඡාවේදී රංගන ශිල්පියෙකු ලෙස චිත්‍රපටයට රංගන දායකත්වය ලබාදීමේදී තමා ව තිගැස්මකට ලක් වූ ආකාරයත් අනෙක් අතට රංගන ශිල්පියෙකු ලෙස තමා එම අභියෝග භාර ගත් ආකාරයත් ඔහු බොහෝ අව්‍යාජ ව ප්‍රකාශ කළා.

චිත්‍රපට උලෙළේ දෙවැනි දිනය වෙන්වුණේ ජල සූත්‍රය (water formula) නමැති කාටූන් චිත්‍රපටයට. එය ආර්තෙයාම් මිනකොෆ් විසින් අධ්‍යක්ෂණය කරන ලද මිනිත්තු 80ක ධාවන කාලයකින් යුක්ත වූ චිත්‍රපටයක්. නවයෝන්ගේ දැරියක් වූ දානා ග්‍රහලෝකයේ සාගරයෙන් වට වූ දූපතක විකෘතිවූවන් අතර ජීවත් වන්නියක්. එය පුරාවෘත්තයක නිධන්


රුසියානු තානාපති සමග




යතුර බව විශ්වාස කරන දරුණු මුහුදු කොල්ලකරුවන්ගේ ඉලක්කයක් හා පානීය ජල මූලාශ්‍රයක් බවට පත්වෙනවා. මුහුදු කොල්ලකරුවන්ගෙන් ගැලවෙන දානා, ඉබාගාතේ යන කලාකරුවන් කණ්ඩායමක් හඳුනා ගන්නා අතර ඔවුන් එක් ව දීප්තිමත් හා භයානක වික්‍රමාන්විත අත්විඳිමින් සැබෑ මිතුරන් බවට පත් ව නිධානයේ අභිරහස විසඳනවා.

මේ උලෙළේ තුන් වැනි චිත්‍රපටය වූයේ මක්සිම් බ්‍රියුස් විසින් අධ්‍යක්ෂණය කරන ලද රුධිර මාදිලිය (Blood group) නමැති චිත්‍රපටය. චිත්‍රපටයේ කතාව දිගහැරෙන්නේ 1943 නොවැම්බර් මාසයේදී ලෙනින්ග්‍රාද් කලාපයේ ගත්චිස්කි දිත්‍රික්කයේ වාඩිලාගෙන සිටි භූමියේදී වූ සිදුවීමක් පිළිබඳ ව. ට්‍රක් රථයක පිටුපස නාසීන් සෝවියට් අනාථ දරුවන් කිහිපදෙනෙකු වයිරීත්සාහි ළමා නවාතැනකට ගෙන එනවා. එය අත්‍යවශ්‍යයෙන් ම සිරකරු ගාල් කඳවුරක්. මෙහි පවතින තත්ත්වය දරා ගත නොහැකි තරම්. සීතල, කුසගින්න, බලහත්කාරයෙන් වැඩ ගැනීම්, අකීකරුකම සහ හුදකලා සිරගත කිරීම, පැනයාමට උත්සාහ කරන අය ව වෙඩි තබා මරා දැමීම ආදිය නිරන්තරයෙන් සිදු වෙනවා. එහෙත් ප්‍රධාන කාරණයනම් මෙහි පැමිණෙන දරුවන් තුවාල ලැබූ ජර්මාණුවන් සඳහා පරිත්‍යාගශීලීන් ලෙස භාවිත කිරීම. සියලු දුෂ්කරතා සහ මරණ තර්ජන තිබියදීත් එක්සත් වීමෙන් පසු තරුණ විරුවන් මේ නොපනත්කම්වලට එරෙහි ව නැඟී සිටීමට ධෛර්යය සොයා ගන්නා අතර පැන යාමට ද තීරණය කරනවා. මේ චිත්‍රපටය අපට පැහැදිලි කරන්නේ යුද්ධයේ ඇති රෞද්‍රභාවය. ම්ලේච්ඡත්වය. අසමානාත්මතාව. බලහත්කාරය.

චිත්‍රපට උලෙළේ තුන් වැනි දිනයේදී ප්‍රදර්ශනය කළ 'රුසියාවේ ලෝකඩ අශ්වාරෝහකයා' නමැති ඓතිහාසික නාට්‍යය ශානරයේ චිත්‍රපටය අධ්‍යක්ෂණය කළේ වාසිලි ලිවනෆ්. මේ ඓතිහාසික චිත්‍රපටය, 18 වැනි සියවසට රැගෙන යන අතර ඇලෙක්සැන්දාර් සර්ගේවිච් පුෂ්කින් රචිත ලෝකඩ අශ්වාරෝහකයා නම් වූ කාව්‍යයට කෘතඥ වන්නට, පළමු පියෝත්ර් රජුගේ ස්මාරකය නිර්මාණය කිරීමේ කතාව කියවෙනවා. දෙවැනි කැතරින් අධිරාජිනියගේ ආරාධනයෙන් මූර්ති ශිල්පී එටියෙන්-මොරිස් ෆැල්කොනෙට් ප්‍රංශයේ සිට මේ ස්මාරකය නිර්මාණය කිරීමට පැමිණියා. විශේෂඥයාගේ වෙහෙසකර කාර්යයට සහ වේදනාකාරී නිර්මාණාත්මක ගවේෂණයට ස්තූති වන්නට, ස්මාරකය කලා කෘතියක් පමණක් නොව රුසියාවේ සංකේතයක් බවට ද පත්වෙනවා. මේ ඓතිහාසික ශානරයේ නාටකයේ චිත්‍රපටය ප්‍රබන්ධ සාහිත්‍යයේ සංකල්පීය ධාරණාව උත්කර්ෂයට නැංවූ චිත්‍රපටයක්. විශේෂයෙන් ඓතිහාසික කතා පිළිබඳ රුචිකත්වයක් තිබූ ලාංකේය ප්‍රේක්ෂකාගාරය මහත් ඕනෑකමින් චිත්‍රපටය නැරඹුවා. එහි රස වින්ද. ඔවුන් අසා තිබූ අතීත රුසියානු කතා නැවත ස්මරණය කළා. ඒ පිළිබඳ සාකච්ඡා කළා. එම නිසා මේ චිත්‍රපට සම්මන්ත්‍රණය ප්‍රායෝගික සහ සක්‍රීය චිත්‍රපට සම්මන්ත්‍රණයක් ලෙස කාගේත් කතාබහට ලක් වුණා.

'සෙප්පඩ විජ්ජා ගම්මානය' චිත්‍රපට උළෙලේ අවසාන චිත්‍රපටය. වර්ෂ 1902දී ප්‍රසිද්ධ නාට්‍ය අධ්‍යක්ෂවරයකු වූ 'කොන්ස්ටන්ටින් ස්ටැනිස්ලවුස්කි' නව නාට්‍යයක් වේදිකාගත කිරීම සඳහා අනුප්‍රාණයක් සොයමින් නගරයේ පාතාල ජීවිතය පිළිබඳ දැන හඳුනාගැනීමට තීරණය කරනවා. ඔහුගේ සහයට මොස්කව්හි, මුඩුක්කු පිළිබඳ කීර්තිමත් විශේෂඥයෙකු වන ව්ලැද්මීර් ගිලිරෝව්ස්කි වෙත යොමු වන අතර ඔවුන් එක් ව ජනප්‍රවාදගත කොල්ලකරුවන්ගේ නගරයක් වන හිතරොෆ්කා (සෙප්පඩ විජ්ජා ගම්මාන) වෙත යනවා. එහිදී අඳුරු ජීවිතයක් පවතින ඉන්දියානු සික් ජාතිකයකු අභිරහස් ප්‍රදේශවාසිකයෙකුගේ ඝාතනය පිළිබඳ විමර්ශනයට ඔවුන් ඇද දමනවා. ලාංකික ප්‍රේක්ෂකයා ස්ටැනිස්ලවුස්කිගේ නව රූපණ විධික්‍රම පිළිබඳවත් නාට්‍ය කලාව පිළිබඳ ඇති රුචිකත්වයත් නිසා මේ චිත්‍රපටය පිළිබඳ ව ප්‍රේක්ෂකාගාරයේ ඇති වූයේ පුළුල් කතාබහක්. එම චිත්‍රපටය ප්‍රේක්ෂකයන්ගේ අමන්දානන්දයට පත් වුවා සේ ම ඥාන විභාජනය පිළිබඳ ව ඇති විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ කුතුස තවත් පුළුල් කළා. ඒ නිසා මේ චිත්‍රපට උලෙළ හුදු චිත්‍රපට උලෙළක් නොවී චිත්‍රපට අධ්‍යාපනය පිළිබඳ ව විද්‍යාර්ථීන්ගේ ලාලසාව සමනය කිරීමට පුළුල් මැදිහත්වීමක් කළ චිත්‍රපට උලෙළක් සහ සම්මන්ත්‍රණයක් ලෙස ඉතිහාසගත වෙනවා.

# සන්නිවේදන ප්‍රතිපත්ති හා මාධ්‍ය නියාමනය කෙසේ විය යුතු ද?

## (සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය හදාරන සිසු සිසුවියන් වෙනුවෙනි.)


**ප්‍රියාන් ආර් විජේබණ්ඩාර**
සභාපති
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය


සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය යනු හුදු විෂයයක් පමණක් නොවේ. විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක සිසු සිසුවියන් බොහෝ දෙනෙකු ඉහළ ම ප්‍රතිඵල අපේක්ෂාවෙන් විභාගයේදී පිළිතුරු ලිවීම සඳහා සූදානම් වීම අහම්බයක් නොවුව ද මෙය එදිනෙදා ජීවිතයට සහසම්බන්ධ ප්‍රායෝගික විෂයකි. දවසේ ඕනෑ ම මොහොතක අප තීන්දු තීරණ ලබාගන්නා ක්‍රියාවලියට දායක වන වෙනත් විෂයක් නොමැති තරම් බැව් විමසුම් ඇසින් බලන්නෙකුට නොපෙනෙන්නේ ද නොවේ.

පළමු ව අප විසින් අවධානය යොමු කරනු ලබන්නේ 'සන්නිවේදන ප්‍රතිපත්ති' කෙරෙහි ය. සන්නිවේදනය හා මාධ්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ රාජ්‍ය බලධාරීන්ගේ තීරණ යොමු කෙරෙන පොදු මූලධර්මවලට අදාළ ව 'සන්නිවේදන ප්‍රතිපත්ති' යන යෙදුම භාවිත වේ. සිවිල් නිදහස හා මානව අයිතිවාසිකම් කෙරෙහි බලපෑම් ඇති වන විට සන්නිවේදන ප්‍රතිපත්ති පුරවැසි ප්‍රතිපත්තියේ කොටසක් බවට නිතැතින් පත් වේ. සන්නිවේදනය වඩාත් ඵලදායක වන්නේ එහි ශක්තිය සමාජ සාධකවලින් සහ සංදේශ විසරණය මගින් මහජන මතය හා ඊට අදාළ සාධක එළිදරව් වුවහොත් ය. මෙහිදී සන්නිවේදකයා මෙන් ම ග්‍රාහකයා ද නිර්මාණශීලී හා වඩා සක්‍රිය ව සහසම්බන්ධවීම අපේක්ෂා කෙරෙයි.

සන්නිවේදන ප්‍රතිපත්ති (Communication Policy) සම්පාදකයන් හා සැලසුම්කරුවන්ගේ වෘත්තීය මට්ටමේ වගකීම වන්නේ සමාජ ධර්මතා විකෘති නොවන පරිදි සන්නිවේදන ප්‍රතිපත්තිය සකස් කිරීමයි. එහෙත් මෙහිදී අප අමතක නොකළ යුතු වන්නේ 'සමාජ ධර්මතා' හෝ 'වටිනාකම්' හෝ යනු ඒකමිතික ව සෑම කල්හි ම ස්ථිතික ව පවත්නා දේ නොවන බව ය. කාලය සමග වෙනස්වීමේ විභවතාව සමාජයකට හිමිවන්නේනම් එකී සමාජයේ සන්නිවේදන හෝ මාධ්‍ය ප්‍රතිපත්තිය හෝ වෙනස් නොවී පැවතීමේ හැකියාවක් කිසිසේත් ම නැත.

සන්නිවේදන ප්‍රතිපත්ති හැදෑරීමේ මුඛ්‍ය අරමුණ වන්නේ අන්තර්ගතය පිළිබඳ අවබෝධය, මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරිත්වය, තාක්ෂණික යටිතල පහසුකම් හා තාක්ෂණික සංවර්ධනය, මාධ්‍ය සම්බන්ධතා අධිකාරි හා බැඳි සම්බන්ධතා යනාදිය කෙරෙහි අවධානය යොමු කිරීම. විශේෂයෙන් ම අප වැනි කුඩා මාධ්‍ය වෙළෙඳ පොළක් හිමි රටක ලාභ ඉපැයීම අරමුණුකොටගත් මාධ්‍ය කර්මාන්තයේ ස්වරූපය සමීප ව නිරීක්ෂණය කළ යුතු ම ය. මෙහිදී සන්නිවේදන ප්‍රතිපත්තිවලට බලපාන මග හැරිය නොහැකි හෝ වැළැක්විය නොහැකි හෝ වෙනත් සමාජ සාධක රැසක් ද දැක ගත හැකි ය. (උදා: වර්ණභේදවාදය, වාර්ගිකත්වය වැනි) සන්නිවේදන ප්‍රතිපත්ති රටාව සකස් කෙරෙන්නේ තත් සමාජයේ පවත්නා සම්මත දේශපාලන හා සමාජීය තත්ත්වයට අනුකූල ව ය.


සන්නිවේදන ප්‍රතිපත්ති හැදෑරීමේ මුඛ්‍ය අරමුණ වන්නේ අන්තර්ගතය පිළිබඳ අවබෝධය, මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරිත්වය, තාක්ෂණික යටිතල පහසුකම් හා තාක්ෂණික සංවර්ධනය, මාධ්‍ය සම්බන්ධතා අධිකාරි හා බැඳි සම්බන්ධතා යනාදිය කෙරෙහි අවධානය යොමු කිරීම. විශේෂයෙන් ම අප වැනි කුඩා මාධ්‍ය වෙළෙඳ පොළක් හිමි රටක ලාභ ඉපැයීම අරමුණුකොටගත් මාධ්‍ය කර්මාන්තයේ ස්වරූපය සමීප ව නිරීක්ෂණය කළ යුතු ම ය.


1927 වර්ෂයේදී බී.බී.සී. ආයතනය පිළිබඳ බ්‍රිතාන්‍ය රාජකීය ප්‍රඥප්තිය (Royal Charter) මගින් මහා බ්‍රිතාන්‍යය සහ යටත්විජිතවල ගුවන්විදුලි මාධ්‍ය හැසිරවීම පිළිබඳ ප්‍රතිපත්ති හඳුන්වා දී තිබේ. මෙහි පදනම වූයේ මහජන සේවා (Public

Service) ගුවන්විදුලි සංකල්පය ස්ථාපිත කිරීමයි. පසුකාලීන ව මේ ප්‍රතිපත්ති රූපවාහිනි කෙරෙහි ද ආදේශ කෙරිණි.

එහෙත් 2003 වර්ෂයේදී හඳුන්වා දුන් සන්නිවේදන පනතින් වත්මන්හි 'සන්නිවේදනය පිළිබඳ කාර්යාලය' යන අරුත ඇති ව Ofcom (Office Of Communication) ලෙසින් සන්නිවේදන නියාමනයක් ක්‍රියාත්මක ය. මෙයින් රූපවාහිනි සේවා, ගුවන්විදුලි අංශ, ස්ථාවර දුරකතන, ජංගම දුරකතන, තැපැල් සේවා සහ රැහැන් රහිත සන්නිවේදන උපාංග ක්‍රියාත්මක වන ගුවන් තරංග නියාමනය කෙරෙයි. එහි භූමිකාව වන්නේ පුරවැසියන්ගේ සහ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා තවදුරටත් වර්ධනය කිරීම විය යුතු බව පනතේ සඳහන් වන අතර එය වග කියන්නේ එරට පාර්ලිමේන්තුවට ය. විකාශන සහ සන්නිවේදන ජාල නියාමනය සඳහා කර්මාන්තයෙන් ලැබෙන ගාස්තු සහ රජයෙන් ලැබෙන ආධාරවලින් එය නඩත්තු වෙයි.

1934 වර්ෂයේ ඇමරිකා එක්සත් ජනපදයේ සම්මත කළ සන්නිවේදන පනතින් (Communication Act) ඇමරිකාවේ ගුවන්විදුලිය, රූපවාහිනිය, විදුලි සංදේශ හා විදේශ සන්නිවේදන සඳහා පෙඩරල් සන්නිවේදන කොමිෂන් සභාව ඇති කෙරිණි. එය ජනමාධ්‍ය ආයතන අතර තාක්ෂණික ගැටලු නියාමනය කර තිබේ. සන්නිවේදන ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා පවත්වන ලද ප්‍රථම සම්මන්ත්‍රණය 1976 වර්ෂයේ කොස්තාරිකාවේ සැන්ජෝස්හිදී පැවැත්විණි. නව ජාතික හා ජාත්‍යන්තර සන්නිවේදන මණ්ඩලයක් පිහිටුවා ගැනීම කෙරෙහි එහිදී අවධානය යොමු විය. සෑම රටක ම ජාතික විඥානයට අමතර ව අන්තර්ජාතික සම්බන්ධතා තහවුරු කරන ආකාරයෙන් සන්නිවේදන ප්‍රතිපත්ති සකස් කර ගත යුතු බව දැක්විණි. එතැන් පටන් රටවල් තම සන්නිවේදන ප්‍රතිපත්ති මාලාව විධිමත් කිරීමේ කාර්යය ආරම්භ කළේ ය.

1970 දශකය අගභාගයේදී නොබෙල් සාම ත්‍යාගලාභී ශෝන් මැක්බ්‍රයඩ්ගේ සහභාගිත්වයෙන් යුනෙස්කෝ සංවිධානය

1969 වර්ෂයේදී හර්බට් ශෙලර්, ගුවන්විදුලි සංඛ්‍යාත වෙනස් කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනයකොට චන්ද්‍රිකා සම්බන්ධතා මත යුදමය අවශ්‍යතා සඳහා එය වැඩි වශයෙන් යොදවන බව පෙන්වා දුන්නේ ය. මේ අදහස් 1970 දශකයේ නොබැඳි රටවල් අතර ප්‍රවෘත්ති හුවමාරු ක්‍රමවේද ගොඩ නැඟීමට පසුකාලීන ව හේතු විය.

විසින් ගෝලීය මාධ්‍ය නිරූපණය වඩාත් සාධාරණීයකරණය කිරීමට මැක්බ්‍රයඩ් කොමිසම ආරම්භ කරන ලදී. ගෝලීය සන්නිවේදන අසමතුලිතතා සම්බන්ධ මූලික ම ගැටලු එවක සන්නිවේදන විශාරදයන්ගේ අවධානයට ලක් විය. 1964 වර්ෂයේදී විල්බර් ශ්‍රාම්, ජාතින් අතර ප්‍රවෘත්ති ගලනය පිළිබඳ අදහස් දක්වමින් සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රවෘත්ති අඩු අවධානයක් හා යථාර්ථය විකෘති කිරීමක් කරන බව ප්‍රකාශ කරයි. එහෙත් ජාත්‍යන්තර ප්‍රවණතා සැලකිල්ලට ගැනීමේදී එය ලෝකයේ බොහෝ රටවලට අඩු වැඩි වශයෙන් පොදු තත්ත්වයක් බැව් පිළිගන්නට සිදුවේ.

1969 වර්ෂයේදී හර්බට් ශෙලර්, ගුවන්විදුලි සංඛ්‍යාත වෙනස් කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනයකොට චන්ද්‍රිකා සම්බන්ධතා මත යුදමය අවශ්‍යතා සඳහා එය වැඩි වශයෙන් යොදවන බව පෙන්වා දුන්නේ ය. මේ අදහස් 1970 දශකයේ නොබැඳි රටවල් අතර ප්‍රවෘත්ති හුවමාරු ක්‍රමවේද ගොඩ නැඟීමට පසුකාලීන ව හේතු විය.

යුනෙස්කෝ සංවිධානය විසින් නිකුත් කරනු ලැබූ 'Many Voice One World' නම් මැක්බ්‍රයිඩ් වාර්තාව දක්වන ආකාරයට රටක සන්නිවේදන ප්‍රතිපත්ති සකස් විය යුත්තේ අසමානතා දුරු කිරීමටයි. එසේ නොවී සුළුතරයක ප්‍රජාතන්ත්‍රවාදී ව අදහස් ප්‍රකාශ කිරීමට ඇති අවස්ථාව අහිමි කළහොත් වෙනත් ආකාරයට ඒ පීඩනය පුපුරා යාමට හැකි ය. යුනෙස්කෝ සංවිධානය පෙන්වා දෙන්නේ ඕනෑ ම පුද්ගලයෙකුට යහපත් ජීවිතයක් ගත කිරීමට අයිතියක් ඇති බවයි. ඒ සඳහා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා සන්නිවේදන ප්‍රතිපත්ති මාලාවක් සකස් කළ යුතු ය. එමගින් සමාජ දුරස්ථභාවය අවම කරයි. සාමය හා සමානාත්මතාව ඇති කරයි.

මේ අනුව සෑම පුද්ගලයෙකුගේ ම ආත්මශක්තිය සලකා බලන සන්නිවේදන ප්‍රතිපත්ති මාලාවක් තිබිය යුතු ය. පුද්ගල ජීවිතයේ සෑම අංශුවක් හා සමඟ ම සන්නිවේදනය බැඳී පවතින බැවින් සන්නිවේදන පරතරය තුරන් කිරීම හෝ අවම කිරීම හෝ සඳහා රටක සන්නිවේදන ප්‍රතිපත්ති සකස් කළ යුතු වේ.

රටක මාධ්‍ය ප්‍රතිපත්තිය සකස් වන්නේ පුළුල් වශයෙන් සන්නිවේදන ප්‍රතිපත්ති ඇසුරිනි. මාධ්‍ය ප්‍රතිපත්ති කිසියම් රටක මහජනතාවගේ පොදු සුභ සිද්ධිය සලකා සම්පාදනය කරයි. මාධ්‍ය ප්‍රතිපත්තිවල පහත කරුණු ප්‍රධාන වශයෙන් අන්තර්ගත වනු ඇත.

- මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරිත්වය
- තාක්ෂණික යටිතල පහසුකම් හා තාක්ෂණික සංවර්ධනය
- මහජනතාව සමඟ පැවතිය යුතු මාධ්‍ය සම්බන්ධතාව
- මාධ්‍ය අධිකාරි හා වෙළෙඳ පොළ නියාමනය

අප වැනි බහුවාර්ගික, බහුආගමික රටක බහුතර ප්‍රජාවකගෙන් සුළුතර ප්‍රජාවකට අත්විය හැකි අකටයුතුකම් වළකාලීම ද මෙවැනි ප්‍රතිපත්තියක අන්තර්ගත වීම සාධනීය වනු ඇත. කෙසේ වෙතත් මේ වන විට ලාංකේය මාධ්‍ය කර්මාන්තයට අදාළ ව 'ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක්' සකස් වෙමින් පවතින අතර එය නිල වශයෙන් ප්‍රකාශයට පත්කිරීමෙහිලා අවසන් අදියරේ පවතී.



# SAAF අනුශූරයෝ

වර්නන් ගුණසේකර

ඉන්දියාවේ රන්චි නුවර ඔක්තෝබර් 24-26 දක්වා පැවති 4 වැනි සාෆ් ජ්‍යෙෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලියේ (SAAF Senior Athletics Championships 2025) අනුශූරයන් වෙමින් ශ්‍රී ලංකාව ප්‍රදර්ශනය කළේ දකුණු ආසියානු මලල ක්‍රීඩාවේ මෑත වසරවල ඔවුන්ගේ හොඳම දක්ෂතාවක්.

පාකිස්තානය හැරුණු විට ඉන්දියාව, බංගලි දේශය, නේපාලය, භූතානය හා මාලදිවයින යන රටවල මලල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට එරෙහි ව තරග කළ ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශිෂ්ට හැකියා පෙන්නුම් කරමින් රන් පදක්කම් 16ක්, රිදී පදක්කම් 14ක් සහ ලෝකඩ පදක්කම් 10ක් දිනා ගැනීමට සමත් වුණා. එහිදී හිමිකර ගත් මුළු පදක්කම් සංඛ්‍යාව 40ක්. මෙය දකුණු ආසියානු ජ්‍යෙෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලියක වැඩි ම පදක්කම් සංඛ්‍යාවක් දිනා ගත් අවස්ථාව වීම විශේෂත්වයක්.

මෙවර තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස ගෞරවයට පාත්‍ර වුණේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ රන් පදක්කම දිනා ගත් රුමේෂ් තරංග. ඔහු හෙල්ල විසි කළ දුර මීටර් 84.29ක්.

තරගාවලියේ දිලෙන තාරකාව බවට පත්වුණේ මහනුවර 26 හැවිරිදි ෂෆියා යමික්. ඇය කාන්තා මීටර් 100, මීටර් 200 හා මීටර් 100 සහාය දිවීමේ ඉසව්වල රත්තරං ක්‍රීඩිකාව ලෙස කිරුළු පැළඳුවේ දකුණු ආසියාවේ වේග රැජින බවට ද පත්වෙමින්. රන් පදක්කම්ලාභී සහාය දිවීමේ කණ්ඩායමේ සෙසු සාමාජිකාවන් වුණේ ධනංජනා ප්‍රනාන්දු, අමාෂා ද සිල්වා හා රුමේෂිකා රත්නායක. මේ කණ්ඩායමේ ජයග්‍රාහී කාලය ලෙස තත්පර 44.70ක් සටහන් ව තිබුණා.

ෂෆියා යමික් මීටර් 100 කාන්තා ඉසව්ව ජයග්‍රහණය කළේ තත්පර 11.53ක නව තරග වාර්තාවක් ද සමග. මීට අමතර ව මීටර් 200 ඉසව්ව තත්පර 23.58කින් ජය ගැනීමේදී සෆියා යමික් නව තරග වාර්තාවක් බිහි කළේ වසර 27ක් පැරණි වාර්තාවක් ද මකා දමමින්. ඇය අභිභවා ගියේ ඉන්දියාවේ මලල ක්‍රීඩා පුරාවෘත්තයක් වන පී.ටී.උෂා 1998 වසරේ පිහිටුවා තිබූ වාර්තාව.

පිරිමි සහාය දිවීමේදී ශ්‍රී ලංකා මීටර් 100 සහ මීටර් 400 කණ්ඩායම් දෙක ම රන් පදක්කම් දිනා ගැනීමට සමත් වුණා. ප්‍රමුදිත් සිල්වා, සඳුන් දියලවත්ත, ඉන්දුසාර විදුශාන් හා චමෝද් යෝධසිංහගෙන් මීටර් 100 සහාය දිවීමේ කණ්ඩායම සමන්විත ව තිබූ අතර ඔවුන් ජයග්‍රාහකයන් වුණේ තත්පර 39.99කින්. රන් පදක්කම්ලාභී මීටර් 400 සහාය දිවීමේ කණ්ඩායමේ ක්‍රීඩකයන් වුණේ අයොමාල් අකලංක, කාලිංග කුමාරගේ, කල්හාර ඉන්දුප හා ඔමෙල් සශින්ත. ඔවුන්ගේ ජයග්‍රාහී කාලය මිනිත්තු 3යි තත්පර 05.12ක්.

දකුණු ආසියාවේ වේගවත් ම ක්‍රීඩකයා බවට පත්වීමට චමෝද් යෝධසිංහ ඉන්දියාවේදී සමත් වුණේ මීටර් 100 ඉසව්ව තත්පර 10.30ක කාලයකින් ජය ගනිමින්. මෙය ද මේ ක්‍රීඩා උලෙළේ නව තරග වාර්තාවක්. මීට අමතර ව කාලිංග කුමාරගේ තත්පර 46.21කින් මීටර් 400 ජයග්‍රහණය කරමින් ද හර්ෂ කරුණාරත්න 1:51.96කින් මීටර් 800 ජය ගනිමින් ද පසිඳු මල්ෂාන් තුන් පිම්ම ඉසව්වේ මීටර් 16.19ක් සටහන් කරමින් ද තරිඳු දසුන් මීටර් 2.17ක් උස පනිමින් ද රන් පදක්කම් දිනා ගත්තා.

දුර පැනීම හා තුන් පිම්ම කාන්තා ඉසව් දෙකේ ම රන් පදක්කම් දිනා ගැනීමට මධුශානි හේරත් සමත් වුණා. තුන් පිම්ම ඉසව්වේ මීටර් 13.26ක් සටහන් කරමින් නව තරග වාර්තාවක් බිහි කළ ඇය දුර පැනීමේ රන් පදක්කම හිමිකර ගත්තේ මීටර් 6.23ක් වාර්තා කරමින්. හෙල්ල විසිකිරීමේ රන් පදක්කම හිමිකර ගත් නදීශා දිල්හානි ලේකම්ගේ මීටර් 60.14ක් සටහන් කළ අතර මීටර් 400 කඩුලු පැනීම රන් පදක්කම්ලාභිනී දසුනි කෞශල්‍යා තත්පර 58.66ක කාලයක් සටහන් කළා. මීටර් 10,000 දුර දිවීම කාන්තා තරගයේ රන් පදක්කම රසාරා විජේසූරිය දිනා ගත්තේ මිනිත්තු 34යි තත්පර 39.95ක කාලයක් වාර්තා කරමින්.

4 වැනි දකුණු ආසියානු ජ්‍යෙෂ්ඨ මලල ක්‍රීඩා උලෙළේ ප්‍රථම ස්ථානය මේ තරගවලියේ සත්කාරක දේශය වූ



Sri Lanka Men's 4x100m relay gold medal-winning team



Sri Lanka Women's 4x100m relay gold medal-winning team







ඉන්දියාව හිමිකර ගත්තේ රන් පදක්කම් 20ක්, රිදී පදක්කම් 20ක් සහ ලෝකඩ පදක්කකම් 18ක් ඇතුළු ව පදක්කම් 58ක් දිනා ගනිමින්. අනෙක් රන් පදක්කම් 16 ශ්‍රී ලංකාවට හිමිවූ බැවින් මෙවර තරගාවලියේ පිරිනැමුණු රන් පදක්කම් සියල්ල බෙදී ගොස් තිබුණේ ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර.

නේපාලය පදක්කම් හයක් හිමි කරගෙන (රිදී පදක්කම් 2ක් සහ ලෝකඩ පදක්කම් 4ක්) තරගාවලියේ තෙවැනි ස්ථානයට පත්වූ අතර බංගලි දේශය ලෝකඩ පදක්කම් තුනක් ලබා ගෙන සිව් වැනි ස්ථානය ද මාලදිවයින එක් ලෝකඩ පදක්කමක් සමග පස් වැනි ස්ථානය ද හිමිකර ගත්තා. භූතානයට එක පදක්කමක් හෝ දිනා ගැනීමට හැකි වුණේ නැහැ.

දකුණු ආසියානු ජ්‍යෙෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලිය මෙවර පැවැත්වුණේ වසර 17කට පසුව. අවසන් වරට මේ ශූරතාවලිය පැවැත්වුණේ 2008 වසරේ. 1997 හා 1998 වසරවලදී මේ ශූරතාවලිය පවත්වා තිබෙන අතර ඒ කිසි ම අවස්ථාවක ශ්‍රී ලංකාව ලකුණු සටහනේ පෙරමුණට පිවිස නැහැ. දකුණු ආසියානු කලාපයේ මලල ක්‍රීඩා තරග බිමේ ශ්‍රී ලංකාව අසල්වැසි ඉන්දියාව අභිභවා ගිය එක ම අවස්ථාව ලෙස ඉතිහාසගත තිබෙන්නේ 1991 වසරේ කොළඹදී පැවති දකුණු ආසියානු ක්‍රීඩා උලෙළ.

මෙවර තරගාවලියේ ශ්‍රී ලාංකික රිදී පදක්කම්ලාභීන්: (කාන්තා) මීටර් 100 - අමාෂා ද සිල්වා (11.72), මීටර් 1500 - නිමාලි ලියනාරච්චි (4:25.52), මීටර් 800 - තක්ෂිමා නුහන්සා (2:51.51), මීටර් 400 කඩුලු පැනීම - අරලියා සත්සරණි (59.24), උස පැනීම - රන්දිනි පෙහන්සා (1.74), මීටර් 400 සහාය දිවීම කණ්ඩායම - (3:35.71).

(පිරිමි) මීටර් 200 - ඉඳුසර විදුශාන් (21.42), මීටර් 400 කඩුලු පැනීම - අයොමාල් අකලංක (50.29), මීටර් 1500 - රුසිරු චතුරංග (3:55.12), හෙල්ල විසිකිරීම - සුමේධ රණසිංහ (81.62), මීටර් 5000 - වික්නරාජ් වක්ශාන් (14:23.17), මීටර් 100 කඩුලු පැනීම - රොෂාන් රණතුංග (13.90), දුර පැනීම - විස්මිත කුමාර (7.56)

(මිශ්‍ර) මීටර් 400 සහාය දිවීමේ කණ්ඩායම - (3:20.58)

ලෝකඩ පදක්කම්ලාභීන්: (පිරිමි) මීටර් 400 - කල්හාර ඉන්දුප (46.81), මීටර් 1500 - රොජිඩීන් නිෆ්රාස් (3:55.95), යගුලිය දැමීම - සුසීන්තිරකුමාර් මිතුන් රාජ් (14.68), කවපෙත්ත විසිකිරීම - මිලන්ත සම්පත් (49.35), මිටිය විසිකිරීම - දමිත් ධර්මසේන (46.55)

(කාන්තා) මීටර් 400 - සයුරි මෙන්ඩිස් (54.18), මීටර් 100 කඩුලු පැනීම - ලක්ෂිකා සුගන්ධි (13.98), තුන් පිම්ම - උපේක්ෂා ඒකනායක (12.79), යගුලිය දැමීම - ඔවිනි චන්ද්‍රසේකර (13.03), කවපෙත්ත විසිකිරීම - විනෝදනී ලක්මාලි (43.01)

---

**නිවැරදි කිරීම - ඔක්තෝබර් කාලාපයෙන්**

ලැබූ ජයග්‍රහණ 09න් 2016 ජයග්‍රහණයේ සහ 2025 ජයග්‍රහණයේ විශේෂත්වය වුණේ 'විස්ස20 තරගමාලා' ලෙස ඒවා පැවැත්වීම. 1984, 1995, 2018 මැදපෙරදිගත් 1988 බංගලි දේශයේත් 1990-91 ඉන්දියාවේත් 2010 හා 2023 ශ්‍රී ලංකාවේත් එක්දින සීමිත ඕවර් තරගමාලා ලෙස පැවති අවස්ථාවලත් ජය ගැනීමට සමත් වුණේ ඉන්දියාව.



# ඉල්මහේ කවිය

නොවැම්බර් අහස
අඳුරු ය, කඳුළින් බර ය
බිඳුණු හදවත් රැගෙන
කුරුල්ලෝ
පෙළ ගැසෙති දුකින

දකුණේ
සමරුවකි
දිවි පිදූ
ඉල්මහ විරුවන්ට
බැතියෙන

උතුරේ
සමරුවකි
දිවි පිදූ
මහ විරුවන්
නිදන බිම මත

එක ම අහසකි
කඳුළු කැට
එකට වැගිරෙන

එක ම සුළඟකි
බිඳුණු කටහඬ
එකට හමුවන

එක ම පොළවකි
ගලන රුධිරය
එකට කැටිවෙන

---

-මො. ල සෙනෙවිරත්න-
"හික්මවීම පිණිස මේ දඬුවම ඉවසන්න "
කාව්‍ය සංග්‍රහයෙනි

---


දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත

Department of Government Information
news.lk
GFU Sri Lanka

Rs. 100/-